ශ්‍රී ලංකාවේ පළවන ඉපැරැණිම සිංහල පුවත්පත

ක්‍රි.ව. 2014 ක් වූ ඔක්තෝබර් 12 ඉරිදා 149 වෙළුම 20 කලබ සතිපතා පත්‍රය - පිටු 24 - මිල රු. 25.00 පුවත්පතක් ලෙස ලියාපදිංචි කරන ලදි. QD/35/NEWS/2014

ආරම්භය : 1866 ජූනි 07

# ඥානාර්ථ ප්‍රදීපය

## "පවුල" තේමාකොට ගත් කතිකාවත වතිකානයේ දී මුළු දෙයි

ශිරාන් මෛත්‍රී

පවුල තේමා කරගෙන වතිකානයේ ආරම්භ වූ ලෝක රදගුරු සංසදයට 253 දෙනකු සහභාගි වනු ඇතැයි කියැවේ. ඉකුත් ඉරිදා අති උතුම් ප්‍රැන්සිස් සසුන් පියාගේ ප්‍රධානත්වයෙන් දිව්‍ය පූජාව පැවැති අතර සඳුදා පටන් සැසිවාර ආරම්භ විය.



ශ්‍රී ලංකාව වෙනුවෙන් ශ්‍රී ලංකා කතෝලික රදගුරු සම්මේලනයේ මහලේකම් හලාවත රදගුරු අති උතුම් දෙව්ශ්‍රිත වැලන්ස් මෙන්ඩිස් හිමිපාණෝ ඊට සහභාගි වෙති. මෙවර රදගුරු සංසදයට එක්වන පිරිස අතර ඡන්ද බලය හිමි නියෝජිත පිරිස 191 වන අතර 162 දෙනකු නිල බලයෙන් සහභාගි වේ. ඒ අතර රදගුරු සමුළු නියෝජනය කරමින් 114 ක්, වතිකාන කාර්යාල නියෝජනය කරමින් 25 ක්, පෙරදිග කතෝලික සසුන් නායකයන් 13 ක්, රදගුරු කවුන්සිල නියෝජිතයන් 10 ක්, පැවිදි ශ්‍රේෂ්ඨ සමුළුව වෙනුවෙන් තිදෙනෙක් හා සසුන් පියා නම් කළ 26 ක් සහභාගි වෙති.

15 පිටුවට

## සසුන් පිය ගමනට දින සියයයි




2015 ජනවාරි 13 - 14 දිනවලට යෙදී ඇති සසුන් පිය ලංකා ගමනට හා භාග්‍යවන්ත ජුසේ වාස් මුනිතුමන් සාන්තුවරයට එසැවීම වෙනුවෙන් දින සීයක් ඉතිරිව ඇති මොහොතේ විශේෂාකාරයෙන් සූදානම් වීමේ දේව මෙහෙයක් පසුගිය ඉරුදින තේවත්ත ජාතික බැසිලිකාවේදී පැවැත්විණි.

දේව මෙහෙයෙන් පසු පැවැති කෙටි විශේෂ වැඩසටහනේදී කතෝලික ගායක ගායිකාවන් විසින් එකී නිමිත්ත ජනතාවට පහදා දීමට ගායනයෙන් ද ඉදිරිපත් විය. එහිදී මේරියන්ස් සංගීත කණ්ඩායමේ නායක නලින් පෙරේරා ගීතිකාවක් ඉදිරිපත් කළ අයුරු. **(ලෙනාද් හපුආරච්චි සහ අශේන් එස්. සේනාරත්න)**

## කතෝලික දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය - 2014

ඉහත සඳහන් දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය 2014 ඔක්තෝබර් මස 11 සහ 12 දෙදින තුළ පැවැත්වීමට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව සැලැසුම් කර ඇත. ප්‍රශ්න පත්‍ර හතරකින් සමන්විත මෙම විභාගයට පෙනී සිටින අපේක්ෂකයින්ගේ විභාග ප්‍රවේශ පත්‍ර මිසම් සේවක පියතුමා වෙත දැනටමත් එවා ඇත. එම විභාග ප්‍රවේශ පත්‍රය අපේක්ෂකයින් විසින් තම මීසම් සේවක පියතුමන්ගෙන් ලබා ගත හැකිය.

මීසම් සේවක පියතුමා තම මීසමේ කතෝලික දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගයට පෙනී සිටින ළමුන්ගේ දහම් පාසලේ ප්‍රධාන පාලකයා වන හෙයින් මීසම් සේවක පියතුමන්ට මෙම විභාගය මෙහෙයවීම හා සංවිධානය කිරීමේ වගකීම පැවරී ඇති අතර විභාග අපේක්ෂකයින්ට ගැසට් පත්‍රයට අනුව ක්‍රියා කිරීමට උපදෙස් දෙනු ඇතැයි ජාතික ධර්මෝපදේශ අධ්‍යක්ෂ ගරු පියල් ජානක ප්‍රනාන්දු පියතුමා පවසයි.

## ගුවන් විදුලි නත්තල් බැති ගී තරගය

ඔබ කංඩායමත් නත්තල් බැති ගී තරගයට සහභාගි වීමට කැමති නම් විස්තර ලබා ගැනීමට පහත සඳහන් ලිපිනයෙන් විමසන්න. ලේකම්, කිතුනු උපදේශක සභාව, ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව, කොළඹ 07. දු. අංක 0772 981526

**(ජූඩ් අයිවන්)**

## ජාතික දෙව්සත්හලේ දියමන්ති ජයන්තිය ප්‍රකාශයට පත් කරයි

# තේරුම් ගැනීම, ඉවසීම තුළ භා. ජුසේ වාස් මුනි අනු යමු

### අදිනේතෘ අතිගරු එල්මෝ ඩයස් පියතුමන් වාර්ෂික වාර්තාවෙන් අවධාරණය කරයි

**දියමන්තිය මගින් සංකේතවත් කරනුයේ නිර්මලත්වය, ස්වර්ගාරෝහණය සහ ප්‍රඥාවයි. හුදු සාමාන්‍ය භාවිතාවේ පවතින ප්‍රඥාව වෙනුවට මේ ප්‍රඥාව හා නිර්මලත්වය දෛනික ජීවිතයේ වැදගැම්මකට නැති දේවල් උත්තරීතර බවට පත් කරයි. ඒ නිසාම ජාතික දෙව්සත්හලේ දියමන්ති ජයන්ති අධ්‍යයන වර්ෂයට පිය නගන මේ මොහොතේ ශ්‍රී ලංකාවේ හා ආසියාවේ කතෝලික සභාවේ අවශ්‍යතා සපුරාලන්නට ඉකුත් කාල වකවානුවේ සමත් වූ සේ අනාගතයට සුබවාදී ලෙස පා නගන්නට හැකිවන්නේ යැයි අම්පිටිය ලංකා අප ස්වාමිදූ ජාතික දෙව්සත්හලේ අදියුරු අතිගරු එල්මෝ ඩයස් පියතුමා පැවසීය.**



**දියමන්ති ජයන්ති අධ්‍යයන වසර ආරම්භයේ පැවති දිව්‍ය යාගයට ශ්‍රී ලංකා කතෝලික රදගුරු සංසදයේ රදගුරු හිමිපාණන් සහභාගි වූ අයුරු ඡායාරූපයෙන් දැක්වේ. අදිනේතා අතිගරු එල්මෝ ඩයස්, උප අදිනේතෘ ගරු විලියම් ඉවාන්ස් ලියනාරච්චි පියතුමන් පෙරටුකොට අපෝස්තලික තානාපති අති උතුම් පියරේ ගුයෙන් වැන්ටොට් අගරදගුරු හිමිපාණන් දිව්‍ය යාගය පැවැත්විය.**

ගරු පියතුමා මේ බැව් පළ කළේ ඉකුත් දා එහි පැවැති දියමන්ති ජයන්ති උලෙළේ දීය. ශ්‍රී ලංකාවේ අපෝස්තලික තානාපති අති උතුම් පියරේගුයෙන් වැන්ටොට් අගරදගුරු හිමි, විශ්‍රාමික අගරදගුරු අති උතුම් නික්ලස් මාකස් ප්‍රනාන්දු, අති උතුම් ඔස්වල්ඩ් ගෝමිස්, මහනුවර රදගුරු අති උතුම් වියානි ප්‍රනාන්දු, රත්නපුර රදගුරු අති උතුම් ක්ලීටස් චන්ද්‍රසිරි (සා.බෙ.නි.), බදුල්ල රදගුරු අති උතුම් වින්ස්ටන් ප්‍රනාන්දු දි.සනි., අනුරාධපුර රදගුරු අති උතුම් නෝබට් අන්ද්‍රාදි නි.ම.නි., හලාවත රදගුරු අති උතුම් වැලන්ස් මෙන්ඩිස්, මඩකලපුව රදගුරු අති උතුම් පොන්නයියා ජෝශප්, ගාල්ල රදගුරු අති උතුම් රේමන්ඩ් වික්‍රමසිංහ, අගරදගුරු පදවි සහයක රදගුරු අති උතුම් එම්මානුවෙල් ප්‍රනාන්දු හා මැක්ස්වල් සිල්වා හිමිපාණන් ද, අපෝස්තලික තානාපති ලේකම් මොන්සිංඤෝර් රෙනාටෝ කුචික් මාහිමිපාණන් ද මේ අවස්ථාවට එක්විය.

15 පිටුවට

## ආගමික නිදහස අන්තවාදීන් ඩැහැගනීද?

කිංස්ලි කරුණාරත්න විසිනි

ඉකුත් 21 වැනිදා කටුකුරුන්දේ කතෝලික සැදැහැවතුන් දණ ගසාගෙන යාච්ඤා කරමින් සිටින විට අන්තවාදීන්ගේ බස්වලට අහිංසක නිරායුද ජනතාවට කඳුළු ගෑස්, ජල ප්‍රහාර සහ රබර් උණ්ඩ යොදාගෙන කළ නිහීන මෙහෙයුම ඇතුළු ඛේදජනක සිදුවීම් මාලාව පසුගිය ඥානාර්ථ ප්‍රදීපය සැකෙවින් දක්වා තිබිණ. සතියක් ගෙවී ඇති තැන අවුරුදු 148 ක් පුරා ජනතාවට සේවය කළ අභිමානවත් පොලීසිය එදින යාච්ඤා කළ සැදැහැවතුන් දඩයම් කිරීම අරඹා ඇත.

කටුකුරුන්දේ සා. පිලිප්නේරි දේවස්ථානයට ඇතුලුවන මාර්ගයේ පිවිසුම ළඟ ශා. පිලිප්නේරි මුනිඳුන්ගේ ප්‍රතිමාව තැන්පත් කිරීමේ ඇති වරද කුමක් ද? වසර 140 කට අධික ඉතිහාසයක් ඇති මෙම දේවස්ථානයට පාරේ සිට ඇතුළුවන පිවිසුම ළඟ ප්‍රතිමාව තැන්පත් කිරීමට මධ්‍යස්ථ බෞද්ධ, අබෞද්ධ ජනතාව සම්පූර්ණයෙන් එකඟය.

කළුතර දකුණ පොලීසිය උසාවි නියෝගයක් මඟින් ප්‍රතිමාව රැගෙන ගිය අමනෝඥ ක්‍රියාව නිසා ප්‍රදේශයේ කතෝලික ජනතාව සංවේගයට පත්වීමෙන් සාමකාමීව මහපාරේ දණ ගසාගෙන යාච්ඤා කරන අතරතුර මෙම කඳුළු ගෑස්, ජල ප්‍රහාර සහ රබර් උණ්ඩ ප්‍රහාර එල්ලවිය. පොලීසිය තමන් වරදක් කර නොමැති නම් පිලිප්නේරි මුනිඳුන්ගේ ප්‍රතිමාව නැවත තිබුණු ස්ථානයටම එව්වේ ඇයි? ඉනික්බිතිව ජල ප්‍රහාර එල්ල කර ප්‍රතිමාවට හානි කළෝ කවරහුද?

පොලීසියේ දැන්වීම වූයේ ප්‍රතිමාව එම ස්ථානයේ තැන්පත් කිරීමට අවසර නැති බවත් එම ක්‍රියාව නතර කිරීමට ඉහළ අණක් ලැබී ඇති බවත්ය.

15 පිටුවට

## පහ වසර ශිෂ්‍යත්ව විභාගයේ වාර්තාගත ප්‍රතිඵලය ගම්පහ සිරිකුරුස විදුහලින්

මෙවර පහ වසර ශිෂ්‍යත්ව ප්‍රතිඵල අනුව, මෑත ඉතිහාසයේදී කතෝලික පාසල් වලින් වාර්තාගත වූ විශිෂ්ටතම ප්‍රතිඵලය ගම්පහ සිරිකුරුස විදුහලේ ඉගෙනුම ලබන ගමමැද ලියනගේ සචින්දි පවන්‍යා මෙන්දිස් ශිෂ්‍යාව විසින් අත්කර ගන්නා ලදී.

15 පිටුවට



Please Like pope visit sri lanka official facebook page.
www.facebook.com/popevisitsrilanka2015 ■ www.popefrancissrilanka.com



ශ්‍රී ලංකා නාවික හමුදා රණවිරුවන් විසින් සංවිධානය කළ දිව්‍ය පූජාවෙන් පසු ගරු එරින්ටන් සිල්වා පියතුමා සමග සමූහ ඡායාරූපයකට පෙනී සිටි අයුරු.

**ක්‍රිස්ටි ඔස්මන් පෙරේරා**

# ගැළවීමේ කාර්යයේ මුල් පුරුක මරිය මව්තුමියයි

මානව සංහතිය පාප අඳුරින් මුදවා ඔසවා තැබීමට ක්‍රිස්තුන් වහන්සේගේ මනුලොවට පැමිණීමේ කාර්යයට තෝරා ගත් මරිය මව් තුමිය දෙවි පියාණන් විසින් ගැළවීමේ කාර්යයේ මුල් පුරුක ලෙස තෝරාගෙන අභිෂේක කළ සුපුවත සකල විශ්වයට ප්‍රකාශ වූයේ යැයි පමුණුගම මීසම් සේවක ගරු ආනන්ද විතාන පියතුමා පමුණුගම ශු. ජුසේ මුනි දෙව් මැඳුරේ පැවැති විශේෂ දේව මෙහෙයේදී පැවසීය.

මීසම් සහයක ගරු ෂෙනෝ සිල්වා පියතුමා දිව්‍ය යාගය පැවැත්වීය. දෙව්මව්ට සුබ උපන් දිනක් පතා කේක්, රසකැවිලි සාදයක් ද විය. ප්‍රදේශයේ නිවාස නැති දිළිඳුම පවුල් දෙකකට දෙව්මව් ජන්ම දින තිළිණය ලෙසින් නව නිවාස දෙකක් ගරු ආනන්ද විතාන පියතුමන් විසින් ආසිරි ගන්වා පිරිනැමීමද මෙදින සිදුවිය.

**ජෝ. සංගපාලආරච්චි**



පුත්තලම ශාන්ත මරියා දෙව් විමනේ වාර්ෂික මංගලෝත්සවය පසුගියදා පැවැත්විණි. මීසම් සේවක ගරු වින්සන් ජෙයරාසා සහයක ගරු ප්‍රභාත් සංජය හා විරාජ් එරංග පියතුමන් ශු. පවුලේ පැව්දි සොයුරියකගේද මඟපෙන්වීමෙන් මංගල්‍යය පැවැත්විණ.

**ශානුක මධුරංග**

# තඹරවිල 175 ජයන්ති සූදානමට මහ ධර්ම විවේකයක්

තඹරවිල නිර්මල දේවමාතා වහන්සේගේ දෙව්මැඳුරේ ලබන දෙසැම්බර් 14 දිනට යෙදී ඇති 175 ජයන්ති මංගල්‍යයට සමගාමීව ජනතාව සූදානම් කිරීමේ මහා ධර්ම විවේකයක් පැවැත්විනි.

නිවෙස් බැහැදැකීම, දෙමාපිය තරුණ වැඩසටහන් දේවස්ථානයෙන් විවාහ නොවූ පවුල් මුන ගැසීම එම පවුල් දෙව්මැඳුරේදී විවාහ කරවීම කොට්ඨාස දිව්‍ය පූජා මෙහෙයන් සිදුකිරිම සැම පවුලක්ම දේව මාතාවහන්සේට කැපකිරීම මෙහිදී සිදුවිය. දිව්‍ය ගැළවුම්කරුවාණන්ගේ නිකායේ ගරු ශිරාන්, ගරු සනත් පියතුමන් ද, ගරු මොරිස් හා ගරු රන්මල් සහෝදර තුමන්ද මෙය මෙහෙය විය. ගොඩැල්ල මීසම් සේවක ගරු මොරිස් ඇන්ඩර්සන් හා සහායක ගරු නුවන් එමල්ක පියතුමන් විසින් මීසම් වාසී සැමගේ කැපවීම හා උද්යෝගය මත මෙය සංවිධානය කරන ලදී.

**ඩබ්ලිව් හෙක්ටර් ප්‍රනාන්දු**



බොරැල්ල බැල්කම් පෙදෙසේ රදගුරු සමුලු ශාලාවට රොක්වූ ජුසේවාස් පිය ජාතික කාර්යංශයේ නියෝජිතයෝ එහි සභාපති අතිඋතුම් වියානි ප්‍රනාන්දු හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් භාග්‍යවර ජුසේවාස් පියතුමන් ශුද්ධවරයට එසවීම සඳහා ගත් පියවරට තුති පිදීමේ දේව මෙහෙයෙන් අනතුරුව කැවුම්, කොකිස්, කිරිබත් අනුභව කරමින් රදගුරු හිමිපාණන් සහ ගරු උපාධ්‍ය පියවරුන් සමග දශක කිහිපයක සිට දෙවි සමිඳුනට කරන ලද අයැදුම් මල්පල ගැන්වීම පිළිබඳ සතුට බෙදා ගනු ලැබින.

**තියබෝල්ඩ් සමරතුංග**

# වග සත්ප්‍රසාද මංගල්‍යය

වග මීසමේ දිව්‍ය සත්ප්‍රසාද මංගල්‍ය අගරදගුරු පදවි ධර්මෝපදේශ අධ්‍යක්ෂ ගරු දිනේස් ප්‍රියශාන්ත, ඇන්ටනි සමරතුංග පියතුමන්ගේ ප්‍රධානත්වයෙන් මීසම් සේවක ගරු ප්‍රසන්න සංජීව සහයක ගරු ක්ලමන්ට් සංජීව් පියතුමන්ගේ මෙහෙයවීමෙන් කහහේනේදී පැවැත් විනි.

**ග්‍රේටා පෙරේරා**





බුත්තල, විමුක්තිදායකයාණන්ගේ දෙව්මැඳුරේ මීසම් සේවක ගරු ලෙස්ලි ප්‍රනාන්දු පියතුමාගේ ඉල්ලීම පරිදි, කොළඹ අගරදගුරු පදවි ශාන්ත විසෙන්ති ද පාවුළු සංගමයේ මධ්‍යම මණ්ඩල අධ්‍යක්ෂ ගරු රොහාන් ද අල්විස් පියතුමාගේ මෙහෙයවීමෙන් නියගයෙන් පීඩා විඳින බුත්තල ජනතාව වෙනුවෙන් ජලය එක්රැස් කර තබාගැනීම සඳහා ලිටර් 1000 ක ධාරිතාවයකින් යුත් ජලටැංකි 5 ක් පරිත්‍යාග කරන ලදි. එම අවස්ථාවට මධ්‍යම මණ්ඩල සභාපති විසාකා වැලිවිට මහත්මිය හා කොන්පරන්ස් කීපයක නිලධාරීහු සහභාගි වූහ.

**ඇනක්ලීටස් සිල්වා**

# නව ග්‍රන්ථය පිළිගන්වයි



පමුණුගම ඇලෙන්එගොඩ ශා. සෙබස්තියන් දහම් පාසල් ගුරුවරයකු වූ දිනුත් රුද්‍රිගු තරුණ මහතා "සුරදූතයින් තුළින් දේව ආදරය" මැයෙන් බාල වැඩිහිටි කාටත් කියවිය හැකි සරල භාෂාවෙන් දේවදූතයින් පිළිබඳව පොතක් එළිදක්වන ලදි. ජාඇල කලාපීය දහම් පාසල් අධ්‍යක්ෂ ගරු ලෙස්ටර් නෝනිස් පියතුමාගේ මූල්‍යමය ආධාරය යටතේ මෙයින් ලැබෙන මුදල් දහම් පාසල් අරමුදලට යෙදවීමට නියමිතය. කොළඹ ශාන්ත ජොශප් විද්‍යාලයෙන් අධ්‍යාපනය හැදැරූ දිනුත් රුද්‍රිගු මනෝ විද්‍යා පර්යේෂණ උපාධිය හදාරමින් සිටි. ජුසේවාස් ධර්ම නිකේතනයේ අධ්‍යක්ෂ දහම් පාසල් නාහිමි ගරු දයා වැලිකඩආරච්චි පියතුමාගේ හා කොළඹ කලාප කතෝලික ශිෂ්‍ය ව්‍යාපාරයේ උපාධ්‍ය ගරු සමන් මැක්ෂිමස් පියතුමාගේ මඟපෙන්වීම යටතේ එළිදැක්වූ මෙම පොතේ මංගල පිටපත කොළඹ අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ට අගරදගුරු මැඳුරේදී පිළිගැන්වූ අයුරු මෙහි දැක්වේ.

මේ අවස්ථාවට ගරු ලෙස්ටර් නෝනිස් පියතුමා පමුණුගම සහයක ගරු ෂෙනෝ සිල්වා පියතුමා සමග දිනුක රුද්‍රිගු මහතාගේ පියා අනුර රුද්‍රිගු මහතා මව ධම්මිකා සංජිවනි මහත්මියද සහභාගි වූහ.

**බෙන්ජමින් කිරිහෙට්ටි**

# විවාහ හමු ආසියා සම්බන්ධීකරණයට ශ්‍රී ලාංකික පියතුමෙක්

ලෝක ව්‍යාප්ත විවාහ හමුවේ 39 වන ආසියානු සමුළුව සිංගප්පූරුවේ දී පැවැත්විණි. ආසියාතික රටවල් 12 ක නියෝජනය සහිතව පැවැත්වුන මෙම සමුළුවේ තේමාව වූයේ "එඬේරිකත්වයට කැඳවීම" යන්නය.

මේ සමුළුවේ විශේෂත්වය වූයේ ශ්‍රී ලාංකික පියතුමකු ආසියානු සම්බන්ධීකරණ පියතුමා ලෙස කටයුතු කිරීමයි. ඒ හලාවත පදවි ජනවන්දනා අධ්‍යක්ෂ ගරු ජූඩ් නික්ලස් ප්‍රනාන්දු පියතුමා වන අතර සමුළුව මෙහෙය වීම එතුමන් සමග පිලිපීනයේ වික් සහ නෙනට් යුවල (ආසියාතික සම්බන්ධීකරණ කණ්ඩායම) විසින් සිදුකරන ලදි. මේ තනතුරට ශ්‍රී ලාංකික පියතුමකු පත් වූයේ වස 38 ක ශ්‍රී ලාංකික විවාහ හමු ඉතිහාසය තුළ ප්‍රථම වතාවටය. මේ සමුළුව සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කරමින් ශ්‍රී ලංකා විවාහ හමු ජාතික සම්බන්ධීකරණ කණ්ඩායම වන ගරු නිහාල් ඕබ්‍රිස් පියතුමා සහ රිචඩ්+ශ්‍රියානි ෆොන්සේකා යුවළ සහභාගී වූහ.

**ඇක්වයිනස්+රෝස් ප්‍රනාන්දු යුවළ**

# නාලවලාන මංගල උලෙළ මෙවරත්

නාලවලාන ශුද්ධ වූ මිඛායෙල් අග්‍රදූත තුමන්ගේ දෙව්මැඳුරේ වාර්ෂික මංගල මෙහෙය ඉකුත්දා පැවැත්විණ.

ශුද්ධ වූ මිඛායෙල් අග්‍රදූතයන්ගේ ප්‍රතිමාව රැගත් පෙරහර ගම වටා චාරිකා කිරීමෙන් අනතුරුව සැදැහැවතුන් ආසිරි ගැන්විනි.

මේ මංගල මහෝත්සවය සංවිධානය කිරීම නාලවලාන මීසම් සේවක ගරු ජෝර්ජ් ඩික්සන් ප්‍රනාන්දු පියතුමා හා නාලවලාන කිතුනු සංඝය මගින් සිදුකරන ලදී.

**ජී. බී. එච්. ලිවේරා**



මීගමුව හුණුපිටිය ශු. ලාසරස් මුනිඳුන්ගේ වාර්ෂික මංගල දෙව්පුද මෙහෙය සඳහා ආරාධිත කොළඹ ජුසේවාස් දේව ධර්ම නිකේතනයේ අධ්‍යක්ෂ ගරු දයා ෂෙල්ටන් වැලිකඩ ආරච්චි කටුවපිටිය මීසම් සේවක ගරු ශ්‍රී ලාල් පොන්සේකා හා සහයක ගරු නදික මංචනායක පියතුමන් මංගල දෙව්පුද මෙහෙය සඳහා පුදසුන වෙත පිය නඟන අවස්ථාව.


**ඇග්නස් සියඹලාපිටිය**



ජාතික ධර්මෝපදේශ ඉරුදින කුරුණෑගල සාන්ත ආනා දහම් පාසලේ දහම් ගුරු භවතුන්ගේ සංවිධානත්වයෙන් දිව්‍ය පූජාව කුරුණෑගල සාන්ත ආනා ආසන දෙව්මැඳුරේදී ජාතික ධර්මෝපදේශ අධ්‍යක්ෂ අතිගරු පියල් ජානක ප්‍රනාන්දු පියතුමන් අතින් සිදු කෙරුණ අතර දහම් ගුරු භවතුන්ගේ ප්‍රතිඥාදීමද එදින සිදුවිය. එම අවස්ථාවට කුරුණෑගල මීසම් සේවක ගරු ජෙරොම් පෙරේරා පියතුමාද සහභාගි විය.

**ජේ. ඇන්තනි**

# පල්ලන්සේන මීසමේ රෝගීන්ගේ දිනය



ශාරීරික වේදනා හා සුවය සඳහා සමිඳුන් වෙත ලංවී, සාමය, සැනසීම, වේදනා දරා ගැනීමේ ශක්තිය සහ විශ්වාසය ලබා දෙන ලෙස යදින්නයි පල්ලන්සේන මීසම් සේවක ගරු ජයන්ත නිමල් පියතුමා මීසමේ රෝගීන්ගේ දිනය වෙනුවෙන් පැවති දිව්‍ය යාගයේ දී පැවසීය.

දේව මෙහෙයට සහ ශුද්ධ වූ තෛලයෙන් රෝගීන් ආලේප කිරීම ආදි කටයුතු සඳහා ගරු එරංග ලක්ශ්‍රිත ද සිල්වා තේවාචාරිතුමා පියතුමාට සහය විය. රෝගීන් හා වයෝවෘද්ධ අය හැත්තෑ පස්දෙනෙක් මෙයට සහභාගි වූහ. මරිය හමුදා කාන්තා ප්‍රසිඩියම මෙය සංවිධානය කළේය.

**මෙල්වින් ද කොස්තා**

# දේව මාතාවන්ට අවමන් කරන්නේ තමන්ගේ අම්මාට ගරු කරන්නට නොදන්නා අයයි

දේවමාතාවන් වහන්සේ සැම මවකටම සැබෑ ආදර්ශයක්. එසේම එතුමිය ජම්ම පාපයෙන් නිර්දෝෂ වූ මාතාවන්ය. අද සමාජයේ අම්මාවරුන් දරුවන්ව මහා මග දමා යන සමාජයක දේවමාතාවන් අපට සැබෑ මාතාවක්. එසේම ශුද්ධ බයිබලයට අනුව ගැළවුම්කාරයාණන්ගේ මාතාවන් වීමත් සමහර පුද්ගලයන් දේවමාතාවන්ට අවමන් කරමින් සිටින්නේ ඔවුන්ගේ අම්මාටත් එසේ අවමන් කරන නිසා නොවේද? නමුත් කිතුනු අපට ක්‍රිස්තුස් වහන්සේ වෙතට යන්න සරලම මාර්ගය මරිය වහන්සේ පමණයි.'යැයි මොරටුව කටුකුරුන්ද ශාන්ත මරියා දේවස්ථානයේ දේවමාතාවන්ගේ උපන් මංගල්‍යයේ ප්‍රධාන දේවමෙහෙය සිදුකළ ගමේ පුතකු වන පූජක දිවියේ රිදී ජුබිලිය සැමරූ ගරු ඩිලාන් ප්‍රනාන්දු පියතුමා පැවසීය. එදින රැස්ව සිටි ජනතාවට සුළු සංග්‍රහයක් සූදානම් කර තිබීම දේවමාතාවන්ගේ උපන්දිනය තවත් අර්ථවත් විය.

මංගල්‍යයේ සන්ධ්‍යා මෙහෙය අගරදගුරු පදවි ළමා ධර්මදූත අධ්‍යක්ෂක ගරු ප්‍රෙඩී ශාන්තිකුමාර් පියතුමාගේ ප්‍රධානත්වයෙන් සිදු වූ අතර සේවක ගරු රසික ලෝරන්ස් පියතුමා මංගල කටයුතු සංවිධානය කළේය.

**අසික ප්‍රියදර්ශන**

ඥානාර්ථ ප්‍රදීපය

ශ්‍රී ලංකාවේ පළවන ඉපැරණිම සිංහල පුවත්පත

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 8, දු.ක. 2695984, 4899611 ෆැක්ස් 2692586

ඊමේල්: pradeepaya@yahoo.com, වෙබ් අඩවිය: www.colombocatholicpress.com

ක්‍රිස්තු වර්ෂ 2014 ඔක්තෝබර් 12 ඉරිදා

# සුදුතුම් පිය ලංකා ගමනට අභියෝගයක් නොවන්නට...

අතිඋතුම් ප්‍රැන්සිස් සුදුතුම් පියතුමන්ගේ ලංකා ගමන 2015 ජනවාරි මස 13-15 යන දෙදින සිදුවන බව දැනටමත් තහවුරු කර හමාරයි. ශ්‍රී ලංකා කතෝලික සභාව නියෝජනය කරමින් ශ්‍රී ලංකාවේ කතෝලික රාජගුරු මණ්ඩලය උන්වහන්සේට කළ ආධ්‍යාත්මික ඇරයුමත්, රාජ්‍ය නායකයකු සේ පැමිණීම තහවුරු කරමින් ශ්‍රී ලංකා ජනරජයේ ජනපති මහින්ද රාජපක්ෂ මැතිතුමන් කළ ඇරයුමත් සුහදව පිළිගත් අප සසුන් පියතුමන් ශ්‍රී ලංකා සංචාරය ඉතාමත් සුහද සිතින් පිළිගත් බව වතිකාන ආරංචි මාර්ග නිරන්තරයෙන්ම මතක් කිරීමක් කළ බවද පවසාලිය යුතුයි. මීට වසර විස්සකට පෙර සා. දෙවන ජුවාම් පාවුළු මුනිතුමන් අප දේශයට වැඩම කළ පසු මේ වන තෙක් සසුන් පියතුමෙක් ශ්‍රී ලංකාවට වැඩම කර නැත. විශේෂයෙන්ම අතිඋතුම් දහසය වන බෙනඩික්ට් විශ්‍රාමික සුදුතුම් පියතුමන්ගේ විශේෂ අවධානය යුරෝපය කෙරෙහිම යොමුවී තිබීම හේතුවෙන් ආසියාකරයේ සංචාරයක් සඳහා වත්මන් සසුන් පියාගේ දැඩි අවධානය යොමු වී තිබීම වෙනමම සාකච්ඡාවට බඳුන් විය යුත්තකි.

ආසියාකරය කතෝලික දහම දැඩි ලෙස ප්‍රචලිතව පවතින කළාපයක් නොවේ. නමුත් ගුණාත්මක තත්ත්වයේ ජීවිත රටාවක් ගත කරන එමෙන්ම දේශපාලන, සමාජීය හා ආර්ථික වශයෙන් බලපෑම් කළ හැකි ජනතා සංයුතියකින් කතෝලික දහම අදහන එකී ජන සමාජය බලවත් වී ඇති බවද අමතක කළ යුතු නොවේ. මෙහිදි විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ වෙසෙන කතෝලික ජනතාව පිළිබඳවද සටහනක් කිරීම වටී. ඉහතින් මතක් කළ පරිදිම මීට වසර විස්සකට පෙර ශ්‍රී ලංකාවට සැපත් වූ සා. දෙවන ජුවාම් පාවුළු මුනිතුමන් මුහුණ දුන් අභියෝගයට වඩා වෙනස් වාතාවරණයක අභියෝග යක් වත්මන් සසුන් පියා ශ්‍රී ලංකාවට වැඩම කරන විට මුහුණ දීමට සිදුවේද යන්න විමසා බැලිය යුතුයි. එදා අප සාන්තුවර සසුනිසුරාණන් පැමිණෙන විට අඳුරු යුද්ධයක් තුළ අප ශ්‍රී ලංකාව නිමග්න වී තිබිණි. සිංහල - දෙමළ ජන කොටස් අතර කතෝලික සැදැහැවතුන් සිටිතත් සැකයක ඡායාවක් ඒ යුද්ධය නිසාම පැවතීම නිසා ජන කොටස් දෙකෙහිම කතෝලික ලබ්ධිකයන් වෙත අන් අයගෙන් එල්ල වූයේ හෙලාදැකීමේ අවලාදයක්මයි. මේ නිසාම එකී ගමන හුදු ආධ්‍යාත්මික චාරිකාවක් බව පුන පුනා පැවසීමට ශ්‍රී ලංකා කතෝලික සභාවට මහත් ආයාසයක් ගැනීමට සිදුවී තිබිණි. එලෙසම ශ්‍රී ලංකා අපෝස්තුළුවර ජුසේවාස් මුනිඳුන් භාග්‍යවන්ත ධූරයට එසවීම සිදුවීම මූලික වශයෙන්ම හුවා දැක්වීම එකී ප්‍රයත්නය සාක්ෂාත් කර පෙන්වීමට මහඟු පිටිවහලක් විය. සමහර ආගමික නායකයින් ප්‍රසිද්ධියේම සසුනිසුරාණන් විවේචනය කොට එතුමන් සම්මුඛවීම වර්ජනය කළත් ඒ සියළු අභියෝග හා තර්ජන පසෙකලා සාර්ථක ආධ්‍යාත්මික සංචාරයක් නිම කරන්නට සා. දෙවන ජුවාම් පාවුළු මුනිඳුන්ට හැකිවූ අතර ඒ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා කතෝලික සභාවද පෙන්වූ විශිෂ්ට දායකත්වය ඇගැයීමටද ලක් විය.

දැන් ශ්‍රී ලංකාව තුළ යුද්ධයක් නැතත් අප වත්මන් සසුන් පියා වන අතිඋතුම් ප්‍රැන්සිස් සුදුතුම් පියතුමන්ගේ ලංකා ගමන ද යම් අභියෝගයකට ලක් වී ඇති බව විවිධ මාධ්‍යයන් ගෙන එන ප්‍රවෘත්ති වලින් යම් පමණකට ගම්‍ය වේ. විශේෂයෙන් සමාජ මාධ්‍ය හරහා අන් කවරදාටත් වඩා විවිධ තලයේ හැඩගත් පුවත් නිරන්තරයෙන්ම පල වන නිසා අපහාස, උපහාස පමණක් නොව තර්ජන ගර්ජන පවා රැගත් දෑ දැකීමටද හැකියි. අප සුදුතුම් පියාණන්ගේ ලංකා ගමන හුදු ආධ්‍යාත්මික චාරිකාවක් බව පුන පුනා ශ්‍රී ලංකා කතෝලික සභාව පැවසුවත්, ශ්‍රී ලංකා අපෝස්තුළුවර භාග්‍යවන්ත ජුසේවාස් මුනිතුමන් සුදුවරයට එසවීම මෙම ලංකා ගමනේ මුඛ්‍ය පරමාර්ථය බව පවසාලුවත් එයත් නොපිට පෙරලන්නට උත්සහ දරන්නෝ නම් හිඟ නොවෙති. මෙහිදි අතිඋතුම් ප්‍රැන්සිස් සුදුතුම් පියතුමන්ගේ ලංකාගමන දේශපාලන තුරුම්පුවක් වන්නට ඉඩ නොදීමට කවුරුත් වග බලා ගත යුතු වන්නේ විවිධ මැතිවරණ පැවැත්වීමක් පිළිබඳව ආරංචිද එහෙන් මෙහෙන් ඇසෙන බැවිනි. කිසිදු දේශපාලන පක්ෂයක ආවැඩීමකට මේ සංචාරය ගොනු කරන්නේ නම් එය පිටු දැකීම විය යුත්තක්මයි. යම් ආර්ථික පීඩනයකට මෙම සංචාරය යොමු කරන්නේ නම් එයටත් විරුද්ධ විය යුතුයි. ආර්ථික පීඩනයක් පමණක් නොව මූල්‍යමය වාසි සඳහාද සසුන් පියාගේ ලංකා ගමන ලඝු කරන්නේ නම් ඒ සියලු නිමිති දුරින්ම දුරස් කළ යුතුයි.

ඒ පමණක් නොවෙයි. මේ ලංකා සංචාරය අප දේශයේ කතෝලික සභාව තවත් ලංකරවනවා මිස සභා දෙකක් සේ දුරස්වන්නට හේතුවක් නොවිය යුතුයි. විශේෂයෙන්ම ශ්‍රී ලංකාවෙන් එපිට විවිධ දේශපාලන හේතුන් සහ වාසි සඳහා වෙසෙන ඩයස්පෝරාවන් මේ ලංකා සංචාරය අඳුරු කරන්නට සිය දේශපාලන පටු මතවාදයන් මුදා හැරීමත් නවතා ලිය යුතුයි. සසුන් පියා ශ්‍රී ලංකාවට පැමිණෙන්නේ පැවති යුද්ධයක ආදීනව බැලීමට නොවේ. ඒ ගැන කථා කිරීමට නොවේ. යටගිය තුවාල පෑරීමටද නොවේ. කෙනෙක් ඒ තුවාල පෑරීමට සසුන් පිය ලංකාගමනය දඩමීමා කරගන්නේ නම් ඒ සියල්ල දැන් සිටම පිටු දැකිය යුතුයි. ආගම් අතර තරගයකට උන්වහන්සේ පැමිණෙන්නේ නැත. කිසිදු අන්‍යාගමිකයෙක් කතෝලික දහමට හරවා ගන්නට උන්වහන්සේ පැමිණෙන්නේ නැත. සිංහල - දෙමළ වශයෙන් ශ්‍රී ලංකාවේ කතෝලික සභාව බෙදීමට උන්වහන්සේ පැමිණෙන්නේ නැත. ආන්දෝලනාත්මක වදන් පැවසීමට උන්වහන්සේ පැමිණෙන්නේ නැත. එක් එක්කෙනා දේශපාලන පුටුවල හිඳුවන්නට උන්වහන්සේ පැමිණෙන්නේ නැත. එකිනෙකාගේ චින්තන ධාරාවන් වලට උත්තේජන සපයන්නට උන්වහන්සේ පැමිණෙන්නේ නැත.

මේ තත්ත්වය ශ්‍රී ලංකා කතෝලික සභාව නියෝජනය කරන සිංහල දෙමළ කවුරුත් අවබෝධකර ගත යුතුයි. දේශපාලන පාට කණ්නාඩි වලින් බලන කවුරු කවුරුත් වටහා ගත යුතුයි. ආගමික අන්තවාදයේ මුගුරු අමෝරා ගන්නට කැස කවන කවුරු කවුරුත් අවබෝධකර ගත යුතුයි. සමස්තයක් ලෙස පොදුවේම ශ්‍රී ලාංකිකයින් අවබෝධකර ගත යුතුයි.

ඒ අවබෝධය ලබාදෙන්නට ශ්‍රී ලංකා කතෝලික සභාව නියෝජනය කරන අපි සසුන් පියාගේ මේ ලංකාගමන හුදෙක් ආධ්‍යාත්මික ගමනක් පමණක් බවට පත්කරගන්නට වග බලා ගනිමු.

# ලූර්දු පුද බිමෙහි දී
# කාදිනල් හිමිපාණන් කළ ආයාචනය

අපගේ යහපත් එඬේරාණන් වූ කාදිනල් හිමිපාණන් විසින් ප්‍රකාශයට පත් කළ මරිය වසර නිමාවීමට ආසන්නය. ගතවූ මාස 10 තුළදී නොයෙකුත් භක්ති අභ්‍යාස මගින් දේවමාතාවන් කෙරෙහි ඇති අපේ ජ්වලිතකම සහ ආදරය අප ප්‍රකාශ කළෙමු. ඉකුත් මැයි මාසයේදී ජනතා සහභාගිත්වයෙන් මරුද මඩු දේවස්ථානයෙහි පැවැත් වූ මඩු මංගල්‍යයද ඉන් ප්‍රධානය. මුළු දිවයිනම නිර්මල මරිය මාතාවන්ට කැප කරන ලද්දේ එම මොහොතෙහිදීය.

මරිය වසර අරබයා පෙළ ගැසුණු විවිධ වැඩසටහන් වලට අමතරව පසුගිය සතියේ ප්‍රංශයේ ලූර්දු සිද්ධස්ථානයේ දින හතරක් පුරා පැවැති දේව මාතා පූජෝපහාර මෙහෙයන් මෙම මරිය භක්තියේ උච්ඡස්ථානය හැටියට හඳුන්වා දීම යුක්ති යුක්ත යැයි හැඟේ.

කොළඹ අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ මාර්ගෝපදේශකත්වයෙන් සංවිධාන කරන ලද මෙම ලූර්දු වන්දනා ගමන අතිශයින් සාර්ථක ඵලහරිත එකක් වූ බැව් කීම අතිශයෝක්තියක් ද නොවනු ඇත. නායක එඬේරාණන්ගේ ඇරියුමට කන්දෙමින් ශ්‍රී ලංකාවේ සතර දිග් භාගයෙන්ම සැදැහැවතුන් 3000 ට අධික පිරිසක් මෙම දැවැන්ත වන්දනා නඩයට එකතුව සිටි අයුරු ඇත්තෙන්ම ප්‍රශංසනීයය. තවද උපන් බිමින් බැහැරව දේශ දේශාන්තරවල ජීවත්වන ශ්‍රී ලාංකේය කතෝලික පවුල් කීපයක්ද මෙහිදී තම නෑ හිතවතුන් සමග එකතුවීම අගේ කළ යුතුවේ.

ඒ හැම දෙනාම එකට පොදිවී ගොනුවී ලූර්දු පුදබිම තුළ දිනපතා පැවැත්වෙන රාත්‍රි ඉටිපහන් පෙරහරේදී දේශාභිමානයෙන් යුතුව හැඟීම්බරව 'නමෝමරිය' සහ 'මා මව්නි අති ප්‍රේමනීය' වැනි ගීතිකා නින්නාද නගමින් ගුවනට මුසුකරත්දී අප කා තුළත් කැකෑරුනු අපේ කම කියා නිම කළ නොහැකිය.

ශ්‍රී ලංකාවේ නොයෙකුත් පළාත් වලින් පනහකට ආසන්න මීසම් භාර පියතුමන්ලා සමග එක්රොක්වී සිටි සහෝදර ජනතාව මෙම අසිරිමත් ලූර්දු පුදබිම තුළ දින හතරක් පුරා එක්තරා ධර්ම විවේකයක යෙදුනා යැයි කීම සාධාරණයැයි සිතමි. දවස ආරම්භ වන්නේ ලූර්දු ගුහාව ඉදිරිපස පූජා පීඨයේ පවත්වනු ලබන දිව්‍ය පූජා යාගයෙනි. සවස් භාගයේ පාදනමස්කාරය සහ ජපමාල භාවනා මෙහෙයකි. දවසේ කටයුතු නිමාවන්නේ රාත්‍රියේ ගමන් ගන්නා දර්ශනීය ඉටිපහන් පෙරහරත් සමගය. පාපෝච්චාරණය කිරීම සඳහා හැමෝටම අවස්ථාව ලබාදෙමින් සන්ධ්‍යා කාලයේ පැවැත්වෙන දිව්‍ය සත්ප්‍රසාද වන්දනා මෙහෙයද කිසිසේත් අමතක කළ නොහැකිය. අන් හැම දෙයකට වඩා ආගමික වතාවත්වලට මුල්තැන දෙමින් අපේ ජනතාව අධික සීතලය පවා ඉවසීමෙන් දරා ගනිමින් භක්තියෙන් ආගමික කටයුතු වල නියැලුණු ආකාරය ඇත්තෙන්ම අප මරිය මාතාවන්ට ප්‍රසන්න වූවාට නම් කිසිදු සැකයක් නැත.

මෙහිදී ශ්‍රී ලාංකේය තම ජනතාව අමතමින් එක් දිනෙක දිව්‍ය සත්ප්‍රසාද වන්දනා මෙහෙයකදී අප කාදිනල් හිමිපාණන් විසින් පැවසු වදන් කීපයක් මෙහිදි අපේ මතකයට නැග එයි. එය හුදු දේශනාවකට වඩා ගැඹුරු අර්ථාන්විත දේව කැඳවීමකි. සුහද ඇරියුමකි. මෙහිදි අප යහපත් එඬේරා එතැනට රැස්ව හුන් හැම දෙනාවම සිහිපත් කළේ අද සිට අප හැමෝම ධර්මදූතයන් විය යුතු බවයි. දේව වචනය රටපුරා පතුරුවාලන ධර්මදානීය බල මුළුවක් විය යුතු බවයි. සැබෑ කතෝලිකයන් මෙන් දයාව ප්‍රේමය ඉස්මතුකරමින් සහෝදර ජනතාව සමග ක්‍රිස්තුන් වහන්සේ තුළ සාක්ෂි දරමින් ජීවත්විය යුතු බවයි.

වැඩිදුරටත් කරුණු කාරණා පැහැදිලි කරමින් කතා කළ කාදිනල් හිමිපාණෝ. "ඔබ ඔබේ රට තුළ ක්‍රිස්තුන් වහන්සේට සාක්ෂි දරන්න. මරිය වසරේ මෙම ලූර්දු වන්දනා චාරිකාවේ හරය එයයි. තව දින කීපයකින් ඔබ මෙම පූජාසන භූමිය අතහැර ගියද ඔබේ සැබෑ අම්මා දේව මෑණියන් බව අමතක නොකරන්න. අපේ රට එතුමියට භාර දෙන්න. එතුමිය යදින්න. එතුමිය අප හැමදා සුරකින සේක්මය."


මදකට නැවතී සිතා බලත්දී එදා කාදිනල් හිමිපාණන් පලකළ ඉහත කී වචනවල ගැඹුරු අර්ථයක් සැඟවී ඇතැයි අපට සිතෙයි. අප මාතෘ භූමිය තුළ අද දවසේ ජීවත්වන කතෝලික ජනතා ප්‍රතිශතය 7% ටත් අඩුතරම් වේ. එහෙත් රට විනාශ මුඛයට ඇද වැටීම වළක්වා අප ශ්‍රී ලංකා භූමිය සමෘධිමත් රාජ්‍යයක් බවට පෙරළීමේ හැකියාව මෙම සුළු පිරිස සතුව තිබෙයි. අපි අප ආදරණීය දේව මෑණියන් තුළ විශ්වාසය තබමු නම් ඕ තුමිය කිසි දිනක අප රට විනාශවීමට ඉඩ නොදෙනු ඒකාන්තය. අප රට වෙනුවෙන් අපි මරිය මාතාවන් යදිමු. අප රටතුළ දිනපතා සිදුවන බලවත් අපරාධ පාපවලට සමාව ඉල්ලා යදිමු. පුරාණ ගිවිසුම තුළ විවිධ කාල පරිච්ඡේද තුළ දෙවියන් වහන්සේ උන්වහන්සේව අමතක කළ අකීකරු ජනතාවට දඬුවම් දුන් වග අප අසා ඇත්තෙමු. ඒප්‍රායිම් වංශයට දඬුවම් කරනු ලැබීය. බැබිලෝනියාව තවත් රටකට පාවා දෙන ලදී. සොදොම් ගොමෝරා නගර ගින්නෙන් විනාශ කළ සේක. ගබ්සාව නිසා එක් වසරක් ඇතුළත දී ලක්ෂ සංඛ්‍යාත බිළිඳුන් සහසික ලෙසින් අමු අමුවේ මරා දමන මේ ධර්මද්වීපය කරා සුනාමියට වඩා දැඩි දඬුවමක් ළඟාවීමට අවකාශ නැතැයි සිතිය හැක්කේ කොයිකාටද? එම දේව උදහසින් කවදා හෝ අපේ මව් බිම බේරාගත හැක්කේ මේ 7% කතෝලිකයන්ගේ සැදැහැවත් කන්නලව්ව තුළින් විය හැකිය. එදා දෙවන ලෝක සංග්‍රාම වකවානුවේදී යුද රකුසාගෙන් අප සුන්දර දිවයින බේරා දුන්නේ අප දයාබර ලංකා රාජිණිය වූ දේව අම්මාගේ මැදිහත් වීමෙන් බවද අපි අමතක නොකරමු. ඒ වෙනුවෙන් අද තේවත්ත පුදබිම තුළ ඉදිවී ඇති දේවමාතා බැසිලිකාව ජීවමාන සාක්ෂියකි. විනාශයට යනු පෙර රට බේරාගැනීමේ වගකීම අපි බාර ගනිමු.

පාතිමා ලූර්දු වැනි සිද්ධස්ථාන වලදී දේව මාතාවන් එම දරුවන්ගෙන් ඉල්ලා සිටියේ අන්කිසිවක් නොව මිනිස් සංහතියේ ගැලවීම උදෙසා තම පාපවලට මනස්ථාපවී යාච්ඤා කළ යුතු බවයි. ඒ සඳහා එතුමිය එම දරුවන් අතට ලබාදුන්නෙ ජපමාලයයි. තම පුත්‍රයා කුරුසිය මත ප්‍රාණය පුදා අපට ගැලවීම සැලසුවද අප ආදරණීය මරිය මාතාවන් කිසිදිනෙක අප අත්නොරින බවක් පෙනීයන්නේය. ලූර්දු පාතිමා සහ අනිකුත් දර්ශන වලින් එතුමිය එම නිමක් නැති ආදරයේ තරම පෙන්වා දී ඇත.

එසේ නම් සැබෑවු සාංසික කතෝලික දිවිපෙවෙතකට හුරුවෙමින් ක්‍රිස්තුන් වහන්සේ වෙනුවෙන් සාක්ෂිදරමින් දේව වචනය අප රට පුරා පතුරුවාලීමේ සත්කාර්යයෙහි නියැලීමට අප අදිටන් කරගනිමු. ලූර්දුවේදී අප හැමෝම ලද පණිවුඩය එයයි.


මෙම ධර්මදූතික කාර්යය එතරම් පහසු නැත. ඒ බව අප ස්වාමින් වහන්සේම අපට අනතුරු හඟවා ඇත. "මම වෘකයන් මැදට බැටළුවන් යවන්නාක් මෙන් ඔබ යවමි. එහෙයින් සර්පයන් මෙන් නැණවත්ව පරෙවියන් මෙන් අහිංසකව සිටින්න. මිනිසුන්ගෙන් ප්‍රවේසම්වන්න." (මතෙව් 10:16-20)

එදා අප කාදිනල් උතුමාණන් විසින් රට වෙනුවෙන් ධර්මදානයෙහි යෙදෙන්නැයි කළ කාලීන ඉල්ලීම එදා ලූර්දු පුදබිමෙහි රැඳී සිටි සැදැහැවත් වන්දනාකරුවන්ට පමණක් නොව අප රට තුළ ජීවත්වන සියලුම කතෝලික ජනතාවට කළ පොදු ආරාධනාවක් බව අමුතුවෙන් කිව යුතු නැත.




මරිය වසර නිමිත්තෙනි

මොරිස් බොල්ලෑගල විසිනි



## මීසමෙන් මීසමට

## දේවමාතා ප්‍රතිමා වැඩම කරයි

වාර්ෂිකව ඔක්තෝබර් මාසයේ වැලිවිට සාන්ත මරියා දේවස්ථානයට අයත් බැතිමතුන්ගේ ගෘහයන් වෙත දේවමාතා ප්‍රතිමා වැඩම කිරිමේ වැඩ සටහන මීසම් සේවක ගරු අර්නස්ට් ද මෙල් පියතුමාගේ අධීක්ෂණය යටතේ ආරම්භ විය. මීසමේ නුවාන කොට්ඨාශ අට සඳහා නියෝජිතයන්ට ඒ ඒ ප්‍රතිමා බෙදා දෙන ලදි.

**සුසිල් හැරිසන්**



මාම්පිය සාන්ත ෆ්‍රැන්සිස් සේවියර් මුනිඳුන්ගේ දෙව් මැඳුර අභිෂේක ගැන්වීම හලාවත රදගුරු දෙව්ශ්‍රිත වැලන්ස් මෙන්ඩිස් හිමිපාණන්ගේ සුරතින් සිදුකෙරිණි. මාම්පිය ගම්වාසීන්ගේ දායකත්වයෙන් ලක්ෂ 400 ක මුදලක් සොයා ගැනීමට අසීරු වුවද එම ඉලක්කය සපුරා ගැනීමට වත්මන් රජයේ ද සහයෝගය ලැබිණි. අභිෂේක ගැන්වීම සඳහා හලාවත පදවි අනු නායක ගරු පීටර් චාල්ස්, භාණ්ඩාගාරික ගරු ලුක් නෙල්සන්, මීසම් පාලනාධිපති ප්‍රසංග පෙරේරා, මීසම් සහයක ප්‍රශාන් ගෝමස් යන පියතුමන් ලා සමග ගරු පැවිදි සොහොයුියන් රැසක් ද සහභාගීවූහ.

**පර්සි ප්‍රනාන්දු**

# ඇතුගල්පුර පදවිය 2015 ළමා වර්ෂය ලෙස

## කුරුණෑගල රදගුරු හිමිපාණෝ පවසති

සැම කතෝලිකයකුටම ශුද්ධාත්මයාණන් වහන්සේගේ බලයෙන් විවිධ හැකියාවන් ලබාදි ඇතත් සමහර දෙමව්පියන් තම දරුවන්ගේ විවිධ හැකියාවන් සහ දක්ෂතාවයන් හඳුනාගෙන නොමැති බව මැල්සිරිපුර ශ්‍රී හෘද දේවස්ථානයට අයත් දරු දැරියන් තිස් දෙනෙකුට අභිවෘද්ධි ආලේපය දානය කිරීමේ දිව්‍ය පූජාවේදී කුරුණෑගල රදගුරු අතිඋතුම් හැරල්ඩ් ඇන්තනි පෙරේරා හිමිපාණෝ පැවසූහ.





තවදුරටත් කතාකළ උන්වහන්සේ ළමා පරපුර වෙනුවෙන් දෙමව්පියන් වැඩි අවධානයක් යොමුකළ යුතු කාලය එළඹ ඇති බවත්, පදවිය තුළ ලබන වර්ෂය (1215) ළමා වර්ෂය ලෙස නම්කර පෝස්ටර්, චිත්‍ර, සම්මන්ත්‍රණ තුළින් ගිහියන් දැනුම්වත් කිරිමට කටයුතු කරන බවත් පැවසූහ.

මීසම් සේවක ගරු මයිකල් කොස්තා, සහයක ගරු දිමුතු ෆොන්සේකා පියතුමන් සහ දොමිනිකාන පැවිදි සොයුරියන් අභිවෘද්ධි ආලේපය දානය කිරිමේ කටයුතු සංවිධානය කරන ලදි.

**නිමල් ඒ අල්මේදා**

## පයාගල මීසමේ වාර්ෂික මඩු වන්දනා ගමන මෙවරත්



පයාගල මීසම් ජනතාව තුළ සුහදත්වය සහ කිතුනු සංඝයේ ආධ්‍යාත්මික පෝෂණය වර්ධනය කිරීමේ මූලික අරමුණෙන් මඩු සිද්ධස්ථානය කරා යන වාර්ෂික වන්දනා ගමන මීසම් සේවක ගරු සිසිර සමරකෝන් පියතුමා ප්‍රමුඛ මීසමේ මඩු වන්දනා කමිටුව මගින් මෙවරත් සංවිධානය කැරිණ.

අගරදගුරු පදවි පවුල් අපෝස්තලික සේවාවේ ගරු ක්ලොඩ් නෝනිස් මාක් ශ්‍රී ළමා නිවාස භාර ගරු ලෙස්ටර් විජේසූරිය පියතුමන් මීසමේ ගරු පැවිදි සොහොයුරියන්ද මෙම ගමනට එක්විය. අනුරාධපුර රදගුරු අතිඋතුම් නෝබට් අන්ද්‍රාදි හිමිපාණන්ද, ගරු නිලන්ත උඩුවක, ගරු රොහාන් ද අල්විස් පියතුමන් විසින් විශේෂ දිව්‍ය යාගයක් පවත්වන ලදී. ගුහාව අසල සිට පැවති ඉටිපහන් පෙරහරට අධික වර්ෂාව මධ්‍යයේ වුවද ජනතාව සහභාගි වූහ.

**ජී. නිහාල් ප්‍රනාන්දු**

## තුන් මසකට පසු ප්‍රතිමාව දේවස්ථානයට

වත්තල ගල්වැටියේ ශු. ජපමාල රාජේශ්වරියගේ දේවස්ථානයේ 128 වන වාර්ෂික මංගල්‍යයට සූදානම් වීමක් වශයෙන් ශු. ජපමාල රාජේශ්වරියගේ සංගමය මගින් මරිය වසර තේමා කර ගත් පුරා 03 මසක් තුළ සාමාජික සාමාජිකාවන් 57 දෙනෙකුගේ නිවෙස් වලට වැඩම කළ ශු. ජපමාල රාජේශ්වරියගේ ඓතිහාසික ප්‍රතිමාව පසුගිය දා ආපසු දේවස්ථානයට වැඩම කරන ලදි.

වත්තල ශාන්ත අන්තෝනි විදුහලේ විදුහල්පති ගරු මාල් ප්‍රනාන්දු පියතුමා ප්‍රතිමාව ආසිරි ගන්වා දේවස්ථානයට පිළිගත් අතර, සාමාජික සාමාජිකාවන් විසින් විශේෂ යැදුම් මෙහෙයක් ද දේවස්ථානයේ දී පවත් වන ලදි.

**ක්ලැරන්ස් ලෙනාඩ්**

## මරිය වසර වෙනුවෙන් මෝදර ඉටිපහන් පෙරහරක්

මෝදර ශු. ස්නාවක ජුවාම් මුනිඳුන්ගේ දෙව්මැඳුරේ මීසම් සේවක ගරු හේෂාන් ප්‍රනාන්දු පියතුමාගේ සංවිධානයෙන් රාත්‍රියේ අලංකාර පහන් පෙරහරක් පැවැත්විනි. දින තුනක් තිස්සේ සවස 6.00 ට ජපමාලයේ පහලොස් පන්තියද, දේව මාතාවන්ගේ ප්‍රාර්ථනාවද ගරු සරු ඇතිව පැවත්විනි.

මහනුවර ජාතික දෙව්සත්හලේ දර්ශන පීඨයේ ආචාර්ය ගරු ලක්මාල් පෙරේරා පියතුමා තුති පිදීමේ යාගය පවත්වන ලදි. වසර 50 කට වඩා පැරණි අඩි 7 ක් උසැති දේව මාතා පිළිරුව මෙම පෙරහරට එක්වීම විශේෂත්වයකි.

**රනිල් රාජපක්ෂ**



හල්පාතොට මීසම් සේවක ගරු ෂෙල්ටන් ප්‍රනාන්දු පියතුමාගේ ඉල්ලීම අනුව දකුණු පළාත් ප්‍රධාන අමාත්‍ය ෂාන්ලාල් ද සිල්වා මහතාගේ දායකත්වයෙන් හික්කඩුව- බද්දේගම ප්‍රධාන මාර්ග යේ පිහිටි එකම කතෝලික දේවස්ථානයට පිවිසෙන මීටර් 145 ක් පමණ දිගැති මාර්ගය අලුතින් තාරදමා ප්‍රතිසංස්කරණය කිරීමෙන් අනතුරුව පියතුමන් විසින් පසුගියදා ආසිරි ගන්වන ලදී.

**ගරු ප්‍රින්සි වත්සලා මානෙල් පැවිදි සොහොයුරිය**

## කඳාන මීසමේ ඔක්තෝබර් මස ජපමාල බැතිය

කඳාන මීසමේ සැම නිවසකට දේව මාතා ප්‍රතිමාව ගෙන යාමට සහ කුඩා කණ්ඩායම් වශයෙන් පවුල් එකමුතුව, රාත්‍රි කාලයේ ජපමාලය උච්චාරණය කිරීමට විශේෂ වැඩ පිළිවෙලක් සූදානම් කර ඇත.

මීසම කොට්ඨාශ 24 කට බෙදා වෙන්කර ඇති අතර කුඩා කිතුනු ඒකක නායක නායිකාවන් පත්කර ඇත. මේ අනුව කුඩා කණ්ඩායම් 75 ක් පමණ මුළු මීසම තුළ නියෝජනය වේ.

ඔක්තෝබර් පළවැනිදා රාත්‍රි 7.00 ට මෙම ජපමාල බැතිය ආරම්භ වූ අතර මීසමේ සැම නිවසකටම දේවමාතා ප්‍රතිමාව වැඩමකර ජපමාලය උච්චාරණය කිරීමට සැලසුම් කර ඇත.

කඳාන සිද්ධස්ථාන පාලක ගරු නිහාල් අයිවන් පියතුමා මේ වැඩ සටහන් සංවිධානය කරයි.

**ඇල්. ඩී. පැට්‍රික්**

# දෙහියාගාත ශු. ජපමාල මාතා දෙව්මැඳුර




වසර 194 ක පමණ දීර්ඝ ඉතිහාසයකට උරුමකම් කියන දෙහියාගාත ශුද්ධ වූ ජපමාල රාජේශ්වරියගේ වාර්ෂික මංගල්‍යය මෙවර ඔක්තෝබර් 12 ඉරුදිනට යෙදී ඇත.

කොළඹ මීගමුව ප්‍රධාන මාර්ගයේ ජා-ඇල පසුකර මීගමුව දෙසට කි.මී. 4 ක් පමණ එන විට දෙහියාගාත හන්දියෙන් මීටර් 150 ක් පමණ නැගෙනහිර දෙසට ගිය විට දෙහියාගාත දෙව්මැඳුර පිහිටා ඇත. දෙහියාගාත මුල් වාසභූමි කරගත් මුතුන් මිත්තෝ මුතුරාජවෙල සහ පොතුවිල ආශ්‍රිතව වී ගොවිතැනින් ජීවත් වූහ.

අප සභාවට ප්‍රථම පොල්අතු පල්ලිය සඳහා බෙනදිකාන නිකායික ගරු පන්ඤානි පියතුමන් පුරෝගාමී වී ඇත. එකල මුළු ප්‍රදේශයම පමුණුගම මීසමට අයත්ව තිබූ අවධියේ, ගරු පපිලි පියතුමන් යටතේ වර්ෂ 1840 දී සවිමත් දෙව්මැඳුරක් තනාදී ඇත. පසුව තුඩැල්ල මීසමක් බවට පත් වූ පසු දෙහියාගාත දේවස්ථානයද එයට අයත් විය. 1923 දී පමණ තුඩැල්ල මීසම් සේවක ගරු ආතර් ජයමාන්න නි.ම.නි පියතුමා තෙවන දෙව්මැඳුර ගොඩනැගීම ආරම්භ කර ඇත.

1944 දී තුඩැල්ලෙන් වෙන් වී දෙහියාගාත නව මීසමක් බවට පත් කර නව මීසම් සේවක ලෙස ගරු සකරියස් දබරේරා පියතුමා පත්විය. එතුමන්ගේ සේවා කාලයේදී අලංකාර දෙව්මැඳුරක් ජනතාවට උරුම කර දුනි.

ශුද්ධ වූ පවුලේ කන්‍යාරාමයක් දෙව්මැඳුරට යාබදව පිහිටා ඇත. දිව්‍ය හෘදය සමිතිය, මරිය හමුදාව, ජපමාල මාතා තරුණ සමිතිය, දිව්‍ය සත්ප්‍රසාද තරුණ සමිතිය ආදී සමිති සමාගම්වල ක්‍රියාකාරිත්වයද මීසමේ ඉදිරි ගමනට මහත් පිටුවහලකි. මීසම් ධර්ම සේවා සභාවද සැම කටයුත්තකදීම පියතුමන්ගේ සහයට සැදී පැහැදී සිටී.

වත්මන් මීසම් සේවක ගරු බර්නාඩ් නිශාන් විලත්ගමුව සහ සහයක ගරු ගයාන් ප්‍රසන්න පියතුමෝ මීසම් ජනතාව දෙව්මැඳුරට ලඟාකර



රත්නපුර සාන්ත වින්සන් ද පාවුලු සමිති ඒකාබද්ධ කොට රත්නපුර පදවි මණ්ඩලයක් ස්ථාපිත කිරීම රත්නපුර රදගුරු අතිඋතුම් ක්ලීටස් චන්ද්‍රසිරි පෙරේරා හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් රත්නපුර මීසම් ධර්මෝපදේශ මධ්‍යස්ථානයේදී පැවැතිණ. ඡායරූපයෙන් රදගුරු හිමිපාණන් උත්සවය අමතන අයුරු දිස්වෙයි. රත්නපුර සහයක ගරු විජයනන්දන නි.ම.නි පියතුමා. සභාපති ලියෝනි ප්‍රනාන්දු මහත්මිය, ජාතික ලේකම් රොහාන් ගුණරත්න මහතාද මෙහිවෙති.

**තියබෝල්ඩ් සමරතුංග**

## කළුතර ශු. පවුලේ 80 සංවත්සරයට ප්‍රසංගයක්

කළුතර ශුද්ධවූ පවුලේ කන්‍යාරාමයේ 80 වෙනි සංවත්සරය නිමිත්තෙන් ශිෂ්‍යාවන්ගේ විවිධ කුසලතා නැංවීමේ වැඩ සටහන් මාලාවක් ක්‍රියාත්මකවේ. FAMILIAN SINFONIETTA නම්වූ ප්‍රසංගයක් ඔක්. 18 දින සිරිකුරුස විදුහල් ශ්‍රවණාගාරයේදී පැවැත්වේ.

ගරු මංගලිකා ප්‍රනාන්දු පැවිදි සොයුරිය
විදුහල්පතිනිය




වැලිවිට මීසම් සේවක ගරු අර්නස්ට් ද මෙල් පියතුමාගේ මඟපෙන්වීම මත අංගොඩ සාන්ත සෙබස්තියන් මුනිතුමන්ගේ දේවස්ථානයේ සැදැහැවතුන් විසින් සංවිධානය කරන ලද 'සහන පොළක්' දේවස්ථාන භූමියේදී පවත්වන ලදි. මින් ලැබෙන සියලු මුදල් අංගොඩ දේවස්ථානයේ සුබසාධක කටයුතු සඳහා යෙදවීමට නියමිතය.

**එම්. ජෝ. පාරිස්**

**මරිය වසර නිමවීමට පෙර දේවමාතාවන් පිළිබඳ ඉදිරිපත් කරන ගැඹුරු විමර්ශනයක පළමු වැන්නයි**

# මරියෝත්තමාවන්ගේ හදවත නැමැති තක්ෂිලාව

**භාග්‍යවත් කන්‍ය මරියෝත්තමාවන් දිව්‍ය සත්ප්‍රසාදයේ කාන්තාව යන සංකල්පය කිතුනු අපට නුහුරු නුපුරුදු එහෙත් විමර්ශනයට භාජනය කළ යුතු අර්ථයෙන් සපිරුණු සුවිශේෂ සංකල්පයකි:**



දිව්‍ය සත්ප්‍රසාදය සහ මරියෝත්තමාව ECCLESIA DE EUCHARISTIA - දිව්‍ය සත්ප්‍රසාදයේ ශු. සභාව නැමැති විශ්ව චක්‍ර ලේඛනයත් සමග මෑතකදී බෙහෙවින් සාකච්ඡාවට ලක්වූ දේව ධාර්මික තේමාවකි. නමුත් දිව්‍ය සත්ප්‍රසාදය සහ දේව මාතාවන් වහන්සේ නම් තේමාව දීර්ඝ ඉතිහාසයක් ඇති ප්‍රස්තුතයකි. එය සභා පියවරුන්ගේ (1-4 සියවස්) කාල වකවානුව දක්වා ඈතට ඇදී යයි.... දේව මාතාවන් සහ දිව්‍ය සත්ප්‍රසාදය අතර පවතින නෛසර්ග සම්බන්ධතාවයේ පැහැදිලි දේව ධාර්මික පසුබිමක් ඇත. නමුත් විෂයයක් ලෙස මෙය තවම වර්ධනීය අවස්ථාවක පසුවේ.1

මරියෝත්තමාවන් හා දිව්‍ය සත්ප්‍රසාදය අතර ඇති සම්බන්ධතාවය මවක හා පුතකු අතර පවතින බැඳීම වේ. එය ඉතා ගැඹුරු සම්බන්ධතාවයකි. ශුද්ධෝත්තම පියතුමා පවසන ආකාරයට “දිව්‍ය සත්ප්‍රසාද පිළිවෙත සිදුකරන හැම අවස්ථාවකම, සභාවේ මාතාව වශයෙන් සංඝය සමග කන්‍ය මරියෝත්තමාවන් වැඩ සිටින්නීය. සාන්ත සභාව හා දිව්‍ය සත්ප්‍රසාදය අවියෝජ්‍ය ලෙස සම්බන්ධ නම්, මරියෝත්තමාවන් හා දිව්‍ය සත්ප්‍රසාදය අතර ඇති සම්බන්ධතාවය ගැනද කිව හැක්කේ ඒ දෙයමයි” (එක්ලේසියා ඩෙ එයුකරිස්ටියා, අංක 51).

මව්වරු සිය දරුවන්ගේ හොඳම ගුරුවරයෝ ය. සිය කුස තුළ දරුවා බිහි වූ දා පටන් ඔවුහු සිය දරුවන් හඳුනති. ඔවුහූ සිය දරුවන් වෙත කළ හැකි සෑම සියළු දේ නොපිරිහෙලා ඉටු කරති. ඔවුන්ට සාත්තු කරමින්, ඔවුන් නාවමින්, ඔවුනට සුව පහසුව ගෙන දෙමින්, ඔවුන්ට සවන් දෙමින් ඔවුන් සුවසේ රැක බලා ගනිති. ලොව අන් කිසි කෙනෙකුට වඩා ඔවුහු සිය දරුවන් ගැන හොඳින් හඳුනති.

ක්‍රිස්තියානි සම්ප්‍රදාය විසින් මාංශගතවීමේ අභිරහස තුළින් අපට උගන්වන්නේ දෙවියන් වහන්සේද මෙම අවශ්‍යතාවය අවබෝධ කරගෙන සදාකාලික වචනය කන්‍ය මරියෝත්තමාවන් තුළින් මාංශගත කළ වගයි. උන්වහන්සේව රැක බලා ගැනීම සඳහා එතුමිය සිය ජීවිතයම කැප කළාය. ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ කුරුසියේ සිට සිය ශ්‍රාවකයන් වෙත එතුමිය ඔවුන්ගේ මව වශයෙන් බාර දෙන ලදි.

ප්‍රේමවන්ත ගෝලයා මගින් උන්වහන්සේ පවසා වදාළේ ඔවුන්ගේ මෑණියන් ලෙස එතුමිය ඔවුන්ගේ නිවසට කැඳවා ගන්නා ලෙසයි (ජුවාම් 19:25-27). සිය පුතනුවන්ට එතුමිය උගැන් වූ ආකාරයටම දැන් එතුමිය උන්වහන්සේගේ ශ්‍රාවකයන්ට, සාන්ත සභාවට සිය පුතනුවන් ගැන උගන්වනු ලබයි. සාන්ත සභාවට ඇය කියා දෙන පාඩම් අතරින් එකක් වන්නේ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේට ඇති සම්බන්ධතාවය තුළ තමන් අත්පත් කර ගත යුතු නිවැරදි හා යෝග්‍ය නැඹුරුවයි. එහි පරමාදර්ශය වන්නේ නිශ්චිත වශයෙන්ම එතුමියගේ ඇතුළාන්ත නැඹුරුව වන පිවිතුරුබව හා නිහතමානිකමයි.

“එක්ලේසියා ඩෙ එයුකරිස්ටියා” යන විශ්ව චක්‍ර ලේඛනය තුළ, මරියෝත්ත මාවන්ගේ සුවච බැතිමතකු වූ අති උතුම් දෙවන ජුවාම් පාවුළු ශුද්ධෝත්තම පියතුමන් විසින් කන්‍ය මරියෝත්තමාවන් හා දිව්‍ය සත්ප්‍රසාදය අතර ඇති සම්බන්ධතාවය පිළිබඳව “මරියෝත්තමාවන්ගේ තක්ෂිලාවේ දිව්‍ය සත්ප්‍රසාදයේ කාන්තාව” (AT THE SCHOOL OF MARY, WOMAN OF THE EUCHARIST) යනුවෙන් නම් කර ඇති සයවැනි පරිච්ඡේදයේ විස්තර කරනු ලබයි.

ශුද්ධෝත්තම පියතුමා විසින් සඳහන් කරනු ලබන මෙම පාසල කුමක්ද? කොටහේනේ යහපත් එඬේරාගේ කන්‍යාරාමය නැතිනම් වෙන්නප්පුවේ ශුද්ධවූ පවුලේ කන්‍යාරාමය වැනි විදුහල් ද? කොහෙත්ම නැත. එය මරියෝත්ත මාවන්ගේ හදවත නමැති පාසලයි. ක්‍රිස්තුන් වහන්සේ ගැන අභිරහස් ගැන දැන ගැන්මට ඉගෙන ගැනීමට ඇති උසස්ම විදුහල මරියෝත්ත මාවන්ගේ හදවතයි. ක්‍රිස්තුන්වහන්සේ වෙනුවෙන් පැවතුනු ප්‍රේමයේ පාසල, ආදරයේ විදුහල මරියෝත්තමාවන්ගේ නිර්මල හදවතයි. ශුද්ධවූ ජෙම්මා ගල්ගානි මුනිතුමිය මෙසේ පවසා ඇත. “කිසියම් තැනැත්තකු විසින් දිව්‍ය සත්ප්‍රසාදයේ වැඩ වසන ජේසුස් වහන්සේට ආදරය කරන්නට ඉගෙන ගන්නා ස්වර්ගීය පාසලක් ඇත. එම පාසල නම් මරියෝත්ත මාවන්ගේ හදවත නමැති ශාලාවයි. එහි විෂය දිව්‍ය සත්ප්‍රසාදය වන අතර, ගුරුතුමිය මරියෝත්තමාවන් වන්නීය.”වෙන කිසිම මිනිස් හදවතක් කර ඇති හෝ කවදා හෝ කර නැති ආකාරයකට වඩා විශේෂ වූ ආදරයකින් භාග්‍යවත් කන්‍ය මරියෝත්තමාවන් ජේසුස් වහන්සේට ආදරය දැක්වීය. එතුමන්ගේ පුතනුවන්ගේ හදවතට, ජීවිතයට, අභිරහසට හා ධර්මදූත ක්‍රියාවලියට එතුමන් පරිපූර්ණව හා සාකල්‍යයව සම්බන්ධ විනි.




මංගලම් කීමේ අවස්ථාවේ පටන් ක්‍රිස්තුන් වහන්සේගේ හදවත හා මරියෝත්තමාවන් වහන්සේගේ හදවත දෙකක් නොව එකකි. මරියෝත්තමාවන්ගේ කුස තුළ ක්‍රිස්තුන් වහන්සේගේ හදවත ඕතොමන්ගේම හදවතට පහළින් සකස්වුනු අතර එය ස්පන්දනය වීම ආරම්භ වූයේ එකට එකතුවය. සත්‍ය වැඩසිටීමේ පළමු සත්ප්‍රසාද නිවහන තුළ කවදාවත් නිම නොවෙනා හදවත් යුගලයේ මනෝහර සම්බන්ධය ආරම්භ වුණි.3 මෙම ප්‍රේමයේ ගිවිසුම හා හදවත් යුගල අතර සහයෝගීතාවයේ උපරිම ප්‍රකාශනය කුරුසියේ යාගය සිදුවූ මොහොතේ දී සිදුවිය. මෙම ප්‍රේමයේ බන්ධනය, ගැලවීමදායක දූත මෙහෙවරේ සහ ශුද්ධවන්ත ක්‍රියාවලියේ ක්‍රියාශීලි සම්බන්ධතාවයයි. දෙවන වතිකාන මන්ත්‍රණ සභාව මගින් නිකුත් කළ “ලූමේන් ජෙන්ට්සියුම්” (LWMEN GENTIUM) හෙවත් සාන්ත සභාව පිළිබඳ වේද සත්‍ය ව්‍යවස්ථාව, මෙම සම්බන්ධතාව පුත්‍රයා හා මව අතර පවතින “නිත්‍ය බන්ධනය” වශයෙන් හඳුන්වයි (අංක 53).

මරියෝත්තමාවන් වහන්සේගේ තක්ෂිලාවට ඇතුලත් වෙනවා යනු “මරියෝත්තමාවන්ගේ හදවත තුළින් ජේසුස් වහන්සේ සමග ජීවමාන සම්බන්ධතාවයක් ඇති කර ගැනීමට අපව යොමු කිරීමයි” (රොසාරියුම් විර්ජිනිස් මරියේ, අංක 2). ක්‍රිස්තු අභිරහස ගැන අධ්‍යයනය කිරීමට ඇති විශිෂ්ටතම පාසල මරියෝත්තමාවන්ගේ හදවතයි.

ජේසුස් වහන්සේ ගැන අපට උගැන්වීමට වඩා සුදුසු පුද්ගලයෙක් තවත් සිටීද? ශු. ලූක් තුමා නැවත නැවතත් අපට පවසන්නේ කන්‍ය මරියෝත්තමාවන් සියල්ලක්ම සිය හදවතෙහි රඳවාගත් බවත්, එසේම එය කල්පනාකාරීව සිදු කළ බවත්ය. ක්‍රිස්තුස් වහන්සේ පිළිබඳ සියළු දේ ගැන ඕතොමන් ආදරයෙන් සිතා බැලුවාය. කන්‍ය මරියෝත්තමාවන් තම පුතනුවන්ගේ සිරුර පමණක් නොව උන්වහන්සේගේ වචන, ජීවිතය හා අභිරහස් සියල්ලක්ම කල්පනාකාරීව රැකබලාගෙන ආරක්ෂා කළාය. දෙවන වතිකාන මන්ත්‍රණ සභාව පවසන ආකාරයට විශ්වාසයේ ප්‍රධාන ඉගැන්වීම්, මරියෝත්තමාවන් ඕතොමන්ගේ පුද්ගලත්වය තුළ සම්බන්ධ කොට නැවත පුනරුච්චාරණය කරයි (ලූමෙන් ජේන්ට්සියුම්, අංක 65).

ක්‍රිස්තුන් වහන්සේට ඇති ප්‍රේමයේ තක්ෂිලාව නිර්මල මරියෝත්තමාවන්ගේ හදවතයි. එම පාසල ඇත්තේ බුද්ධිය පෝෂණය කිරීමට පමනක් නොව උන්වහන්සේගේ හදවතේ ජීවමාන ප්‍රතිරූපයන් වීම සඳහා සැකසෙන්නට හා පරිණාමනය වෙන්නට අපගේ හදවත් සමග භාවනා කිරීමට, ප්‍රේමයෙන් සිතා බැලීමට, ක්‍රිස්තුස් වහන්සේගේ හදවත පිළිබඳ කල්පනාකාරීව මෙනෙහි කිරීමටයි. එවැනි ගුරුවරයෙක් හා ආදර්ශයක් අප සතුවීම මොන තරම් භාග්‍යයක්ද?

ශු. ජෝන් බොස්කෝ මුනිතුමාගේ වයස වසර 9 ක්ව තිබිය දී එතුමාගේ පළමු දිවැසිවර සිහිනය දැකීමට හැකිවිය. එතුමා විසින් විස්තර කරන ආකාරයට එම සිහිනය තුළ ජේසුස් වහන්සේ ඔහුට දර්ශනය වී, ඔහුට සත්‍ය දැනුම උගන්විය හැකි ප්‍රඥාවන්තම ගුරුවරු ඔහුට ලබාදෙන බව පවසා ඇත. ඉන්පසුව කන්‍ය මරියෝත්තමාවන් දර්ශනය වී ඔහුගේ අත අල්ලාගෙන ඇත.4 එම මොහොතේ පටන් ශු. ජෝන් බොස්කෝ මුනි තුමන් විසින් කන්‍ය මරියෝත්තමාවන් ඔහුගේ ගුරුතුමිය ලෙස සැලකිල්ලට ගෙන, දේව කැමැත්තේ අභිරහස් හා සැලැස්ම වෙත මග පෙන්වීම සඳහා ඕතොමන්ට ඉඩ සලසන ලදී.

මරියෝත්තමාවන් වහන්සේගේ හදවත තුළ අප රැඳෙන කල අපි ඕතොමන්ගේ පුතනුවන්වහන්සේගේ හදවත සමග ඉතා කුළුපගව සම්බන්ධ වේ. සාන්ත ලූවී මොන්ෆට් මුනිතුමාට අනුව ජේසුස් වහන්සේට ලංවීම සඳහා ඇති සුරක්ෂිතම, පහසුම, කෙටිම හා පරිපූර්ණ මග භාග්‍යවත් කන්‍ය මරියෝත්තමාවන්ය.5 තව දුරටත් ඔහු පවසා සිටින්නේ ජේසුස් වහන්සේ සමග සම්බන්ධය ඇති කර ගැනීමට ඇති හොඳම මග ඕතොමන් බවයි. ඔහුගේ ආදර්ශ පාඨය වූයේ “මරියෝත්තමාවන්වහන්සේ තුළින් ජේසුස් වහන්සේ වෙත” (TO JESUS THROUGH MARY) යන්නයි. ජේසුස් වහන්සේගේ සත්ප්‍රසාදීය හදවතේ ඇති ප්‍රේමයේ අභිරහස ගැන අවලෝකනය කරන්නට ඕතොමන්ගේ හදවත තුළින් අපි ඉගෙන ගනිමු. දෙවන ජුවාම් පාවුළු ශුද්ධෝත්තම පියතුමා පවසන ලෙස ක්‍රිස්තියානි ජනතාව ක්‍රිස්තුන් වහන්සේගේ මුව මඬලේ අලංකාරය ගැන අවලෝකනය කරන්නට හා උන්වහන්සේගේ ආදරයේ ගැඹුර අත්දකින්නට මරියෝත්තමාවන්ගේ තක්ෂිලාව තුළට පිවිසේ (රොසාරියුම් විර්ජිනිස් මරියේ, අංක 1).

භාග්‍යවත් කන්‍ය මරියෝත්තමාවන් විසින් ප්‍රේමයේ කලාව වන ගැඹුරු මෙනෙහි කිරීම අපට උගන්වනු ලබයි. ගැඹුරු මෙනෙහිකිරීම යනු හදවතින් බැලීමයි. ආදරයෙන් බැලීමයි, ක්‍රිස්තුස් වහන්සේගේ හදවතේ අභිරහස් අපට අවබෝධ කරගත හැක්කේ ඒවා ගැන ආදරයෙන් අපගේ හදවත් තුළ මෙනෙහි කළොත් පමණි. අපගේ මෙනෙහි කිරීමේ සැබෑ ආශාව වන්නේ ක්‍රිස්තුන් වහන්සේට ඇති ආදරය පමණි. උන්වහන්සේගේ ආදරයේ මහිමය අපට සොයාගත හැක්කේ ආදරයෙන් යුතුව මෙනෙහි කළොත් පමණි. මේ හේතුව නිසා මරියෝත්තමාවන්ගේ හදවත සමග අපි භාවනා කළ යුතු වෙමු. ක්‍රිස්තුස් වහන්සේගේ අභිරහස් ගැන කියවන්නට, තේරුම් ගන්නට හා ඒ තුළට කා වැදෙන්නට හැකිවන්නේ මරියෝත්තමාවන්ගේ හදවතේ ඇති ආදරය සමගිනි. කුරුසිය හා දිව්‍ය සත්ප්‍රසාදය තුළ සිදුරු කරනු ලැබීමට, කැඩීමට තරම් අන්තයකට ආදරය කළ හදවත ගැන මෙනෙහි කිරීමේ ගුරුවරිය හා ආදර්ශය මරියෝත්තමාවන් වේ.

මරියෝත්තමාවන්ගේ තක්ෂිලාව තුළ ප්‍රථම ශිෂ්‍යයා වන්නේ ශු. ජුවාම් අපෝස්තුළු තුමායි. කන්‍ය මරියෝත්තමාවන් සමග කුරුසිය පාමුල සිටිද්දී ක්‍රිස්තුන් වහන්සේගේ හදවතේ ප්‍රේමයේ අභිරහස පිළිබඳ ඔහු ඉගෙන ගත්තේය. එමගින් සෙකරායා 12/10 සඳහන් දිවැසි වැකිය සම්පූර්ණ කෙරිනි. “ඔවුන් ඇණ තුවාල කළ තැනැත්තා දෙස බලනු ඇත”. කන්‍ය මරියෝත්තමාවන් උගන්වනවා පමණක් නොව ඕතොමන්ගේ මාතෘක මැදහත්වීම තුළින් ස්ප්‍රිතු සාන්තු වහන්සේගේ බහුල වූ වරම් අප වෙත ලඟා කර දෙන නිසා මෙම අවලෝකනය බැලීමකට පමණක් සීමා නොවී එම අවලෝකනය කරනු ලබන අභිරහස් සැබැවින්ම විද්‍යමාන කරනු ලබයි. එම අභිරහස් වල වරප්‍රසාදයන් ඕතොමන් අප වෙත ලඟාකර දෙනු ලබයි.

සිය සිසුවන් සඳහා කන්‍ය මරියෝත්තමාවන්ගේ “පාඩම් සටහන” වන්නේ සිය පුතනුවන් වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ පාස්කු අභිරහසයි. “රොසාරියුම් වර්ජිනිස් මරියේ” නැමැති අපෝස්තලික අනුශාසනාවේ දෙවන ජුවාම් පාවුළු ශුද්ධෝත්තම පියතුමා පවසන ආකාරයට කිසි දෙයකට සමකළ නොහැකි, විශ්වාසයේ වන්දනා ගමන නමැති උදාහරණය අපට ඉදිරිපත් කරමින්, ශුද්ධාත්මයාණන් වහන්සේගේ තිළිණයන් බහුලව අප වෙත ලබා දෙමින් මරියෝත්තමාවන් අපට උගන්වන්නීය. (අංක 14). සැබෑ දිව්‍ය සත්ප්‍රසාදීය ශ්‍රාවකත්වයේ සුපිරි ආදර්ශය එතුමියගේ ජීවිතය ලෙස සැලකිය හැකිය.


මේ පිළිබඳව වැඩිපුර කථා කරන්නට පෙර මරියෝත්තමාවන් සහ දිව්‍ය සත්ප්‍රසාදයේ අභිරහස අතර පවතින ගැඹුරු සම්බන්ධතාවය පිළිබඳ ඉතිහාසය කෙටියෙන් ඉදිරිපත් කිරීම උචිත යැයි සිතමි.

**✍ ගරු විලියම් ඉවාන්ස් ලියනාරච්චි පියතුමා**

## ජන වන්දනාව

### ශුද්ධෝත්තම පාප් වහන්සේගේ ලංකා ගමන හා. ජුසේවාස් මුනි සුදුවරයට එසැවීම

**විශ්වාසිකයන්ගේ යැදුම්**
**2014 ඔක්තෝබර් 12 ඉරුදින දේව මෙහෙයට**



- දෙවි පියාණන් වහන්සේ තම ඒක ජාතක පුත් ජේසුස් සමිඳුණන් අප හට දෙමින්, තමන්ට ප්‍රතිලාභයක් නොදිය හැකි අයට යහපත කිරීමේ පරිත්‍යාගි පැවැත්මේ යථාර්ථය පෙන්වූ අන්දම සිහිපත් කරමින් ගැළවීමේ තිළිණය සැමහට උරුමවනු සඳහා ලෝකය වඩාත් යහපත් ලෝකයක් බවට පත් කරලීම සඳහා අප සැම වෙහෙසෙන පිණිස,
- කතෝලික සැදැහැවතුන් අප සැමදෙන ධර්මදූතික සේවාව පිළිබඳ ඇල්මෙන් ජ්වලිතව අපගේ ඇදහිල්ලෙහි ඇති අලංකාරත්වය අන් අය සමඟ බෙදු ගැනීම සඳහා අවශ්‍ය වරප්‍රසාද අප සැමට ලැබෙන පිණිස,
- ලොවෙහි සියලුම රාජ්‍ය නායකයන් ද, ජනතා නායකයන් ද දෙවි සමිඳුන් වෙතින් ප්‍රඥව ලබාගෙන යුද්ධයේ නිෂ්ඵලභාවයත් ඒ වෙනුවට සංවාදය සහ සුහද හමුව තුළින් අවංකව සත්‍යය හා සාධාරණත්වය සඳහා කැප වන පිණිස,
- ශ්‍රී ලාංකික කතෝලික සැදැහැවතුන් හා. ජුසේ වාස් පියතුමාගේ සැදැහැ බැතිය සහ යාච්ඤාවේ දිවි පෙවෙත දෙස අවධානය යොමු කරමින්, ධ්‍යානශීලි යාච්ඤාවේ බලය අත්දකින පිණිස,

## භාග්‍යවත් ජුසේ වාස් මුනි ජාතික කාර්යාලීය නිවේදනය

ඇතැම් දෙව්මැදුරු ආශ්‍රිතව භාග්‍යවත් ජුසේවාස් මුනි ශුද්ධවරභාවයට ඔසවන ලෙස යාච්ඤාව තවදුරටත් උච්චාරණය කරන බව දැනගන්නට ලැබී ඇත. අප ශ්‍රී ලාංකේය අපෝස්තුළුවරයාණන් ශුද්ධවරයට එසැවීම පිළිබඳව වතිකානය නිවේදනය කර ඇති නිසා පහත සඳහන් තුති පිදීමේ යාච්ඤාව දිව්‍ය පූජාවන් ආශ්‍රිතව උච්චාරණය කරන ලෙස සැදැහැවතුන්ට කාරුණිකව දැනුම් දෙනු කැමැත්තෙමු. **(ලේකම් - අතිගරු ඇන්ටනි ප්‍රනාන්දුපුල්ලේ පියතුමා)**

### තුති පිදීමේ යාච්ඤාව

**සියලු බලැති සදදරණීය දෙවි පියාණන් වහන්ස,**

අපගේ බැගෑපත් යැදුම් සහ කන්නලව්ව දයාවෙන් සවන් දී අප ආදර අපෝස්තුළුවරයාණන් වන භාග්‍යවන්ත ජුසේ වාස් මුනිඳුන් අප මව්බිමේ පළමු සාන්තුවරයාණන් ලෙස දනය කිරීම වෙනුවෙන් අපි ඔබවහන්සේට ස්තූති කරමු.

දෙවි පියාණනි, දැඩි පීඩන සමයක් තුළ ධර්මදූත සේවය මඟින් අප මුතුන් මිත්තන්ගේ විශ්වාසය රැකදීම ගැන අපි ඔබවහන්සේට මුළු හද පත්ලෙන්ම ස්තූති කියමු. එමෙන්ම එතුමන්ගේ ජීවිත කාලය තුළදී ද, මරණින් පසුවද, අප දේශයට එතුමන් මඟින් දනය කළ වරම් සම්භාරය සහ සිදු කළ ප්‍රාතිහාර්යයන් උදෙසා ද, අපි ඔබවහන්සේට සද ණය ගැති වෙමු. ශුද්ධාත්මයාණන් වහන්සේගෙන් සපිරි ජේසු සමිඳුන්ගේ ජීවමාන සාක්ෂිකරුවන් වන පිණිස අප විශ්වාසය ස්ථිර කළ මැනව. අප බලාපොරොත්තුව ශක්තිමත් කළ මැනව. අප ප්‍රේමය ජ්වලිත කළ මැනව. අප ආදර ජන්ම භූමියට ස්ථිර සාර සාමය ද, එලෙසම, ලක්මෑණියන්ගේ දරුකැල වන අප සැමට එකමුතුකම, සමගි සන්ධානය සහ සමෘද්ධිය ද දනය කළ මැනව. ආමෙන්.

# දෙවියන් වහන්සේ මට සවන් නොදෙන්නේ !!!

**පසුගිය සතියෙන්...**

ක්‍රිස්තුන් වහන්සේගේ පුනරාගමනය බලාපොරොත්තුවෙන් සිටින අපි මේ පාප ශෝධන කාලය තුළ යාච්ඤා සහගතව බලා සිටිමු. පාපයෙන් කිළිටි වී ඇති ජීවිතයකට වරප්‍රසාදයට ඇතුළු විය නොහැකිය. "දෙවියන් වහන්සේගේ කැමැත්ත නම් ඔබ ශුද්ධව සිටීමය." (1 තෙසලෝනික 3:3) අප බලා සිටින්නේ දේව වරප්‍රසාදය හා ආශිර්වාදය ය. දෙවියන් වහන්සේ බලා සිටින්නේ අපගේ පවිත්‍ර භාවයයි. අප යාච්ඤා වලට පිළිතුරු නැතැයි අප සිතන්නේ ඇයි?

"නුඹ නොවටිනා දේ නොව අගනා දේ කතා කරන්නෙහි නම් නුඹ මාගේ මුඛය මෙන් වන්නෙහිය." (ජෙරමියා 15:19).

"සමිඳුනි මා සුව කළ මැනව. එවිට මම සුව වන්නෙමි. මා ගළවා ගත මැනව. එවිට මම ගැළවෙන්නෙමි" (ජෙරමියා 17/14).

"මගේ සිතුවිලි නුඹගේ සිතුවිලි මෙන් නොවේ. මාගේ මාර්ග නුඹගේ මාර්ග මෙන් නොවේ. නුඹේ සිතුවිලි වලට වඩා මාගේ සිතුවිලි බොහෝ සේ උසස්ය." (යෙසායා 55:8,9)

**හැම පැත්තටම නැවෙන දිව**

අපගේ දිව අප නිසි ලෙස හසුරුවන්නේ නම් ස්වාමින් වහන්සේගේ කැමැත්ත ලෙස එය සිදුවන්නේ නම් අපගේ යාච්ඤා නිශ්ඵල වන්නේ නැත. ඕපාදූප, කේලාම්, හිස් බස්, වහසි බස්, නොදොඩන්නේ නම් අප යාච්ඤාවන්ට පිළිතුරු එතරම් දුර නැත.

"දිව දමනය කිරීම කිසිවකුට නුපුළුවන. එය හික්මවිය නොහැකි නපුරු ඉන්ද්‍රියයකි. එයින් අප ස්වාමින් වන පියාණන් වහන්සේ පසසමු. එයින්ම දිව්‍ය සමානත්වයෙන් මවන ලද මනුෂ්‍යයන්ට සාප කරමු. ප්‍රශංසාවත් සාපයත් එකම මුඛයෙන් නික්මෙයි." (ජාකොබ් 3:8-10)

"දිය උල්පතේ එක සිදුරෙන් මිරිදියත්, කරදියත් නික්ම එයිද? දිවුල් ගසේ රට වෙරළුත්, මිදිවැලේ දිවුල්වත් හටගනී ද? කරදිය උල්පතෙන් මිරිදිය නික්මෙන්නේ නැත." (ජාකොබ් 3:11-12)

"අප දොඩන වචන පිරිසිදු නම්, චේතනා පවිත්‍ර නම් අප ඉල්ලීම් වලට පියාණන් වහන්සේ සවන් දෙනු ඇත. තේරුමක් නැති හිස් දෙඩවිලි වලින් වැළකී සිටින්න." (2 තිමෝති 2:16)

පව්කරුවකු පාපය තුළම මිය යෑම පියාණන් වහන්සේගේ අභිමතය නොවෙයි. කෙසේ හෝ කවදා හෝ පාරිශුද්ධත්වය කරා පැමිණීම පියාණන් වහන්සේගේ ශුද්ධවූ කැමැත්තය.

"ඔබ ඉල්ලුවත් ලැබෙන්නේ නැත. ඔබ ඉල්ලුවත් වැරදි ලෙසද, ආත්මාර්ථකාමී තෘප්තිය සඳහා ද ඉල්ලන බැවින් එය නොලැබෙන්නේ ය. අවිශ්වාසි ජනයෙනි, ලෝකය සමඟ මිතුරුකම, දෙවිඳුන් සමඟ සතුරුකම බව ඔබ දන්නේ නැද්ද? එබැවින් කවරෙක් වුවත්, ලෝකය හා මිත්‍රවන්නට කැමැත්තේ නම් ඔහු දෙවිඳුන්ට හතුරෙක් වන්නේය" (ජාකොබ් 4:3-4)

**මාගේ කැමැත්ත හා දේව කැමැත්ත**

"උන්වහන්සේ ඉදිරියෙහි අපට තිබෙන නිසැකකම නම් උන්වහන්සේගේ කැමැත්ත ලෙස යමක් ඉල්ලුවොත්, උන්වහන්සේ අපේ ඉල්ලීම් අසන බවය. උන්වහන්සේ ඒ ඉල්ලීමට සවන් දෙන බව අපි දනිමු නම්, අප උන්වහන්සේගෙන් ඉල්ලන දේ අපට ලැබෙන බව අපි දනිමු." (1 ජුවාම් 5:14-15)

මාගේ කැමැත්ත හා ආශාව පියාණන් වහන්සේගේ කැමැත්ත සහ සසැඳේද? නැතහොත් පරස්පර විරෝධී ද? ඉල්ලා යදින සැම යැදුමක්ම පාරිශුද්ධත්වය කරා අප ගෙන යයි ද? මෙලෙස බලද්දී අපට ලැබෙන ජීවිත කුරුසයන්, ලෙඩ දුක්, ප්‍රශ්න ගැටලු, වේදනාවන් අප ගෙන යන්නේ පාරිශුද්ධත්වය කරාය. කරුණු කාරණාවන් එසේ වෙද්දී, පාරිශුද්ධත්වය කරා අප මෙහෙයවන එම කුරුසයන් ලිහිල් කිරීම සඳහා හෝ පූර්ණ මිදීමක් සඳහා යාච්ඤා කළ හැක්කේ කෙසේද? එවන් යැදුමක් සාධාරණීකරණය කළ හැකි ද? මල් උයනේ දී ජේසුස් වහන්සේ යාච්ඤා කළේ, "පියාණනි, ඔබ කැමති සේක් නම් මේ කුසලාන මාගෙන් පහ කළ මැනව. එහෙත් මාගේ කැමැත්ත නොව ඔබේ කැමැත්ත වේවා" (ලූක් 22:42) කියාය.

මෙවන් කෝණයකින් බලද්දී, ප්‍රශ්න, ලෙඩ රෝග අප හමුවට එද්දී, අපගේ යාච්ඤාව විය යුත්තේ එම කුරුසයන් ලිහිල් කරන ලෙස හෝ ඉවත් කරන ලෙස නොවේ. එම කුරුසයන් භාර ගෙන, විඳ දරා ගැනීම තුළින් අප පාරිශුද්ධත්වය කරා මෙහෙයවන ලෙසය.

"යමෙක් මා අනුව එනු කැමැත්තේ ද, ඔහු තමකම නසා කුරුසිය දරමින් මා අනුව ඒවා." (මතෙව් 16:24).

"මහත් විපාකයක් ඔබට ඇති බැවින් ඔබගේ විශ්වාසය අත් නොහරින්න. දෙවියන් වහන්සේගේ කැමැත්ත ඉටුකොට, උන්වහන්සේගේ පොරොන්දුව ලැබීමට නම් ඉවසීම ඔබට අවශ්‍යය." (හෙබ්‍රෙව් 10:35,36).

✍ **ගරු සාර්ටෝ නෝනිස් පියතුමා**
හලාවත පදවි ගිහිදූත සේවා අධ්‍යක්ෂ

# යාම යැදුමට සහ පොදු යැදුමට අත්වැලක් ලෙසින්

## තෙවන සතිය ඉරිදා උදා යාම යැදුම

### 93 වැනි ගීය

**මෙම ගීතය අයත් වන්නේ ප්‍රශස්ති ගී කාණ්ඩයටය. එමෙන් මෙය රජුන් සිංහාසනාරූඪ වන අවස්ථාවල භාවිත කෙරෙන ගී අනු කාණ්ඩයට ද බෙදා වෙන් කළ හැකිය (ගීතා 47:95-99). මේ ගීයෙන් හුවා දැක්වෙන්නේ දෙවි ස්වාමින් වහන්සේගේ රාජකීයත්වයයි. සෑම මිනිස් රජෙක් දෙවි සමිඳාණන්ගේ රාජකීයත්වය හමුවේ සේවකයෙක් වන්නේ ය. ගීතිකා කතුවරයා දෙවි සමිඳාණන්ගේ මහිමාන්විත රාජකීයත්වය සකල විශ්වය පුරා පැතිර පවතින අන්දම ද විස්තර කරයි.**

ලේඛන සැලැස්ම :
වගන්ති 1 - 2 : සකල විශ්වයේ රජිඳාණන් වන දෙවි සමිඳාණන් වහන්සේට ප්‍රශංසාව.
වගන්ති 3-4 : සාගරයේ බලවේග දෙවි සමිඳුන් යටතේ පැවතීම.
වගන්ති 5 : ව්‍යවස්ථාව හා දේව මාළිගය පිළිබඳ ප්‍රශංසාව

**විග්‍රහය සහ අර්ථය**

(අ) වගන්ති 1-2

මෙම ආරම්භක කොටසෙහි විස්තර කෙරෙන්නේ දෙවි සමිඳාණන්ගේ විශ්ව රාජකීයත්වයේ මහිමාන්විත බවය.

**සමිඳාණෝ රජකම් කරන සේක:** හෙබ්‍රෙව් පිටපතේ "යාවේ මලාක්" යනුවෙන් දැක්වෙන මෙම යෙදුම රාජකීයත්වය පිළිබඳ ප්‍රශස්ති ගී බොහොමයක ආරම්භයෙහි දැක්වේ. (ගීතා 97:1, 99:1, 96:10). එමගින් දෙවි මහෝත්තමයාණන්ගේ රාජකීයත්වයේ යථාර්ථය සහ ගාම්භීර බව හැඟවේ.

**ජයශ්‍රීය නමැති ඉග පටිය බැඳ :** මෙම රූපකය, පුරාණ ගිව්සුම් භාෂා ව්‍යවහරය අනුව දෙවියන් වහන්සේ සතු විශේෂ බල මහිමය සංකේතවත් කරයි. ඉන් උන්වහන්සේගේ ගුණාංග ද ක්‍රියාවන් ද ප්‍රබලව පෙන්නුම් කෙරේ. (යෙසායා 11:5, 51:9, එපේසි 6:14-17)

(ආ) වගන්ති 3-4

මෙම ප්‍රධාන කොටස තුළින් විස්තර වන්නේ විශ්වය පුරා පැතිර ඇති දෙවි සමිඳාණන් වහන්සේගේ ආධිපත්‍යයයි. ගීයේ මුල් පදයේ දැක්වෙන අන්දමට මෙම විශ්ව ආධිපත්‍යය සකල මැවිල්ල තුළ දෙවියන් වහන්සේගේ ප්‍රඥාව, බලය හා සාධාරණත්වය පිළිබිඹු කරයි. (ගීතා 96:10).




මරිය වසර

**ගරු දයා ෂෙල්ටන් වැලිකඩආරච්චි පියතුමා**

☛ ඉදිරියට

## දෙලොවම රැජිණ

*සුගුණ පුරා දෙවිඳු කරා - සහසක් අතරින් තෝරා*
*මවක වුනා දෙවිඳු අරා - ලොව හා වී සගය පුරා*

*දෙව් කුමරුට මව් වීලා - තිස්තුන් වසරක් රැකලා*
*දෙව් පිත් සිත් පුරවාලා - ගත් ගිවිසුම් සපත කළා*

*දෙව් වදනේ හස රැඳුනි - පාපය නැසුමට පැමිණී*
*තවත් අයෙක් නැත උපණි - දුක් කඳුලැලි හා ගැටුනී*

*පරමණ්ඩල දෙව් දිනිතියෙ - කනප නිමල මව් කුමරියෙ*
*දෙව් කුමරුගෙ මව් රැජිණියෙ - අප හැමගෙම මව් රැජිණියෙ*

*ලොවකම පව් මල සේදූ - සදහම් මග සැම පැහැදූ*
*දෙව් බව මුළු ලොව සෑදූ - ඔබටයි ගරුසරුව පිදූ*

✍ **කේ. ජේ. හෙන්රි පෙරේරා**
**මීගමුව**

## යාච්ඤාවේ සුන්දර මව ඔබයි මරි මවේ

ජන්ම පව් දෙසින් මිදුන එකම කාන්තාව ඔබයි අම්මේ
දේවදූත ගාබ්‍රියෙල් මංගලම් කීවේ ඔබටයි ආදර අම්මේ
දෙවි අභිමතයට නිහඬව හිස නමා කීකරු වූයේ ඔබයි අම්මේ
දේව කැමැත්ත තම කැමැත්ත කරගත්තේ එලෙසයි ඔබ අම්මේ

කරුණාව බැහැපත්කම උපතින්ම උරුම කරගත් අම්මේ
ආරංචිය ඇසූ සැනින් ඥාතිවරිය දැකීමට ගිය අම්මේ
එළිසබෙත් තුමියව සතුටින් ඉපිල යෑමට සැලසූ අම්මේ
සැමට සැම විට ආදරෙන් පිහිට වූයේ ඔබයි ආදර අම්මේ

දෙව්පුතු තම කුසයට නිහඬව පිළිගත්දා සිට අම්මේ
දෛනික කටයුතු වලදී නිහතමානිව නිරත වූවා අම්මේ
සිතුවද ගවහල ඔබට තිඹිරි ගෙයක් වෙයි කියලා අම්මේ
දෙව් බව සඟවාගත් මිනිස් පුතෙකු ලොවට බිහිකෙරුවා අම්මේ

යාච්ඤාවේ සුන්දර මව ඔබයි අපෙ ආදර මරි අම්මේ
ශුද්ධවූ ජපමාලයේ ද රාජේශ්වරිය ඔබයි අපෙ මරි අම්මේ
පව්කාරයන්ගේ සරණය ඔබයි අපෙ ආදර මරි අම්මේ
ශ්‍රී ලංකාවේ ද රානි මෑණිය ඔබයි අපෙ මරි අම්මේ

✍ **නිර්මලා රත්නායක**
**සා. පීතර විදුහල, කොළඹ 04**

ජනතා හඬ

# දොන් බොස්කෝ තුමා නැවතත් ඔබ අමතයි!




**කතුතුමනි,**

**මීගමුවේ පෙරියමුල්ල දුම්රිය හරස් පාර අසල ස්ථානගතකර ඇති දොන් බොස්කෝ පිළිරුව ඉතාමත් දර්ශණීය ලෙස විරාජමානව සිටී.**

මීගමු නගර සභාව ඉදිරිපිට පිහිටුවා ඇති ජේසුතුමාගේ ප්‍රතිමාව තරමටම නොදෙවෙනිව ඇත. දොන් බොස්කෝ පිළිරුව අවට ඉතාමත් සිත්ගන්නා ආකාරයෙන් මල් වවා විදුලි බුබුලුවලින් අලංකාර කර ආරක්ෂිත වැටකින්ද සමන්විතය. බස් රථ හා දුම්රියවලින් ගමන් කරන මගීන්ට ඈත තියාම දර්ශණය වෙමින් මනසට ශාන්තියක්ද ගෙනදේ.

මෙයට කලිනුත් මේ ලියුම්කරු 'ප්‍රදීප' පුවත් පතින් දැනුම්වත්කර සිටියේ මෙම පිළිරුවට ඉහලින් ආවරණ වහලක් සවිකිරීමේ වැදගත් කමයි. දොන් බොස්කෝ තමා දේව රාජ්‍යය පතල කිරීම සඳහා කළ කැපකිරීම් හා දූත කාර්යයන් නොදත් ඉබාගාතේ යන කුරුලු පිරිස් මෙම පිළිරුව මත ලැගුම් ගනිමින් විඩා හරින්නේ එය අපවිත්‍ර කරමිනි. උන් නොදත්කමට එසේ කළත් දන්නා කරන සැදැහැවත් අපි මෙය තිබූ ආකාරයෙන්ම රැකගත යුතු වන්නෙමු. එය අප දොන් බොස්කෝ තුමා කළ මහා මෙහෙවර වෙනුවෙන් කෘතෝපකාර දැක්වීමක් වේ. එබැවින් එතුමා අපට නැවත සිහි කැඳවීමක් කෙරෙන තුරු නොඉඳ වහ වහා ශීර්ෂාවරණයක් සවිකිරීම සඳහා වගකිව යුතු පිරිස්වලට ආයාචනා කර සිටින්නෙමු.

**කේ. ඒ. රෝලන්ඩ් ලෙස්ලි**
මීගමුව

# සසුන් පියා අධිවේගී මගෙහි ආවොත්

**කතුතුමනි,**

අතිඋතුම් ප්‍රැන්සිස් සසුන් පියාගේ ලංකා ගමන අපට ඉතාමත් වැදගත් එකකි. එම දිනය උදාවන තුරු අප බලාසිටින්නේ නොඉවසිල්ලකිනි. එදින අපට උන්වහන්සේව ඉතා සමීපව දැක බලාගැනීමේ භාග්‍යය උදාකර ගත හැකි නම් එම ගමන අපගේ ජීවිත වලට තව තවත් වැදගත් වනු නොඅනුමානය.

කටුනායක ගුවන් තොටුපලට සැපත්වන උන්වහන්සේව පැරණි මීගමු කොළඹ මාර්ගය හරහා කැඳවාගෙන ඒමට දැනටමත් සැලසුම් කර ඇති බව ඥානාර්ථ ප්‍රදීපය පුවත් පතින් දුටිමි. මෙම ලිපිය මගින් අදහසක් එක් කරමින් කරුණු දක්වන්නේ උන්වහන්සේව අධිවේගි කොළඹ මාර්ගය හරහා කැඳවාගෙන ඒම කරන්නේ නම් වැඩි ජනකායකට පහසුවෙන් උන්වහන්සේව සමීපව දැක බලා ගැනීමේ අවස්ථාව උදාවන බවයි.

පැරණි මාර්ගය පටුය. එම මාර්ගය දෙපසට ජනයා එක්රොක් වූ විට තව තවත් මාර්ගය පටුවේ. තදබදයක් ඇතිවේ. තවත් අතකට මාර්ගය දෙපස ඇති ගොඩනැගිලි නිසා පවතින ආරක්ෂාවටද බාධාවකි. යම් හැකියාවක් ඇත්නම් කොළඹ කටුනායක අධිවේගි මාර්ගය එදිනට වසා දමා උන්වහන්සේගේ පැමිණීම සඳහාම වෙන්කර ගත හැකි නම් එය අගනේය. මාර්ගයේ එක් පැත්තක් උන්වහන්සේගේ පැමිණීම සඳහාත් අනෙක් පැත්ත මහජනතාව සඳහාත් වෙන්කර ලොකු කුඩා කාටත් අතිඋතුම් සුදුතුම් පියාණන්ව සමීපයේ සිටම දැක බලා ගැනීමටත් උන්වහන්සේගේ ආශිර්වාදය ලබාගැනීමටත් අවස්ථාවක් මින් උදාවනු ඇත.

කොළඹ කටුනායක අධිවේගි මාර්ගය ඉතාමත් සුන්දර ප්‍රදේශයක් හරහා විහිදි යන මාර්ගයකි. අප රටේ ස්වභාවික අලංකාර සුන්දරත්වය උන්වහන්සේගේ නෙත ගැටීමද මෙම අවස්ථාවෙන් උදාවෙන තවත් භාග්‍යයකි. තවත් අතකින් මෙම මාර්ගය අප රටේ සංවර්ධනයේ තවත් එක් පැතිකඩකි. එම පැතිකඩ හරහා උන්වහන්සේගේ පැමිණීම යොදා ගන්නේ නම් එය මොන තරම් ආශිර්වාදයක් ඇති කරවන්නක් ද? මෙම අදහස කෙරෙහි අවධානය යොමු කරන ලෙස ඉල්ලීමක් කරමි.

**සුමිත් මාර්ක් ද සිල්වා**
කඩලාන

# හොර පෙත්සම් සහ කැලෑ පත්තර මාෆියාව

**කතුතුමනි,**

**කිතුනු සභාව නොයෙකුත් මාදිලියේ කෙනෙහිලිකම් වලට ලක්වීම අද ඊයේ සිදුවූවක් නොවේ. සභාවට මේවා හොඳට හුරු පුරුදුය. සභා ඉතිහාසය දෙස බැලූ විටද මෙය මනාසේ පැහැදිලිය. මෙම කෙනෙහිලිකම් සඳහා මේ නරුමයෝ නොයෙකුත් ක්‍රමවේදයන් භාවිත කරති. "හොර පෙත්සම් සහ කැලෑපත්තර" මින් දෙකකි.**

මෙම ක්‍රමවේදයන් දෙක අද ශ්‍රී ලංකාවේ බොහෝ මීසම් තුළද මෙම මුග්ධයන් විසින් කරලියට ගෙන එනු ලබයි. මීසමේ ගරු පියතුමන්ලා සහ එහි උන්නතිය සඳහා කැපවී ක්‍රියා කරන කොටස් අධෛර්යයට පත්කොට මුලු මීසම් ව්‍යුහයම අකර්මන්‍ය කිරිම මොවුන්ගේ පව්ටු චේතනාවයි. මෙම අවාසනාවන්ත තත්ත්වය කතෝලිකයන් වශයෙන් අප විසින් සැලකිල්ලට ගත යුතුව ඇත.

පෙත්සම වනාහි හොඳ දෙයකි. පෙර කල පමණක් නොව දැනුදු මිනිස්සු පෙත්සමේ ආනුභාවයෙන් නොයෙකුත් අවශ්‍යතා සපුරා ගනිති. එහෙත් හොර පෙත්සම ඊට වඩා සපුරා වෙනස්ය. මෙය වනාහි අනුන්ට කරන වල කැපීමකි. තමන්ගේ පෞද්ගලික අභිමතාර්ථයන් මුදුන්පත් කර ගැනීමට නොහැකිවූ තැන එයින් මතුවන කෝපාග්නියෙන් හොඳ සිහිය අවුල්කර ගන්නා මොව්හු සංඝයේ කතෝලිකයන් භේදකර කොටස් කිරීමටත්, පවතින සංහිඳියාව සහ එකමුතුව නැති භංග කර දැමීමටත් මෙම හොර පෙත්සම මෙවලමක් සේ යොදා ගනිති.

මෙය යකාගෙන් ලබාගත් යතුරක් බඳුය. හොර පෙත්සම්කාරයා කරනුයේ ඉතා පහත් චේතනාවෙන් මෙම යතුරෙන් සියලු දොර අගුලු ඇර බැලීමය. ඔහු කරන අමනෝඥ ක්‍රියාවේ පිළිකුල් බව ඔහුටම නොදැනේ.

කැලෑපත්තර කාරයාත් එසේමය. කපුටා කුනු කන්දල් අවුස්සා, එහිම ලැග යමක් සොයාගෙන කන්නාක් සේ මොහුද එහෙ මෙහෙ අතපත ගා මෙලෝ රහක් නැති යමක් සොයා ගනී. මෙම අසත්‍ය තොරතුරු අපහාසාත්මක ලෙස කොලයක දවටන මොහු රාත්‍රි කාලයේ 'දවල්මිගෙල් ඊ දනියෙල්' චරිතය මනාසේ රඟපා හොර රහසේම ආපසු යන්නේය.


ගෙට රිංගන අවස්ථාවේදී ඇසුණ හඬින් පිබිදෙන බිරියටද බොරුවක් දෙසා බා අටවෙනි පනතට විරුද්ධව පාපයක්ද කොට නිදි යහනට වන මොහු පසුදින පිබිදෙන්නේ තමන් විසින් කරන ලද චරිත ඝාතනයේ ප්‍රතිඵල දැන ගැනීමේ අධමවූත්, තිරස්චීනවූත් පහත් අභිරුචියෙනි. එහෙත් මේ වනවිට සැබෑ කිතුනුවකුට හසුවන මෙම අසත්‍ය මඩ පෝස්ටර සුණු විසුණු වී හමාරය.

එබැවින් සැබෑ කිතුනුවන් සහ කිතුනු සභාව පමණක් නොව සදාචාරාත්මක මුලු ලොවම මෙම නින්දා සහගත ක්‍රියාදාමයන් කිසිසේත් අනුමත නොකරන අතර මොවුන් සදා පිළිකුලට සහ කොන්වීමට ලක්වන බව ඉර හඳසේ පැහැදිලිය. බුද්ධිමත්ව සහ සදාචාරාත්මකව කටයුතු කිරීමේ හැකියාවෙන් මිනිස්සු අද පිරිපුන්ව සිටිති. කලින් කල මතුවන ප්‍රශ්න, ගැටලු අභියෝගයන් තෝරා බේරාගෙන ඒවාට නිසි විසඳුම් සෙවීමට මෙම පිරිපුන් බව යොදා ගත්තේ නම් එය කෙතරම් ප්‍රශංසනීයද? ගෞරව සම්ප්‍රයුක්තද?

වෙසෙසින් කිව යුත්තක් ඇත. අති උතුම් ෆ්‍රැන්සිස් අප සුදුතුම් පියතුමාගේ සම්ප්‍රාප්තිය වැඩි ඈතක නොවේ. උන්වහන්සේ සැදැහැ සිතින් පිළි ගැනීම කතෝලික අපගේ පරම යුතුකමයි. එතුමාගේ ආගමනයට තව සුලු කාලයක් ඇති හෙයින් එම කාලය තුළදී මෙම අසංවර සංස්කෘතියෙන් මිදී උන්වහන්සේ අවංකවම පිළිගැනීමට පහන් සිතක් ඇති කර ගැනීම වඩා කාලෝචිත නොවන්නේද?

**ආර්. ඒ. ඩී. රිගොබර්ට්**
වැලිකන්න

# දෙවියන් වහන්සේ ආවේ සැබවින්ම මොකටද?



**කතුතුමනි,**


**දෙවියන් වහන්සේ ආවේ මොකට ද? යන හිසින් පළවූ සාමාන්‍ය සමයේ විසිවන ඉරුදින මෙනෙහි කිරීම පිළිබඳව අපට හැඟී යන අඩු පාඩුවක් පිළිබඳවයි.**

එහි සඳහන් විධියට "දෙවියන් වහන්සේ පුතාව එව්වේ යකාව එළවීමටය. දෙවියන් වහන්සේට, මිනිසුන්ට සුව සෙත සැලසීම ස්වර්ගයේ සිට ද කළ හැකිය. එයට මාංශගත වීමක් අවශ්‍ය නැත. උන්වහන්සේට ස්වර්ගයේ සිට කළ නොහැකි එකම දෙය වූයේ යක්ෂයාව මෙල්ල කිරීමය. ඌව එළවීමට උගේ බිල්ල දිය යුතුමය."

දෙවියන් වහන්සේට ස්වර්ගයේ සිට දෙවියන් හා සමාන වෙන්නට ගිය දේව දූතයන් ස්වර්ගයෙන් නෙරපා හැරීමට හැකි නම් යක්ෂයාව මෙල්ල කිරීමට ස්වර්ගයේ සිට බැරිකමක් වේද? ලූක්තුමාගේ සුබ අස්නේ පළමුපරිච්ඡේදයේ 37 වැනි වගන්තිය කියන්නේ "...... මක්නිසාද දෙවියන් වහන්සේට නොකළ හැකි කිසිවක් නැත" යනුවෙනි. ඌව (යක්ෂයාව) එළවීමට උගේ බිල්ල දිය යුතුම බව ද උන්වහන්සේ සිය ජීවිත පූජාවෙන් යකාගේ බිලි පඬුර ගෙව්ව බවද එහි සඳහන් කෙරෙයි. බිලි දී යක්ෂයාව එලවන්නේ - නූල් බැඳ යක්ෂයාගේ බලපෑම තාවකාලිකව නතර කරන්නේ - කට්ටඩින්ය. මේ මෙනෙහි කිරීම දෙවියන් වහන්සේව කට්ටඩියකුගේ තත්ත්වයට ඇද දැමීමක් නොවේද?

සැබැවින්ම දිව්‍ය පූජා යාගයේ දී ක්‍රිස්තුන් - වහන්සේගේ ශ්‍රී ශරීරයට හා ශ්‍රී රුධිරයට හැරවුණු පූපය හා මිදිරස දෙවිපියාණන් වෙත ඔසවා ඔප්පු කරන්නේ දෙවියන් වහන්සේට පිළිගන්වන සැබෑ බිලිපඬුර ලෙසයි. "එදා ආදි මව්පියන් යකාගේ බහ විශ්වාසකර මැවුම්කාර දෙවියන් වහන්සේගේ වචනය - නියමය - අවිශ්වාසකර යකා කී දේ කළ හෙයින් මිනිස් සංහතිය දේව සම්බන්ධතාවයෙන් කැඩී යක්ෂයා හා බැඳීමක් ඇති වූ හෙයින් ඒ වහල් බවින් මුදා ගැනීමට - දේව විරෝධි පාපයෙන් මනුෂ්‍යයා ගලවාගෙන යළි දෙව් - මිනිස් සබඳතාව තහවුරු කිරීමට දිය යුතු වන්දිය ගෙවීමටයි ක්‍රිස්තුන් වහන්සේ මෙලොවට වැඩියේ. සර්වසාධාරණ වූ දෙවියන් වහන්සේට විරුද්ධව මනුෂ්‍යයා කළ පාපයක් නිසා දෙවියන් වහන්සේගේ ගාම්භීරත්වයට - පරමේශ්වරත්වයට සරිලන වන්දියක් ගෙවිය යුතු වන අතර මනුෂ්‍යයා කළ වරද නිසා වන්දිය මනුෂ්‍යයාගේ වන්දියක් ද විය යුතු හෙයින් දෙව් - මිනිස් බව ගත් ක්‍රිස්තුන් වහන්සේ මෙලොවට වැඩම කර ඒ වන්දිය තම ජීවිත පූජාවෙන් දෙවියන් වහන්සේ වෙත ඔප්පු කළසේක" යනු අපේ හැඟීමයි. ඥානාර්ථ ප්‍රදීපයේ පළවූ මෙනෙහි කිරීමේ සඳහන් වූ බිලිපූජාවේ සත්‍යාසත්‍යතාව පැහැදිලිකර දෙන මෙන් සභා ශ්‍රේෂ්ඨයන් ගෙන් කාරුණිකව බැහැපත්ව ඉල්ලා සිටිමු.

**කේ. ඩී. ඒ. තියඩෝර්**
දියලගොඩ



# ලූර්දු වන්දනා ගමන කැමරා ඇසින්



සමාරම්භක දිව්‍ය පූජා මෙහෙය



කොළඹ අගරදගුරු පදවිය ලූර්දු ගුහාව අභියසදී දේව මාතාවන්ට කැප කරමින්....





ඉරිපහන් පෙරහරට මූලිකත්වය දෙමින්...



දේවමාතා ප්‍රතිමාව වඩම්මවාගෙන යන ශ්‍රී ලාංකික වන්දනාකරුවන්......

## ලෝක ධර්මදූත ඉරුදින 2014.

# ජීවිත වෙනසකි
# දේව රාජ්‍යය වටිනා
# පතල කරමු




ශු. ජාකොබ් තුමාගේ
"තමාට ඇදහි
ක්‍රියාවලින් එය ප්‍රකාශ
ඇද්ද?... යම් සහෝදරය
ඇඳුම් නැතිව, දිනපතා
න් කෙනෙක් ඔවුන්ගෙ
නොදී ඔබට දෙවි පිහි
කා බී සතුටු වන්නැ"යි
එයින් මොන යහපතක
මළ ඇදහිල්ලකි. (ජාකෙ
සිරුර මළ සිරුරක් වන
මළ ඇදහිල්ලකි." (ජාකෙ

ඒ එසේ වුවත් අ
ගැන අපෝස්තුළුවරුන
වන්නේ වෙනත් දෙයකි
එහි ප්‍රතිඵලය ද මොන

"එකල සැදැහැවත්
සිටියහ. තමන් සතු දෙ
කිසිවෙක් නොකීහ. සිය
(ක්‍රියා 4:32).

"ඔව්හු ප්‍රේරිත
සහභාගිකමෙහිද, පූප
ද, නිරතව කල් ගත
ගෞරවාන්විත භීතියක
අතින් බොහෝ අරුම පු
සැදැහැවත් සියල්ලෝ එ
තබා ගත්හ. ඔවුහු තමන්ගේ ඉඩ-කඩම් හා දේපල විකුණා එකිනෙකාගේ උවමනාවේ ප
බෙදා ගත්හ. තවද ඔවුහු දිනපතා නොකඩවාම එක්සිත්ව දේව මාලිගාවේ රැස්වෙමින්
කඩමින් ද, තම තමන් අතරේ ප්‍රීතියෙනුත්, ත්‍යාගිවන්ත සිතිනුත් ආහාර බෙදා ගනිමි
ප්‍රශංසා කරමින් හා සියල්ලන්ගේ ප්‍රසාදය ලබමින් ද කල් යැවූහ. ස්වාමින් වහන්සේ
සංඛ්‍යාවට ගැලවීම ලබන්නන් එක් කර වදාළ සේක." (ක්‍රියා 2:42-47)

අප මුල් ක්‍රිස්තියානිකාරයෝ සැබෑ කිතුනු අනුගාමිකයන් මෙන් ක්‍රිස්තු ජේසු සමි
මෙසේ ජීවත් වූහ. ඒ දුටු කිතුනුවන් නොවූ රෝම අධිරාජ්‍යයේ ජනතාව "බලන්න, මේ
වෙන ලස්සන" යයි කියනු අපි පොත පතේ කියවා, අසා ඇත්තෙමු. ඔවුනගේ ඒ
මිකයන් පැහැදුනා පමණක් නොව, ඔවුනගේ ඒ ක්‍රියාකාරී ඇදහිල්ල අනුව යමින් ඔවුහු
"යන්න, සකල ලෝකයට ගොස් සියලු දෙනා මාගේ ගෝලයන් කරන්න... මම ද කල්ප
සමඟසිටිමි" යන ක්‍රිස්තු ආඥාවට අප මුල් ක්‍රිස්තියානිකාරයෝ අවනත වූයේ එලෙසය.
නොව, කිතු දහම තුළ ජීවත් වෙමින් එතුමන්ට සාක්ෂි දැරූහ. ක්‍රියාකාරී විශ්වාසය ඔවු
වූයේ කෙසේ ද යත් කිතු සමිඳුන් වෙනුවෙන් ඕනෑම තාඩන පීඩනයකට මුහුණ දෙමින්
ජීවිත පූජා කිරීමට පවා ඒ අය ඉදිරිපත් වූහ. එදා ක්‍රිස්තු සභාව ගොඩනැගී වර්ධනය වූ
ලේ මතය. කීමද අපි මෙහිදී මතක් කර ගනිමු. අවවාදයට වඩා ආදර්ශය උතුම්ය
සාක්ෂාත් කර ගනිමු.

එදා මුල් ක්‍රිස්තියානිකාරයන් ගැන, එදා ක්‍රිස්තියානි නොවූ අය කී දේ අද ක්‍රිස්තිය
ක්‍රිස්තියානි නොවන අය කියයි ද? "බලන්න මේ ක්‍රිස්තියානින් ජීවත් වන ලස්සන" කිය
අපි අසා ඇත්තෙමුද? ඒ එසේ නොවේ නම් අද අපට සිදු වී ඇත්තේ කුමක් ද? කිතු ද
වී දැනට වසර 500 කට වැඩිය. එහෙත් අද ශ්‍රී ලංකාවේ කිතුනුවන්ගේ සංඛ්‍යාව රටේ
පමණක් බව සඳහන් වේය. ක්‍රි.ව. 1960 ගණන් වල 8% ක් පමණ සිටි කිතුනුවෝ ආගම
සිටිය ද අපි අද වර්ධනය වෙනවා වෙනුවට තව තවත් පසුබසිමින් සිටිමු. එදා බෞද්ධ,
සංඛ්‍යාත්මකව සිටි කිතුනුවෝ අද 4 වැනි තැන ය. කිතුනුවන්ගේ වර්ධනයේ පසුබෑම
"යන්න, සකල ලෝකයට ගොස් සියලු දෙනා මාගේ ගෝලයන් කරන්න." යන ක්‍රිස්
එසේ නම් අපි කුමක් කරමුද? අපට වැරදි ඇත්තේ කොතැනද? දේව රාජ්‍යයේ වටිනාක
රාජ්‍යයේ වටිනාකම් වලට වැඩි අවධානයක් යොමු කරනවා ද? අප පැරැන්නන්ගෙන්
ඉගෙන ගැනීමට ඇතැයි පිළිගනිමු ද? අපි ආගම තුළ ජීවත් වෙන අයට වඩා ආගම
මුල් කිතුනුවන්ගෙන් අප ජීවිත වලට යමක් ඉගෙන ගනිමු ද? ඇදහිල්ලට වඩා අපි
විශ්වාසයක් බවට පරිවර්තනය කර ගනිමු. මෙලොවින් ඔබ්බට සදාකාලික ජීවිතයක් අ
අපගේ ජීවිත ගත කරමු.

මෙවර ධර්මදූත ඉරුදින දී අපි අපගේ කිතුනු ජීවිතය ගැන ටිකක් වැඩිපුර කල්පන
සලසා ගනිමු. අප කිතුනු ජීවිත වල අඩුපාඩු මකා ගැනීමටත්, ක්‍රියාකාරී කිතුනු ජීවිත
ගනිමු. ක්‍රිස්තු සමිඳුන්ගේ ඉල්ලීමට ගරු කරමින් වචනයෙන් හා ක්‍රියාවෙන් ක්‍රිස්තුන් වහන්සේව නාඳුනන අයෙකුට උන්වහන්සේ ගැන කතා කිරීමට ඉදිරිපත් වෙමු. අප දරුවන්ට, මෙලෝ ජීවිත වටිනාකම් වලට වඩා දේව රාජ්‍යයේ වටිනාකම් අනුව ජීවිත හැඩගස්වා ගැනීමට අපිත් ආදර්ශවත් වෙමු. කුඩා කල සිටම අප දරුවන්ට ප්‍රේමය, ප්‍රීතිය, සාමය, ඉවසීම, කරුණාව, යහපත්කම, විශ්වාසවන්තකම, මෘදුකම හා ආත්ම දමනය නමැති ශුද්ධාත්ම ඵල තුළ ජීවිත ගොඩනගා ගැනීමට කියා දෙමු. අපි සැවොම මෙසේ "ජීවිත වෙනසක් තුළින් දේව රාජ්‍යය වටිනාකම් පතල කරමු."

ඔබ සැමට ජේසු පිහිටයි! ජේසු අම්මාගේ රැකවරණයයි.



**ගරු රෙජිනෝල්ඩ් සපරමාදු පියතුමා**
ධර්මදූතාධාර සංගම් - ජාතික අධ්‍යක්ෂ

**ජාතික අධ්‍යක්ෂක**
**ශුද්ධාසනීය ධර්මදූත සංගම්, නො. 19. බැල්කම් පෙදෙස, කොළ**
**දුරකථන / ෆැක්ස් : 011-2685673**
**ඊමේල් ndpms@sltnet.lk, Website : www.pontificalmiss**

10. 19

න්

නාකම්

ලිපිය අපි මෙසේ කියවමු :
ල්ල ඇතැයි යමෙකු කීවත්,
නොවේ නම්, ඉන් වැඩක්
යකු හෝ සහෝදරියක හෝ
කෑම නැතිව සිටියදී, ඔබගෙ
ශාරීරික අවශ්‍යතා සපයා
ටයි, උණුසුමට ඇඳ පැළඳ,
ඔවුනට කියන්නෙහි නම්
ද? ක්‍රියා විරහිත ඇදහිල්ල
කාබ් 2:14-17) "හුස්ම නැති
සේම ක්‍රියා නැති ඇදහිල්ල
කාබ් 2:26).
ප මුල් ක්‍රිස්තියානිකාරයන්
ගේ ක්‍රියා පොතේ සඳහන්
. එහි ක්‍රියාකාරී විශ්වාසය ද
වට පැහැදිලි කර දේය.
සමූහයා එක්සත්ව, එක්සිත්ව
යින් කිසිවක් තමාගේ යැයි
ල්ල පොදුවේ තබා ගත්හ."

යන්ගේ ඉගැන්වීමෙහිද,
කැඩීමෙහි ද, යාච්ඤාවෙහි
කළහ. සියලු දෙනා තුළ
ඇති විය. ප්‍රේරිතයන්ගේ
පුදුම දේ හා ලකුණු සිදු විය.
ක් වී හැම දෙයම පොදුවේ
යැටියට සියලු දෙනා අතරේ
ද ගෙයින් ගෙට යමින් පූප
මින් ද දෙවියන් වහන්සේට
සේ දවසින් දවස ඔවුන්ගේ

ඳුන්ගේ දහම අනුව යමින්
ම් ක්‍රිස්තියානිකාරයෝ ජීවත්
ජීවිත රටාව ගැන අන්‍යාග
ද ක්‍රිස්තු අනුගාමිකයන් වූහ.
ාන්තය දක්වා සදහටම ඔබ
. ඔවුහු වචනයෙන් පමණක්
වුන් තුළ තව තවත් බලගතු
න්, එතුමන් වෙනුවෙන් තම
යේ ප්‍රාණපරිත්‍යාගිවරුන්ගේ
යන කියමනත් අපි මෙසේ

ානින් වන අප ගැනත් අද
යා අප ගැනත් අද කියනවා
හම ශ්‍රී ලංකා භූමියේ පතිත
මුළු ජනගහනයෙන් 7% ක්
ම් අනුව 3 වෙනි ස්ථානයේ
හින්දු සහෝදරයන්ට පසුව
ක් මෙයින් අපි දකිමු. නමුත්,
තු ආශාව අදටත් වලංගුය.
කම් වලට වඩා අපි මෙලෝ
අප ජීවිත වලට වැඩි යමක්
අදහන්නෝ ද? අපිත් අප
ත් අප විශ්වාසය ක්‍රියාකාරී
පට ඇති බව පිළිගෙන අපි

ා කිරීමට ඉඩ
කට යොමු වීමටත් අපි ඉටා



ඔ 08.

sionlk.org

# ශු. සභාව හා ධර්මදානය

අප සැම ධර්මදූතයන් වීමට කැඳවා ඇත.

**ශුද්ධවූ සභාවේ ධර්ම ප්‍රචාරක ක්‍රියාකාරිත්වය පිළිබඳ ප්‍රකාශයෙන් උපුටා ගැනීමකි...**

No.23 - ක්‍රිස්තුස් වහන්සේගේ සෑම ශ්‍රාවකයකුම විශ්වාසය පතල කිරීම සම්බන්ධයෙන් තමාගේ කොටස ඉටු කිරීමට බැඳී සිටියි.

No.35 - ධර්ම ප්‍රචාරය මුළු ශුද්ධවූ සභාවේ කාර්යයක් වන හෙයින් ද, ක්‍රිස්තු ධර්මය පතුරුවා හැරීම දේව ජනතාවගේ මූලික යුතුකමක් වන හෙයින් ද, මේ සියලු දෙනා තුළ ඇතුළාන්ත වූ හෘදයාංගම වෙනස් වීමක් පතයි. මෙසේ ඔවුහු ශුභාරංචිය පතල කිරීම සම්බන්ධයෙන් තමාගේ වගකීම ගැන පැහැදිලි ලෙස දැනුම් තේරුම් ඇතිව ජාතීන් අතරේ ධර්ම ප්‍රචාරක කෘත්‍යයට සහභාගි වන්නෝ ය.

No.38 - අපෝස්තුලු සමාජය වෙනුවෙන් පත්වන රාජගුරු මණ්ඩලයේ සාමාජිකයන් වශයෙන් සියලු රාජගුරු ප්‍රසාදිවරු තම පදවි භූමි ප්‍රදේශය සඳහා පමණක් නොව මුළු ලෝකයේ ගැලවීම සඳහා අභිෂේක කරනු ලබන්නෝ ය.

No.39 - පූජාප්‍රසාදිවරු ක්‍රිස්තුන් වහන්සේගේ නියෝජිතයෝ ය. ඔවුහු ශුද්ධවූ සභාවේ මෙහෙයයට අදාළ වන තුන් විධ ශුද්ධවූ කාර්යයන් සම්බන්ධයෙන් රාජගුරුප්‍රසාදිවරුන්ගේ සහකාරයෝ ය. එහෙයින් තමන්ගේ ජීවිතය ධර්ම ප්‍රචාරය සඳහා ද කැපවී තිබෙන බව ඔවුන් සම්පූර්ණයෙන් වටහා ගත යුතුය.

No.40 - පැවිදි ජීවිතයේ ධ්‍යාන පන්ති ද ක්‍රියාකාරක පන්ති ද ලෝකයෙහි ක්‍රිස්තු දර්මය පතුරුවා හැරීම සම්බන්ධයෙන් ඉමහත් සේවයක් කර තිබේ. දැනුදු එසේ කරති. මේ ශුබද්ධවූ සංසදය මේ පංතිවල වටිනාකම සතුටින් පිළිගෙන ඒවා විසින් දෙවියන් වහන්සේගේ මහිමය සඳහා ද ආත්මයනට සේවය සඳහා ද කරන ලද සියලු දේ ගැන දෙවියන් වහන්සේට ස්තුති කරන අතරම ඒවා විසින් ආරම්භ කරන ලද කාර්යයන් දුෂ්කරතාවන් නොබලා තවත් දුරට කරගෙන යන ලෙස අනුශාසනා කරයි. නියම ලෙස ධර්ම ප්‍රචාරක පරමාර්ථයක් ඇති ක්‍රියාකාරී පැවිදි සමාජ ද, එබඳු විශේෂ පරමාර්ථයක් නැති ක්‍රියාකාරක පැවිදි සමාජය ද යන මේ දෙවර්ගයේම පැවිදි සමාජ විසින් ජාතීන් අතරේ දෙවියන් වහන්සේගේ රාජ්‍යය විස්තර කිරීමට තවත් යමක් නොකළ හැක්කේ දැයි දෙවියන් වහන්සේ ඉදිරියෙහි අවංක ලෙස විමසා බැලිය යුතුය.

No.41 - ශුද්ධවූ සභාවේ ධර්ම ප්‍රචාරක කාර්යයට ගිහියෝද සහයෝගය දක්වති. ඔව්හු සාක්ෂිකාරයන් මෙන් ද ජීවන උපකරණ මෙන් ද ශුද්ධවූ සභාවේ ගැළවීමදායක මෙහෙයයට පංගුකාරයෝ වෙති.

ගිහියන්ගේ ධර්මදූත සේවාව පිළිබඳ ප්‍රකාශයෙන් උපුටා ගැනීමකි.

No.12 - වර්තමාන සමාජය පිට තරුණ පක්ෂයේ ආකල්පමය බලපෑමක් ඇත්තේ ය. සමාජය තුළ ඔවුන්ගේ ආනුභාවය වර්ධනය වන ප්‍රමාණයට ක්‍රියාකාරී ධර්මදූත සේවාවක් ද ඔවුන්ගෙන් බලාපොරොත්තු වනු ලැබේ.

වැඩිහිටියන් තරුණ පක්ෂය සමඟ මිත්‍ර ලීලාවෙන් සාකච්ඡා පැවැත්වීම හේතුකොටගෙන වයසින් වෙනස් වූ දෙපක්ෂය විසින්ම තම තමන් අන්‍යෝන්‍ය ලෙස දැන ගෙන එක එක් පක්ෂයට විශේෂ වූ යහපත් දේ හුවමාරු කර ගැනීමට හැකි වන්නේ ය.

ළමයින් විසින් ද කළ යුතු ධර්මදූත සේවා කටයුතු ඇත්තේ ය. තමන්ගේ මිත්‍රයන් අතරේ තමන්ගේ තත්ත්වය අනුව ක්‍රිස්තුස් වහන්සේට සැබෑ වූ ජීවමාන සාක්ෂියක් වන්නට ඔවුනට හැකියාවක් ඇත්තේ ය.

**2013 ධර්මදූත අරමුදලට ඔබ අත දී ඇත්තේ මෙලෙසයි**

| පදවිය | අරමුදල |
|---|---|
| අනුරාධපුරය | 56,201.00 |
| බදුල්ල | 83,870.00 |
| හලාවත | 555,284.00 |
| කොළඹ | 2,332,156.50 |
| ගාල්ල | 102,264.00 |
| යාපනය | 798,778.00 |
| මහනුවර | 295,260.00 |
| කුරුණෑගල | 232,270.00 |
| මන්නාරම | 4,186,790.00 |
| රත්නපුර | 101,500.00 |
| ත්‍රිකුණාමලය | 106,000.00 |
| මඩකලපුව | 107,281.00 |
| එකතුව | 8,957,654.50 |

# විශ්වාස වර්ධන සංගමය



1822 ප්‍රංශයේ ලියොන් නුවර දී මාරි පොලින් ජෙරිකෝ මෙනවිය විසින් මෙම සංගමය ආරම්භ කරන ලදි. ධර්මදූත කටයුතුවල යෙදෙන ධර්මදූතයන් හට යාච්ඤාවෙන් හා පරිත්‍යාගයෙන් උදව්වන ගිහි පිරිසක් බිහි කිරීම ඇගේ අරමුණ විය. අද වන විට ලෝකයේ සෑම තැනකම මේ දූත මෙහෙවර සඳහා කැපවී සිටින්නෝ බොහෝ ය.


# අනගාරික ධර්මපාල තුමා

ශ්‍රීමත් අනගාරික ධර්මපාල තුමාගේ ගේ 150 වැනි ජන්ම සංවත්සර උළෙල ඉකුත් දා ඉතා උත්සවාකාරයෙන් දිවයිනේ බොහෝ පළාත්හි පවත්වන ලදි.

අප සහෝදර බෞද්ධ ජනතාව එතුමන් කෙරෙහි දක්වන්නේ ඉමහත් ගෞරවාදරයකි. කලක් පසුබෑස්මට ලක් වී සිටි මෙරට බෞද්ධ ජනතාව එතුමාගේ අප්‍රතිහත දිරිගැන්වීම හා අනුබලය නිසා පුනර්ජීවයක් ලබා ගත් බව ඔව්හු කෘතවේදීව සඳහන් කරත්. ඓතිහාසික කරුණු සලකා බලන විට එහි සත්‍යය පැහැදිලි වන්නේ ය.

අනගාරික ධර්මපාල තුමා දහම් සේවාව සඳහා ක්‍රියාත්මක වී ඇත්තේ අප කුඩා දිවයින තුළ පමණක් නොව විදේශීය රටවල් තායිලන්තය (සියම) තුළත් බව පෙනී යන්නේ ය. ඉන්දියාව, ජපානය සහ ඇමරිකාව යන රටවල් තුළ ද එතුමා බුදු දහම නංවාලනු වස් ක්‍රියාත්මක වී තිබේ.

මෙසේ ඉන්දියාවේ හෙවත් "බුදුන් උපන් දේශයේ" මෙන් ම ලෝකයේ වෙනත් ඇතැම් රටවල ද බුදුනු පුනරුදයක් ඇති කළ එතුමනට ඉකුත් දා විදේශ රටවලින් පැමිණි පිරිස ගරු බුහුමන් දැක්වූහ. ළඟදීම ඉන්දියානු රජය එතුමන් ගේ ගෞරවය සඳහා තැපැල් මුද්දරයක් ද නිකුත් කරන බව ශ්‍රී ලංකාවේ ඉන්දියානු මහා කොමසාරිස්වරයා ඉකුත් දා අනාවරණය කළේ ය. මෙය ලාංකේය අප සියලු දෙනාට ගෞරවයකි.



**යටගිය දවස**

විශ්‍රාමික අගරදගුරු අති උතුම් **ඔස්වල්ඩ් ගෝමිස් හිමිපාණෝ**

**183**

රුහුණු පුත්‍රයකු වූ අනගාරික ධර්මපාල තුමා උපතින් හඳුන්වනු ලැබුවේ දොන් ඬේවිඩ් හේවාවිතාරණ යනුවෙනි. ඔහුගේ දෙමාපියෝ කොළඹට පැමිණ, සරුසාර ව්‍යාපාරයක් අරඹා සිටියෝ ය. ඒ කල කොළඹ කොටුව ප්‍රදේශය පොහොසත් පිරිස ජීවත් වූ පෙදෙසක් විය. උයනක් වැනි වූ මේ පෙදෙසේ වැඩියක් ම ජීවත් වූවෝ ඕලන්ද ලංසි පිරිස යි. මෙහි ලංසි බාලිකාවන්ද ඉංගිරිසි උගන්වන ලද පිටකොටුවේ පාසලකට හේවාවිතාරණ ළදරුවා ද යවන ලදි.

මෙම පාසලට වැඩි රුචියක් නො දැක් වූ කුඩා ඬේවිඩ් එතැනින් ඉවත් කොට පිටකොටුවේ "සාන්ත මේරි" කතෝලික පාසලට යවන ලදි. මෙම පාසලේ ඉගෙනීම ලබමින් සිටිය දි දිනක් එවකට කොළඹ අනුරදගුරු තැන්පත් අති උතුම් ක්ලෙමන්ට් පඤ්ඤානි රදගුරු හිමිපාණන් එහි පැමිණ ඇත. පවතින සිරිත පරිදි දණ නමා එතුමන් ගේ මුදුව සිඹින ලෙස සිසුනට නියම විය. ඬේවිඩ් දරුවා ද "පිදිය යුත්තනට පිදීමේ" හෙවත් "පූජාව පූජනීයානං" යන ශික්ෂාව සලකමින් සතුටින් එසේ කළ බව වාර්තා වේ. (ශ්‍රේෂ්ඨ දේශමාමකයෝ දස දෙනෙක් - ඩෝල්ටර් තල්ගොඩපිටිය 22 පිටුව)

සාන්ත මරියා පාසල් අධ්‍යාපනයෙන් පසු හෙතෙම එවකට සා. බෙනඩික්ට් ආයතනය නමින් හඳුන්වන ලද, අද සාන්ත බෙනඩික්ට් විද්‍යාලයට ඇතුළු විය. ක්‍රි.ව. 1876 මැයි මස ඔහුට පාසලෙන් ඉවත් වන ලෙස නියෝග කෙරිණ.

කලක් එහි අධ්‍යාපනය ලැබූ මෙම ශිෂ්‍යයා ඉනික්බිති වරක් පොලිස්පතිව සිටි එච්. එල්. ඩව්බිගින් මහතා ගේ පියාණන් වූ ගරු ආර්. ටී. ඩව්බිගින් දේවගැති තුමා ගේ නායකත්වයෙන් පැවැත්වුණු කෝට්ටේ ක්‍රිස්තියානි විද්‍යාලයට ඇතුළු විය.

මෙම පාසලේ අධ්‍යාපනය බයිබල් දැනුම කෙරෙහි බලවත් ලෙස නැඹුරු වී තිබිණි. බොහෝ විට බයිබල් කොටස් කට පාඩම් කරන්නට ද සිදු විය. ගැටවර වියේ සිටි ඬේවිඩ් ශිෂ්‍යයා පැරණි ගිවිසුමේ ඇතැම් කොටස් කිසිසේත් ප්‍රිය නො කළ අතර නව ගිවිසුමේ ක්‍රිස්තු චරිතය පිළිබඳ කොටස් හෙතෙම ඇලුම් කළේය. ඔහු අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොත පිළිබඳවත් අපෝස්තුළුවරුන් ගේ ධර්මදූත සේවාව කෙරෙහිත් විශේෂ උනන්දුවක් දැක්වූ බව වාර්තා වන්නේ ය.

මෙම පාසලේ ගුරු තුමකු කුරුල්ලන් වෙඩි තබා මරා දැමූ සැටි අප සිසුවා තුළ දැඩි සංවේගයක් ඇති කළේය. එය ඬේවිඩ් සිසුවා අප්‍රිය කළේ ය. දෙවසරකට පසු සිසුවා මෙම පාසලෙන් ද ඉවත් විය.

සියල්ල කුමක් වුවත්, බයිබල් දැනුම ලද ක්‍රිස්තියානි අධ්‍යාපනයෙන් ඔහුට හිමි වූ ප්‍රධාන ලාංඡනය වූයේ ශු. පාවුලු තුමාගේ ධර්මදූත මෙහෙවරයි. "අවුරුදු දහසකට පෙර විසූ ශුද්ධවූ පාවුලු තුමා මෙන් බෞද්ධ ධර්මදූතයකු වීමේ අදහස් බීජය ඔහු තුළ පහළ විය. අශෝක සමයේ බෞද්ධ ධර්මදූතයෝ සිටියහ. මුල් අවධියේ ක්‍රිස්තු ශාසනයේ ක්‍රිස්තියානි ධර්මදූතයෝ ද ඒ සම්ප්‍රදායයෙහිම සිටියෝ ය. ඒ සම්ප්‍රදාය පවත්වාගෙන නොයා යුත්තේ කුමක් නිසාදැයි තරුණයා ප්‍රශ්න කළේය. (ශ්‍රේෂ්ඨ දේශමාමකයෝ දස දෙනෙක් - වෝල්ටර් තල්ගොඩපිටිය - 22 පිටුව)

කෝට්ටේ පාසල් සම්ප්‍රදායක් තමාට නොගැලපුණු හෙයින් තරුණ ඬේවිඩ් හේවාවිතාරණ එයින් ඉවත් විය. මෙවර ඔහු ගේ පියා ඔහු ගෙන ගියේ මිලර් වෝඩන් තුමා යටතේ පැවැති සාන්ත තෝමස් විදුහලට යි. සාන්ත තෝමස් කොලීජිය නමින් වූ මෙම විදුහලට ඔහු ඇතුළු කරන ලද්දේ ක්‍රි.ව. 1878 සැප්තැම්බර් මස දී ය.

යළිත් ඇන්ග්ලිකන් පාසලක් වූ මෙහි දී ද තරුණ ඬේවිඩ් සෑහීමට පත් නො වීය. මිලර් වෝඩන් තුමා ඉතා තද පාලකයෙක් විය. එතුමා පැහැදිලිව ම තම විදුහලේ අරමුණ ඬේවිඩ් සිසුවාට ප්‍රකාශ කැර ඇත. එනම් "අප මෙහි පැමිණියේ නුඹලාට ඉංගිරිසි කියා දෙන්නට නොව, ආගම උගන්වන්නට"යි.

මේ අනුව දෙ වසරක උදා වූ වෙසක් දිනයන්හිදී අවසර නැතිව විදුහලෙන් පිට වී යාම නිසා වේවැල් සංග්‍රහය ලබන්නට ද ඔහුට සිදුවිය. ඒ කල කොටහේනේ සිදුවුනු ආගම් ගැටුමක් නිසා කෝපයට පත් පියා තම පුතනුවන් මෙම කිතුනු පාසලෙන් ඉවත් කර ගත් බව කියැවේ.

මෙලෙස ඉතා හොඳ ඉංගිරිසි අධ්‍යාපනයක් ද ලබා ගත් අනගාරික ධර්මපාල තුමා එයින් උපරිම ප්‍රයෝජනය ලබා ගත්තේ "ආගම් පිළිබඳ ජගත් සමුළුවේ" දී ය. ක්‍රි.ව. 1893 දී එක්සත් ජනපදයේ (ඇමරිකාව) චිකාගෝ නුවර පවත්වන ලද මෙම සම්මේලනය සඳහා එතුමා ආරාධනා ලැබුවේ එහි සංවිධායක කමිටුවේ සභාපති ආචාර්ය ජේ. ආර්. බරෝස්ගෙන් ය.

මෙහි දී පවත්වන ලද දේශනය බුදු දහම ව්‍යාප්ත කරනු වස් විශාල ප්‍රචාරයක් ලබා දුන් බව වාර්තා වන්නේ ය.

ඬේවිඩ් හේවා විතාරණ නමින් වූ මෙම සිසුවා කතෝලික පාසල් දෙකක මෙන් ම එංගලන්ත සභාවේ (අද ලංකා සභාවේ) පාසල් දෙකක ද අධ්‍යාපනය ලද පුද්ගලයෙකි. සිසුවාට කිතු දහම ඉගැන්වීමේ කිසිදු ප්‍රයත්නයක් ගැන ඔහු ගේ කලකිරීමක් කතෝලික පාසල් සම්බන්ධයෙන් සඳහන් වී නැතිව තිබීම සතුටට කාරණයකි.

ප්‍රදීපය

# කෙටි කතා

# ඕපා දූප

කැතරින් ගුණවර්ධන

මාෂියා රට වටා තොරතුරු රැස් කරන්නියක ලෙස පතලව සිටියාය. ගම්මානයේ යම් තැනක කුමක් සිදුවෙත් ද, ඒ සියල්ල ගැන යම් තරමක හෝ දැනුමක් ලද වහාම එය ගම පුරා ප්‍රචලිත කළේ මාෂියාය. කොයි කවුරුත් ඇය හැඳින්වූයේ 'එෆ්එම්' කියායි.

'ඇනී....... දන්නවද ආං පල්ලියට අලුත් පුංචි සුවාමි කෙනෙක් ඇවිත්.....' මාෂියා ආරංචිය රැගෙන දිව ආයේ ඇන්ටනට්ගේ නිවසටය.

'ඔව්..... ආරංචි වුණා....... කොහොම කෙනෙක් ද දන්නෙ නෑ....'

'දන්නෙ කවුද බං...... ඔය තරුණ සුවාමිලා මෙහෙ ආවම හරි ලෙඩ නෙ......'

'ඒක ඉතින් සුවාමිලගෙ තරුණ කමේ වරදක්යැ.... මාෂියො.....?

'අපේ නැට්ටිච්චියො බලං ඉන්නෙ..... ඇලේ දාගන්න නෙ ඇනී.....'

පේදුරු නිවසට ගොඩ වැදුණේ එවිටමය. මාෂියා තරමක් නොසන්සුන් වූවාය.

'මේ..... මං යනවා ඇනී..... ලිපේ මාලුවක්.....'

'ඇයි බං මාෂියො... ලිපේ මාලුව රොස් වෙන්න ඇරල මෙහෙ ආවෙ කාගෙ ඕපයක් අරගෙන ද.....?'

'ඕං...... බලාපන් ඇනී...... පේදුරු අයියගෙ කථාව...... ඕං මං යනවා....'

පේදුරු හක හක ගා හිනැහුණේය. මාෂියා පුපුරු ගහමින් පිටව ගියාය. ඇනී නිහඬ වූවාය.

අලුතින්ම පූජාත්වරය ලැබූ ගරු පියතුමාට සේවය සඳහා ලැබුණු පළමු මීසම මෙය විය. ඔහුගේ ආගමනය කටින් කට ගියේය. ඉරිදා පූජාවේ දී ලොකු සුවාමි විසින් පුංචි සුවාමිව හඳුන්වා දීමෙන් පසු සති කිහිපයක් යනතුරු කිසිදු විශේෂත්වයක් පෙනෙන්නට නොතිබිණි. ඊට හේතු වූයේ පුංචි සුවාමි තම වට පිටාව අධ්‍යයනය කිරීමට කාලය මිඩංගු කළ බැවිනි. ඔහු කලා ලැදි මානව හිතවාදි අයෙකු වූයේය. ප්‍රථමයෙන්ම ඔහු කුඩා දරුවන් සමග වැඩ ඇරඹුවේය. පූජා සහායක දරුවන් තුළ යහගුණාංග හා විනය ගරුකත්වය වර්ධනය කිරීම ඉතා සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීමට ඔහුට හැකිවිණි.

'ඈ....... බං ඇනී...... පුංචි සුවාමි දස්සයා...... පේනවද පූජා උදව් කොල්ලො ටික දැන් හරිම අපූරුයි නෙ......'

'ඒක හැබැයි........ මට අපේ පොඩි එකාගෙන්ම ඒ වෙනස දැනුණා මාෂියො.......'

'අනේ...... වාසනාවන්......'

පුංචි සුවාමිට ප්‍රශංසා ගොන්නකි. අනතුරුව ඔහුගේ ඇස යොමු වූයේ දහම් පාසල වෙතය. දහම් පාසල හොඳින් පවත්වා ගෙන යාමට දායක සභාව පියවර ගෙන තිබුණද සකසා ගත යුතු අඩුපාඩු රැසක් පුංචි සුවාමිගෙ නෙත ගැටිණ. ලොකු සුවාමි සමග ඒ ගැන සාකච්ඡා කර නවීකරණ ක්‍රියාදාමයකට ඔහු පියවර ගත්තේය. එය සමහරුනට රිස්සුවේ නැත.

'මෙච්චර කල් අපි දහම් පාසල කරගෙන ගියේ නැද්ද.....?'

'දහම් පාසලට රිංග ගන්න හදන්නෙ නාඩගම් නටන්න..... නැද්ද.....?'

'හ්ම්! අපි මැරීගෙන වැඩ...... අවුරුදු කීයක් මං පන්ති දෙකක් එකට දාගෙන උගන්වනවා..... කාටවත් ඒව පේන්නෙ නැහැ....'

'ඇයි...... මාත් එහෙම නෙ..... මේ පාර නම් අයින් වෙන්න ඕනෑ.... ඔය තව ඕනෑ තරං ඉන්නෙ.......'

ඒ වියපත් ගුරු දෙපලගේ කතාවක් විය. කතින් කොණින් කෙරුණ මෙවන් සංවාද පියතුමන් අතරට ද නොගියා නොවේ. ලොකු සුවාමි එක් සෙනසුරාදාවක දහම් පාසල් කාර්ය මණ්ඩලය රැස්කර වූයේය.

'කොහොමද ඇන්තනි සර්.... දහම් පාසලේ වැඩ කටයුතු....ෟ'

'හොඳට කෙරී ගෙන යනවා සුවාමි.....'

'අපට සෑහෙන ප්‍රමාණයට ගුරුවරු ඉන්නව ද....?'

'ඒ තරම් ම අවුලක් නැහැ....'

'ඒත්..... සමහරු පන්ති දෙකක් එකට දාගෙන කරනව නේද...... අර තෙරේසා මිස් කාමලිටා මිස්..... එහෙම....?'

ආ....... ඔව්....... ඒ අය කැමැත්තෙන් කරන්නෙ.

'ඒ වුණාට.... ඒක හොඳ මදි....... නේද ලොකු සුවාමි.....?'

පුංචි සුවාමි මැද්දට පැන්නේය. තෙරේසා මිස් නැගිට්ටාය.

'ප්‍රශ්නයක් නෑ...... සුවාමි..... මං අවුරුදු ගානක්ම ඒක කරන්නෙ සන්තෝසෙන්..... ආයේ වෙනසක් මොකට ද.....?'

'නෑ....... නෑ... ඒකෙන් දරුවන්ට කරදරයි.... හතර එක මට්ටමක..... පහ තව මට්ටමක. තෙරේසා මිස් පහේ පන්තිය ගන්න. අපි හතරේ පන්තිය දෙමු අර ඇනීටාට. ඒ ළමයා දහම් ගුරු විභාගයත් සමත්නෙ..... තරුණ ළමයින් මේවට පුහුණු කරන්න ඕනෑ.' ලොකු සුවාමි තීරණය කළේය. තෙරේසා මිස්ගේ මුහුණ කළුතලා වැටිණ.

'එහෙනම් සුවාමි මේ අට නවය.... පන්ති දෙකම කරන්නෙ කාමලිටා මිස්....' ඇන්තනි සර් පැවසුවේය.

'ඔව්..... ඒකත් අපි වෙනස් කරමු....... කාමලිටා මිස් අටේ පන්තිය, නවය භාර දෙමු...... අයිරේනියස්ට..... දෙව්සත්හලේ ඉගෙන ගන්න දරුවා...'

'හොඳයි..... කාමලිටා මිස් ඔන්න ටිකක් නිදහස් දැන්..... එතකොට අභිවෘද්ධි ආලේප ළමයි......?'

ඇන්තනි සර් පැනයක් මතු කළේය.

'ආ! ඒක පුංචි සුවාමිට භාරයි...... හැම බදාදාම සවස තුනට පන්තිය පටන් ගන්නවා....... ළමයින්ට දැනුම් දෙන්න.....'

රැස්වීම නිමා වූයේ අලු යට ගිනි පුපුරු සඟවමිනි. එදිනම සවස යළි මාෂියා, ඇනී වෙත ආවාය.

'දන්නවද ඇනී.... ඕං තෙරේසා මිසුයි, කාමලිටා මිසුයි ආයිමත් දහම් පාසලෙ උගන්වන්නෙ නැති ලු....'

'ඒ මොකද...... මාෂියො.....

'දිව්‍ය සත්ප්‍රසාද පන්තියයි...... අභිවෘද්ධියාලේප පන්තියයි අතැරිලලු.... ඇනීවයි අයිරේනියස් වයි අරංලු..... පුංචි සුවාමිටත් පන්තියක්ලු.....'

'ඉතින්....... මොකද...... ඒ අය තරහ වෙන්නෙ.....ෟ'

'කවුද දන්නෙ බං...... ඕවයෙ මොන මොනවා හරි නැතැ.....'

මාෂියා ඇනීට රහසක් කීවාය. කෙමෙන් කාලය ගෙවී ගිය අතර දහම් පාසල නව පිබිදීමක් සහිතව පවත්වා ගෙන යනු ලැබීය. පුංචි සුවාමි දරුවන්ගේ සිත් දිනාග නිමින් විවිධ වැඩසටහන් දියත් කළේ දරුවන්ගේ ආගමික හා සමාජයීය සංවර්ධනය සඳහා ඇප කැප වෙමිනි. කුමන මති මතාන්තර තිබුණද තෙරේසා හා කාමලිටා ගුරුතුමියත් දහම් පාසල අතැර ගියේ ද නැත.

'පේනවද කාමලිටා..... ඉස්සර ඔයාට ඔය ළමයි පන්තියට ගෙන්නා ගන්න තිබුණ අමාරුව... දැන් ඔය හැම බදාදාම අපූරුවට එන්නෙ..... ටියුෂන් අතෑරල.....

'දැන් එන්නෙ ඉගෙන ගන්නයැ... අල්ලාප සල්ලාපයෙ යෙදෙන්න මිස.... ඕං..... මේ පාර පෙනේවි........ උත්සවේ තරම..... ළමයින්ට සුදු ගවුම, සුදු කලිසම කමිසෙ ලු අඳින්න කිව්වෙ අභිවෘද්ධියාලේපෙ ලබන්න......'

'හැබෑට.... වෙනදට අපි වෙනම ඇඳුම් කට්ටලයක් හදනව නෙ...... ම්..... එහෙනම් ඒකත් එහෙමයි......!

'ඔව්..... ගොඩේ තාලෙට තමා.... මං අර සිතුම් මැඩම්ට කියලත් තිබුණෙ ඇඳුමක් ගැන...... දහම් පාසලට ස්කූල් යුනිෆෝම් හරියනවයැ.....'

අභිවෘද්ධියාලේපය දානයට පෙර දින ළමුන් පාපොච්චාරණයට මෙහෙයවීම භාර කෙරුණේ තෙරේසා, කාමලිටා ගුරුතුමියන්ටය. පාපොච්චාරණය ඇසීම ලොකු සුවාමිට හා අල්ලපු මීසමේ පියතුමාට පැවරී තිබිණ. හදිසියේම ආරාධිත පියතුමාගේ පැමිණීම නතර වුයෙන් පුංචි සුවාමිට එම කාර්යය පැවරිණ. පිරිමි ළමුන් සංඛ්‍යාව ගැහැනු ළමුන් සංඛ්‍යාවට අඩුවිය. පුංචි සුවාමි වෙත යොමු කෙරුණේ පිරිමි ළමුන්ය. පුංචි සුවාමි කොම්සම් පුටුවේ හිඳගෙන බලා හුන්නේය. ලොකු සුවාමි තම කාර්යය මඳකට නවතා නැගිට ආවේය.

'ඇයි.... ඔය ළමයි කොම්සම් කරන්නේ නැද්ද..... කෝ මේ මිස්ලා....'

'මිස්ල තේ බොන්න ගියා....'

'ඉතින්...... ඔය ළමයි අර පුංචි සුවාමි ළඟට යන්නෙ නැත්තෙ ඇයි.....?'

ළමෝ මුහුණෙන් මුහුණ බලාගත්හ. ඔවුන් අපහසුතාවට පත්ව ඇති බව පියතුමා දුටුවේය. ඔහු පේළිය දෙකට බෙදුවේය.

'ඔය ළමයි පුංචි සුවාමි ළඟට යන්න.....'

එහෙත් ළමුන්ගේ ප්‍රතිචාරය පසුබාන සුළුවිය. එක් දැරියක් කටහඬ අවදි කළාය.

'අපට...... මිස්ල කිව්වා..... පාපොච්චාරණයෙන් වැඩි ඵල ලැබෙන්නේ වැඩිහිටි සුවාමිලගෙන් කියල..... පුංචි සුවාමි ළඟට යන්න එපා කිව්වා....' ලොකු සුවාමි නිහඬ වම, කරුණු වටහාගත්තේය.

'හරි..... දැන් මම නෙ කියන්නෙ..... හොඳ හිතින් පාපොච්චාරණය කරල දෙවි පියාණන්ගෙන් සමාව ඉල්ල ගන්න..... යන්න.....'

ලොකු සුවාමි ළමුන්ගේ සිත් පැහැදුවේය. එදා සවස මාෂියා ඇනී සොයා ආවාය.

'ඇනී....... හරි වැඩේ නෙ..... අර දෙන්නා කෙල්ලන්ට කොම්සන් කරන්න පුංචි සුවාමි ළඟට යන්න එපා කියලලු.....'

නෑ...... ඉතින්.......

'ලොකු සුවාමි ප්‍රශ්නෙ විසඳුවා කියන්නෙ..... අනේ කාලේ වනේ වාසේ....'

පේදුරු හක හක ගා සිනාසුණේය.

'ඇයි බං පුංචි සුවාමිල නේන්නං ලොකු සුවාමිල වෙන්නෙ..... ඔය පුංචි සුවාමි නොවැ අභිවෘද්ධියාලේප පන්තිය කළෙත්..... උන්නාන්සේගෙ වැඩ අපූරුයි. කවදා හරි හොඳ තැනකට යාවි....... මොනවද ඔට්ටු.......?'

පේදුරු, පුංචි සුවාමිට සම්මානයක් දුන්නේය.



ෆිලීෂන් අබයකෝන්ගේ

# සුබස 280

## සභාව

සංසද පරිෂද, ආස්ථාන හා සභා සමානපදයි. තේරුම රැස්වීමයි. මුඛ්‍ය, ග්‍රාම්‍ය මෙන් සැදුණු සභ්‍ය නම් සභාවකට සුදුසු යනුයි. සභාවේ හෙළ වදන සබ හෝ සබයයි. සබා යයි සත්‍යයට වචනයකි. සැබවින් ඉන් හටගති. සබවස සත්‍ය වචනයයි. දේවසභා, ධර්මසභා, රාජ සභා, රට සභා, වරිග සභා අතීතයට තල්ලු වී අද රාජ්‍ය සභා, විද්වත් සභා ලෙස නා නා සභාය. ඉන්දියාවේ ලෝක් සභා යන්නෙහි ලෝක් නම් ජනතාවයි. සබකෝලය නම් සභාවක් ඉදිරියේ ඇතිවන ලජ්ජාවයි. "ගුත්තිලයේ සුදම් සුර සබ වෙතට සපැමිණි" යයි කියන්නේ දේව සභාවක් ගැනයි.

ඇංග්ලිකානු, එංගලන්ත, මෙතෝදිස්ත, බැප්ටිස්ට්, ලංකා සභා වශයෙන් නිවැරදිව හැඳින්වෙද්දී කතෝලික සභාවට පමණක් පල්ලිය යයි ලියවෙන්නේ හිතාමතාමද? ශබ්ද කෝෂ උඩින් පල්ලෙන් බැලීම, පළමු තේරුම පමණක් ගැනීම. ඒ තේරුම පවා කාරණයට ගැලපේදැයි නොබැලීම නිසා CHURCH, INTELLIGENCE, INDUSTRY, COVER ආදි වචන කීපයක පරිවර්තන විකෘත වී ඇත. සමහර කතෝලිකයෝ පවා සභාවෙන් අවසර ගත්තා නොකියා පල්ලියෙන් අවසර ගත්තා යයි කීමට හුරුවී සිටිති.

සබයි දමිළ උෟරුවට සභාවයි. ඔවුන්ගේ වාසගම් රැසකට සභා වචනය ඇතුළු වී..... ඇත. සබාරත්නම්, සබේසන්, කනකසබයි. රත්නසබාපති.... ක්‍රිස්තුන්වහන්සේ සභාවට ප්‍රේමකොට සභාව වෙනුවෙන් දිවි පුදකළාක් මෙන් (එපි 5:25) සකල ජාතීහු තමන්ගේ මාතාව මෙන් සභාවට ප්‍රේමකරති. ක්‍රිස්තු රජාණන්ගේ මංගල්ලයට අදාළ පැරණි ජන වන්දනාවෙහි උන්වහන්සේ සභාවේ රජකම් කරන සැටි මැනවින් දර්ශනය වේ. උන්වහන්සේ සභාව නමැති ශරීරයේ හිසය (කොලො. 1:18).

ජයවේ ජේසුනි ගීතිකාව TE SAECULORUM PRINCIPEM නම් ක්‍රිස්තු රජාණන්ගේ හිම්නුස් ගීයේ සාරාංශයකි.

උදාර සිත් සැමා සුදම් දෙස නමා
ඔබේ සබේ තුළා දිලෙයි නිබඳ සේනා
රජ මැති සභා දසුන් සියරටා
නමව් දිනපතා ක්‍රිස්තු රජිඳුටා

# 'තොත්ත බබක්කල' දුනකදෙනියේ

දුනකදෙනිය ශාන්ත අන්තෝනි දෙව් මැඳුරේ ප්‍රතිසංස්කරණ වැඩ කටයුතුවලට ආධාර ලබාගැනීම පිණිස වයඹ කලා පුත්‍ර සම්මානයෙන් පිදුම් ලද කලා භූෂණ සම්මාන ලාභී චිත්‍රපට නිෂ්පාදක නීල් බී. පෙරේරාගේ 'තොත්ත බබක්කල' වේදිකා නාට්‍යය දුනකදෙනිය 'දම් සයුර' ශාලාවේදී රඟදැක්විය. මෙහි සංගීතය අශාන් චතුරංග සපයන අතර ශ්‍රියානි බී. පෙරේරා වේෂ නිරූපණයෙන් එක්විය. 'තොත්ත බබක්කල' වේදිකාවට එන්නේ සා. වින්සන්ද පාවුලා දයා සේවා සංවිධානයේ මෙහෙයවීමෙනි.



# ජෝර්දාන් රජු කිතුනු පීඩා හෙළා දකී



ජෝර්දානයේ අබ්දුල්ලා රජතුමා පසුගිය දා එක්සත් ජාතීන්ගේ සංගමය අමතමින් අතිශය ඕනෑකමින් ප්‍රකාශ කරනු ලැබුවේ, මැද පෙරදිග රටවලැ පවත්නා කිතුනු පීඩාවන් තමන් හෙළා දකිනා බවයි; ජෝර්දාන් රජතුමා අන්තර් ආගමික සංහිඳියා පැවැත්ම හුවා දැක්වෙන කලාපයේ සුහද පාලකයෙකි. සිරියාවේද, ඉරාකයේද පවත්නා කිතුනු පීඩාවන් දුරලා සාමය ආරක්ෂා කර ගැනීම සඳහා අත්වැල් බැඳගත් ක්‍රියාදාමයක් අවශ්‍ය යයි ද එතුමා ප්‍රකාශ කරයි.

ජෝර්දාන් රජතුමා මෙලෙසින් ද ප්‍රකාශ කරයි. 'ඉස්ලාම් දහම විසින් කැරෙනා උගැන්වීම ඉතා පැහැදිලිය; එම උගැන්වීම් විසින් ආගමික ගැටුම් හෙළා දකිනු ලබයි; ඉස්ලාම් දහම විසින් ඒ ඒ රටවලැ පවත්නා කිතුනු හා අනෙක් ආගම් වලට කෙරෙන පීඩාවන් කෙරෙහි කනගාටුව ප්‍රකාශ කරනු ලබයි; අපදැනගත යුතු සත්‍ය වන්නේ, අරාබි කරයේ කිතුනුවන් අදත්, ඊයෙත්, හෙටත් අපේ දේශයේ කොටස් කරුවන් බවයි."

# පකිස්තානයේ කිතුනු දහම් සේවකයා බන්ධනාගාරයේ දී මරා දැමේ

ෂහාර් භාති නම් දහම් සේවකයා, ඉස්ලාම් දහමට නිගරු කළ බැව් චෝදනා කරමින්, බන්ධනා ගත කරනු ලැබුවේ, වර්ෂ 2012 දීය. ඉස්ලාම් දහමට අපහාස කළාය යන චෝදනාව පිළිබඳ කිසිදු සාක්ෂික් නොමැති වුවද, ඔහු සිරගත කොට තබන ලද්දේ, ශාරීරික හා මානසික පීඩාවන් හමුවේය.

එසේ පීඩාවන්ට පත් කිරීමේදි, ඔහු විසින් කිතුනු දහම ප්‍රතික්ෂේප කරනු ඇතැයි අපේක්ෂා කළත් එවැන්නක් නම් සිදු නොවීය. සිරගතව සිටිනා විට අනෙක් සිරකරුවෝ ද, ආරක්ෂක නිළධාරියෝ ද පවා ඔහු අතිශය පීඩාවන්ට පාත්‍ර කළෝය. තවද, ඔවුන්ගේ බලපෑම්වලට අවනත නොවන බැව් ඒත්තු යෑමෙන්, ඔහු සිරගෙය තුළැම මරා දමා තිබිණි. එසේ මරා දමා තිබුණත් කිසිවකු හෝ ඝාතන චෝදනාව මත තවමැ අත් අඩංගුවට ගෙන නොමැති යැයි ද වාර්තා වේ.

පකිස්තානයේ පවත්නා ඒකපාක්ෂික 'ෂාරියා නීතිය' ප්‍රයෝජනයට ගනිමින්, කිතුනු හිංසනය දිගින් දිගට ගෙනයන බැව් හුවා දක්වමින්, එම නීතියේ වෙනසක් කළ යුතු යයි, ඉල්ලා සිටිනු ලැබුවත් එවැන්නක් සිදු නොවන බැව් ද පෙනී ගොස් ඇත; පකිස්තානයේ මෙන්මැ අන් රටවලැ මිනිස් අයිතිවාසිකම් සුරැකීමේ සංවිධාන විසින් ඉල්ලා සිටිනු ලබන්නේ, සිරගතව සිටිනා සුළුතර ආගමිකයන් ආරක්ෂා කිරීමේ ක්‍රියාදාමයක් කල් යල් නොයවා, පනගන්වන ලෙසයි.

# ලොව දරු දැරියන් අපයෝජනයට ලක්වීම වළකාලීමේ සභා මෙහෙවර

ලොවැ දරු දැරියන්ගේ අයිතිවාසිකම් පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කරමින් එක්සත් ජාතීන්ගේ සංගමය විසින් අවධාරණය කරනු ලැබ ඇත්තේ, ලෝකය පුරා පැතිර පවත්නා දරු දැරියන් අපයෝජනයට පාත්‍ර වීම වළකාලීම සඳහා කතෝලික සභාව විසින් සක්‍රීය ක්‍රියාදාමයක් ඉදිරිපත් කර නොමැති අතර, එම සාපරාධය වළකාලීම සඳහා කතෝලික සභා උගැන්වීම් වලැ වෙනසක් කළ යුතු බවය.



ලොවැ දරු දැරියන් අපයෝජනයට පත් කිරීම පිළිබඳව පමණක් නොව, දරු දැරියන්ගේ අයිතිවාසිකම් ගැන ද නිශ්චිත කතෝලික උගැන්වීම් කොයි දේශයටත් සමාජයටත් සමාන වන ලෙස දක්වා ඇත. එම කතෝලික උගැන්වීම් රටින් රටට වෙනස් වන්නේ ද නැත. එහෙත් ශුද්ධාසනය විසින් මෙලෙසින් ද දක්වනු ලබයි; කතෝලික උගැන්වීම් එලෙසින්ම පිළිපැදීම සඳහා බල කිරීමක් සිදු කැරුමට හෝ ඒ ඒ රටවලැ ඒවා නීතිගත කිරීමට හෝ කතෝලික සභාවට පුළුවන් කමක් නැත; දරු දැරියන් ආරක්ෂා කරලීම සඳහා ඒ ඒ නියෝගයන් වතිකානය තුළ ක්‍රියාත්මක කරනු ලැබුවත් ඒවා අන් දේශයන් තුළ ක්‍රියාත්මක කරවීමේ බලයක් ශුද්ධාසනය සතුවේ.

තවද ශුද්ධාසනය විසින් ප්‍රකාශ කරනු ලබන්නේ, කතෝලික සභා උගැන්වීම් ඒ ඒ රටවලැ කතෝලිකයන් අතර ක්‍රියාත්මක කැරෙන නමුත්, ඒවා කිසිදු ආකාරයකින් නීතිගත කළ නොහැකි බවයි; එසේ කිරීම සඳහා කිසිදු බලපෑමක් හෝ කිරීම ජාත්‍යන්තර නීතියට පටහැනි ක්‍රියාවක් ද ලෙසින් ගිනිය හැක. පවත්නා මෙවැනි නීති හමුවේ වුවද, දරු දැරියන් පිළිබඳ උගැන්වීම් ක්‍රියාත්මක කරවීම සඳහා සුවිශේෂි ක්‍රියා මාර්ගයන් ලොවැ පුරා පවත්නා සභාව තුළින් කැරෙනා බව නම් සනාථ කළ හැකි යයි සභාව දක්වයි.

# නයිජීරියාවේ 'බොකෝ හරාම්', ත්‍රස්තයෝ නගර 24 ක් පාලනය කරති



මැදපෙරදිග වපුරුවනු ලබන 'ඉස්ලාම් රාජ්‍ය' සංකල්පය හා අනුගත වෙමින්, නයිජීරියාවේ 'බොකෝ හරාම්' නම් ත්‍රස්ත කණ්ඩායම විසින් නයිජීරියාවේ නැගෙනහිර ප්‍රදේශයේ නගර 25 ක් සිය ග්‍රහනය යටතට ගෙන ඇතැයි නයිජීරියානු රදගුරු ඔලිවර්ඩාෂි හිමිපාණන් විසින් මාධ්‍ය වෙත පවසනු ලැබීය.

එතුමා තවදුරටත් මෙලෙසින් ද ප්‍රකාශ කළ සේක. 'කිතුනුවෝ හා අන් සියල්ලෝ මහත් වේදනාකාරී විනාශයකට පත්වී සිටිති. ජීවිත බේරා ගැන්මට සිය ගේ දොර අතහැර ගිය ජනයා මහ පාරේ වෙසෙමින් එහිමැ නින්දට යති. ඉරාකයේ හා සිරියාවේ ජනතාව ඝාතනය කරනු ලබන ආකාරයෙන්මැ දූ දරුවන් හා වැඩිහිටියන් හා අන් අයද මරාදමති; ජීවිත බේරා ගැනීමට හැකිවූ ඇතැම්හු කඳුකරයේ ගල් ගුහා වලැ පසුවෙති. තවත් බොහෝ දෙනා දහසක් අතවරයන් මැද වනාන්තර වලැ කල් යවති. ඔවුන් ජීවිත බේරා ගැනීමේ සටන ගෙනියනු ලබන්නේ, ආහාර ද, පානීය ජලය ද, බොහෝමයක් දෑ නොමැතිව මරණ මංචකය හමුවේය."

# මිනිස් වෙළෙඳාම ආසියාකරය ලැජ්ජාවට පාත්‍ර කරයි



මියන්මාරයේ යංගූන් හී අගරදගුරු චාර්ලස් බෝ උතුමාණන් විසින් එරටේ ආණ්ඩුව වෙතැ සවිස්තර ලේඛණයක් ඉදිරිපත් කරමින් ප්‍රකාශ කරනු ලැබ ඇත්තේ, රටේ සිදුවන මිනිස් වෙළඳාම වහාම නවතාලීමට පියවර ගත යුතු බැව් අවධාරණය කරමින්ය. එතුමා විසින් තවදුරටත් පවසා ඇත්තේ මිනිස් වෙළඳාම මගින් අසරණ මිනිසුන් නරා වලට ඇද දමනා බවය.

ආසියා කරයේ රටවලැ පවත්නා මෙම වනචාරි මිනිස් වෙළඳාම මගින් මියන්මාරය ඇතුළු ආසියාකරයේ රටවල් අවමානයටත්, ලැජ්ජාවටත් පත් කැරෙනා බැව් එතුමන් විසින් අවධාරණය කරනු ලැබ ඇත. ආසියාකරයේ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් විසින්, රාජ්‍යයන්ගේ රැකවරණය යටතේ පවා, මිනිස් වෙළඳාම ව්‍යාප්තව කෙරිගෙන යන හෙයින්, මෙම අමානුෂික ව්‍යාපාරය නවතා ලීමට සියලු ආගම් මියන්මාරය ඇතුළු ආසියා කරයේ රටවලට බල කළ යුතු යැයි එතුමන් විසින් අවධාරණය කරනු ලැබ ඇත.

# ඔක්ලහෝමා හී සාතන් පිදුමට එරෙහි කතෝලිකයෝ දිව්‍ය සත්ප්‍රසාද පෙරහරේ යති



සාතන් පිදුම්කරුවන් විසින් නීතියට ද හොරා නගරයේ එක් ගොඩනැගිල්ලක බිම් මහලේ සාතන් පිදුමක් පවත්වනු ලැබීය; එම සිද්ධිය පිළිබඳ ආරංචිය පැතිර යද්දී, කතෝලිකයෝ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ, රැගත් පෙරහරක් සංවිධානය කළෝය.

සැප්තැම්බර් මස 21 වෙනිදා ඔක්ලහෝමා නගරයට රැස්වූ දහස් සංඛ්‍යාත කතෝලිකයෝ සත්ප්‍රසාද පෙරහරේ ගමන් ගත්හ. මෙම ආරංචිය පැතිර යද්දී, ටුල්සා නගරයට රැස්වූ කතෝලික පිරිස් දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ සමග පෙරහරක් ඔක්ලහෝමා නගරය කරා පැමින එම කණ්ඩායම් සමග එකතු වූහ. මෙලෙස දහස් සංඛ්‍යාත කතෝලිකයෝ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ සමග ප්‍රීති ඝෝෂාවෙන් පෙරහරේ ගමන් කරද්දී, විශාල පොලිස් පිරිසක් නිහඬව බලා සිටියෝය. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ රැගත් පෙරහර ගමන් ගත් පෝල් කොඅකරලි අගරදගුරු තුමා විසින් පවසනු ලැබුවේ, එදා මෙන් අදත් ක්‍රිස්තුන් වහන්සේ සාතන් පරදවන බවයි. මෙම සිද්ධිය දෙස ඇදැහිල්ලෙන් බලනා විට, දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ කතෝලිකයන්ගේ ජීවිත වලට කොතෙක් දුරට ගැඹුරින් බලපානවා ඇත්දැයි වටහා ගත හැකි යැයි, කතෝලික පුවත් පෙන්වා දෙයි.

බැසිල් ෆොන්සේකා විසිනි

දේශයේ කතෝලික අතීතාවලෝකනයකට ප්‍රදීපය

සාහිත්‍ය අඹර

# සිංහල ජන කවියේ කිතුනු අනුලකුණ

පසුගිය සතියෙන්

### මර්සලීනු ජයකොඩි පියතුමා



පල්ලියේ ගීතිකාවට පසු කලෙක හැරුණේ මර්සලීනු ජයකොඩි පියතුමන්ගේ උතුරා යන කවීත්වය යි. එබැවින් එතුමන් විසින් විරචිත, අද බොහෝ විට අප ගීතිකා ලෙස ගයන බොහෝ නිර්මාණ කිතුනු කවි මිස ඇත්තෙන් ම කතෝලික ගීතිකා ලෙසම ප්‍රබන්ධය නොවූ බව මගේ ස්ථාවරයයි. කවිය සහ ගීතය යනු එකම නොවේ. ඒවා වෙනස් අනන්‍යතාවයන්ගෙන් සමන්විතය. එහෙත් කවි සඳෙස් සහිත ගී ද, ගී විරිතේ කවි ද නැතිවා නොවේ. සාන්ත රසත්, සුගම බසත්, මියුරු සරත් කැටි කළ පහත සඳහන් නිර්මාණවල ඉස්මතු වන්නේ ඒ කවිත්වය මැ යි.

"රොනට වදින බිඟු ඔබයි - කැකුළු මල මම යි
මලට සුවඳ ටික ඔබයි - සිඟිති පෙති මමයි
විලට වසින පිණි ඔබ යි - පද්මිණිය මම යි
සුළඟ සලන සිරි ඔබයි - ලලිතිණිය මමයි"

"මල් සුවඳේ නැගලා - එම් මම ඔබව සොයා
තරුවැල් බැඳගෙන - ඉරහඳ ඇදගෙන
බබලා ඔබව සොයා

මීදුම හා මුසුවී - එම් මම ඔබව සොයා
එතු මී වදයේ - පැණි ගෙන උදයේ
එම් මම ඔබව සොයා"

"දවසක දූවිලි පසට හැරේ - පස ද ගලට පෙරැලේ
දවසක් ගලකින් මැණික් සැදේ - දහමේ සිරිත මෙයයි
දූවිල්ලෙන් මැණිකක් සෑදේ - මඩෙන් නෙළුම් මතු වේ
බෙලි කටුවෙන් මුතුවක් සෑදේ - කටු අග මල් පිබිදේ"

"පැණිබර වන මල් අතුමිණි දැදිරිව පිනිබර හිමිදිරියේ
මල් ලොව රැජිණිය ඔබ බව පවසයි ලෝක දයාබරියේ
මිහිකත වටකොට සත්මහ සමුදුර සෝදන දියසරියේ
ඔබමය රැජිණිය ඔබමය රැජිණිය ඔබමය මව් මරියේ"

"ලිලිය සේය බොහො සේය - ඔබ දිසේය මරියනී
සෙවන සේය ඔබ කුසේය - දෙව් වෙසේය මරියනී
නමෝ මරිය බොඅදරිය ම කුමරිය මරියනී
සෑම සිරිය ඔබ පිරීය පෙම්බරීය මරියනි"

"නෙළුම් පිපීලා පෙති විසිරීලා ජලය සුවඳ වෙන්නා
මමත් මලක් නම් පිපී සුවඳ දී ඔබ ළඟ පරවෙන්නා
කාන්ති කුමරියෙනි - නාද මිහිරියෙනි
සාන්ත සුසිලියෙනි - දේව දියණියෙනි
සීල සිතුම්ණෙනි - රූප සිරිනියෙනි
දම්ම කිරුලෙනි දිසි දිසි බබලන - රමණිය සිළුම්ණෙනි"

"සුවඳ සැවැන්දන කුංකුම චන්දන අෑ හැම සුවඳ නෙලා
කුරුඳු කඩාගෙන සුවඳ ලාටු ගෙන මුසුකොට සුවඳ සලා
පටපිලි ඇතිරිලි දමමින් සුදුවැලි කුඩුකළ කපුරු හලා
මුතු කුඩ අරගෙන ඔබ කැඳවා එමු හඬවා මිහිරි නලා"

කොළඹ යුගයේ කවියකු ලෙස ප්‍රකට මර්සලීනු ජයකොඩි කවි ඇදුරන් කවිත්වයෙන් නිර්මාණය කළ ඇතැම් රචනයන් ගීතිකා බවට පරිවර්තනය කිරීමේදී දෙවරක් සිතා බැලිය යුතු බව පවසන්නේ එතුමන්ගේ කවීත්වයට ඉන් අවැඩක් වන නිසා බව මා විශ්වාස කරන බැවින් මිස එතුමන්ගේ ප්‍රතිභාවට හෝ නිර්මාණශීලිත්වයට කිසි ලෙසකින්වත් අවමානයක් කිරීමේ අදහසින් නොවේ. හැඟුම්බර බව අතික්‍රමණය කර, කතෝලික ගීතිකාවේ අනන්‍යතාවය ගීයෙන් සහ කවියෙන් වෙන් කර හඳුනා ගනිමින්, සිංහල බසේ ඡන්දස, වෘත්තය වැනි දෑ පිළිබඳව කිසියම් අවබෝධයකින් කටයුතු කිරීම එවැනි ව්‍යායාමයක දී අත්‍යවශ්‍ය බව කිවමනා ය.

සිංහල චිත්‍රපට වංශකතාවේ සන්ධිස්ථානයක් ලෙස සැලකෙන "රේඛාව"ට මර්සලීනු ජයකොඩි පියතුමන් ලියූ ගී පද වැල් දෙකකින් එතුමන්ට පිදෙන මෙම කෙටි උපහාර සටහනට විරාමයක් තබමි. සුනිල් සාන්ත නම් වූ ඒ අසහාය කතෝලික සංගීතවේදියාගේ තනුවලින් පද වැලේ මාධුර්යය තියුණු වීම මේ නිර්මාණයන්ගේ ජනප්‍රියත්වයට තුඩු දුන් විශේෂ සාධකයක් බව ද සඳහන් කළ යුතුය.

"වෙසක් කැකුළු අතු අග ඉඳ නටන විලාසේ
ඉරෙත් හඳෙත් සිරි විඳ විඳ රඟන විලාසේ
පියලි සළාලා රේණු හළාලා
සුවඳ උරා සිසිල් සුළඟ හමන්නේ
ලොවම අවදිවෙමින් අමුතු පණක් ලබන්නේ

ඕලු නෙළුම් නෙරිය රඟාලා කිකිණි හඬන වලා නගාලා
ගඟුල් තොටිල්ලේ මල් ඇතිරිල්ලේ මගේ කුඩා ඔරුව හබල් ගා
යමු නැලැවිල්ලේ නැලැවිල්ලේ නැලැවිල්ලේ
ඇදී ඇදී යන්න නදී රිදී තොටිල්ලේ

## වෙනත් කතෝලික කවි නිර්මාණකරුවන්

මේ අංශය පිළිබඳ අප යොමු කර ඇති අවධානය ප්‍රමාණවත් නැත. කතෝලික කවියන් විසින් නිර්මාණය කැරුණු අප්‍රකට කවි රචනා බොහෝ ඇත. ඒවා අප්‍රකට වුව ද සැබැවින් ම ප්‍රශංසා කටයුතුය. එවන් නිදසුන් දෙකක් පිළිබඳව පමණක් සටහන් කරමි.

☛ ඉදිරියට

✍ **ගරු සිසිල් ජෝයි පියතුමා**

(කොළඹ හා. ජුසේවාස් දේව ධර්ම නිකේතනයේ දස වැනි උපාධි ප්‍රදානෝත්සවය "විද්වත් සමාස දෙසුම")

# නූතන සමාජ අභියෝග හමුවේ කිතුනු ජීවිතය කොයිබට ද?

පසුගිය සතියෙන්...

කතෝලික සභා පිළිවෙතට පිටුපාමින් සමලිංගික විවාහය ඉල්ලා සිටීමද, දික්කසාදය නීතිගත කිරීමද, බහු භාර්යා සේවනය නීතිගත කිරීමට ඇතැම් රටවල් පෙළඹීමද, ගබ්සාව නීතිගත කිරීමට සැරසීම ද අපගේ කිතුනු පැවැත්මට එල්ලවන තවත් අභියෝගයකි.

ගණිකා වෘත්තිය සමාජ අවශ්‍යතාවයක් සේ සලකා ඇතැම් රටවල් එය නීතිගත කිරීම ද, කෘතිම උපත් පාලන ක්‍රමයන්ට අඹු - සැමියන් යොමු කිරීම ද, පවුල් ජීවිතයට එල්ල වූ තවත් පීඩනයකි. පවුල් සංස්ථාව බිඳ වැටීමත්, ආදරය නොලැබීම හේතුවෙන් අයාලේ යන දරුවන්ගේ හෙට දිනය ද අඳුරට යොමුවීම වැළැක්විය නොහැකිය. අසභ්‍ය චිත්‍රපට මෙන්ම අසභ්‍ය පින්තූර හා පොත පත වෙන කවරදාටත් වඩා සමාජගතව පැවතීම හා විද්‍යුත් මෙවලම් ඔස්සේ දකින අසභ්‍ය රූප රාමු තුළින් ඇතිවන රාගාධික හැඟීම් නිසා, දෙමාපිය, දූ පුතුන්ගේ මනස විකෘති වීමත් පිය සෙනෙහස, මව් සෙනෙහස හා දරු සෙනෙහස අහිමි වී ගොස් වැඩිහිටියන් හා දරුවන් පාපතර අවස්ථාවන්ට යොමුවීමත් නිතර නිතර අසන්නට දකින්නට ලැබීමද අභාග්‍ය සම්පන්න තත්ත්වයකි. මුද්‍රිත මාධ්‍ය හා විද්‍යුත් මාධ්‍ය ඔස්සේ අප ඇතැම් දේ දකින අතර, නොඇසෙන්නට, නොදැනෙන්නට රහසිගතව සමාජය තුළ බොහෝ දේ වැළලෙන අවස්ථා ද ඇත.

කිතුනු ජීවිතය හා සාමාන්‍ය සමාජය යන්න දෙකක් නොව එකම කාසියේ දෙපැත්ත ලෙස අප පිළිගත යුතුය. කිතුනුවාට සමාජයෙන් වෙන්ව සිටීමට හෝ වසන්ව සිටීමට නොහැකිය. එදිනෙදා සිදුවීම් තුළ ඔහු ජීවත්ව සිටිය යුතුය. කිතුනුවා යන්න දෙවිඳුන්ගෙන් වරප්‍රසාද ලත් අයෙකු බවද අප අමතක නොකළ යුතුය. සැමවිටම සැම මොහොතෙම අපගේ කේන්ද්‍රස්ථානය විය යුත්තේ හා කරගත යුත්තේ ජීවමාන දෙවියන් වහන්සේය. අද මෙන්ම එදා සමාජය තුළද කිතුනුවා ජීවත් වූයේ අභියෝග හා බලපෑම් සමඟ ගැටෙමිනි.

දේශපාලනය හා ආර්ථික විෂමතාවය ද නූතන අප මුහුණ දෙන අභියෝගයකි. සෑම දේම දේශපාලනීයකරණය වීම ජනතාවට පීඩාවකි. බොරුව, අල්ලස, දූෂණය හා වංචාව සමාජගත වීම නිසා ජනතාව ඉමහත් දුෂ්කරතාවයනට මුහුණ දෙනු ලබයි. දේශපාලනය ජනතා සේවයක් ලෙස පැවතුනද අද එය මුදල් උපයන මාර්ග යක් බවට පත්ව ඇත. ඉහළ යන ජීවන වියදම ජනතාව ඉමහත් ඉවසීමකින් දරා සිටී. ආර්ථික අමාරුකම් නිසාම අද ජනතාව යොමුව සිටින්නේ දූෂිත ජීවන මාර්ග යන්ටය. සුරාව හා සූදුව ඔඩු දුවා ඇති පිළිලයන් සේය. මත්කුඩු ජාවාරම ද අත මිට මුදල් ගැවසෙන ව්‍යාපාරයක් වීම නිසා සමාජයේ පහළ පෙළේ පුද්ගලයින් මේ සඳහා යොමුව ඇත. නගරයක් ගමක් පාසා ගෙස්ට් හවුස් (කාමර පහසුකම්) ඇත. කිතුනු ප්‍රදේශවල ද නැත්තේ නොවේ. කිතුනුවන් ද මේ සඳහා යොමුව ඇත. මෙලොව ජීවත්වීම තම අරමුණ කරගත් මිනිසා, ආධ්‍යාත්මික ජීවිතය පසෙක තබා ලෞකික ජීවිතයටම ඇලුම් වීම තවත් අභියෝගයකි.

☛ ලබන සතියට

✍ **රංජිත් නෝනිස්**
නාගොඩ

# ඉස්ලාමීය මූලධර්මවාදය පරාජය කිරීම සඳහා සමස්ත ලෝකයම ඒකරාශී විය යුතුය

පසුගිය සතියෙන්

ඉස්ලාමීය ත්‍රස්තවාදය තීරණාත්මක ලෙස පරාජය කිරීමෙන් සුවිශාලම වාසිය සැලසෙන්නේ සැබෑ මුස්ලිම් භක්තිකයන්ටය. සැබෑ ඉස්ලාම් දහම කුමක් ද යන්න සමස්ත ලෝකයටම පෙන්නුම් කිරීමට එමගින් ඔවුන්ට අනගි අවස්ථාවක් ලැබේ. සැබෑ ඉස්ලාම් දහම කුමක් ද යන්න සමස්ත ලෝකයටම හඳුනා ගැනීමට එවිට අවස්ථාවක් සැලසේ.

ඉස්ලාමීය ත්‍රස්තවාදය නිසා දීර්ඝ කාලීන ලෙස වැඩියෙන්ම පීඩා විඳීමට, දුක් විඳීමට සිදු වන්නේ මුස්ලිම් බැතිමතුන්ටය. ඉස්ලාමීය ත්‍රස්තවාදය දිගින් දිගටම පැවතුනහොත්, සාමකාමී මුස්ලිම් බැතිමතුන් පවා කොන් වීමකට, හුදෙකලා වීමකට ලක් විය හැකිය. මුස්ලිම් නොවන ජන කොටස් මුස්ලිම් ජනතාව දෙස දිගින් දිගටම සැකයෙන්, අප්‍රසන්නතාවයෙන්, තරහවෙන්, කලකිරීමෙන් සහ වෛරයෙන් බැලීමට පෙළඹිය හැකිය. එම නිසා සාමකාමී, අහිංසක මුස්ලිම් ජනතාවට විශාල අර්බුදකාරී තත්ත්වයකට , ගැටුම්කාරි තත්වයකට, පීඩාකාරී තත්ත්වයකට මුහුණ දීමට සිදුවේ.

එමගින් ප්‍රශ්න විසඳෙනවා වෙනුවට තව තවත් උග්‍ර විය හැකිය.

මුස්ලිම් ජනතාවට ලැබිය යුතු සෑම සාධාරණ අයිතිවාසිකමක්ම ඔවුන්ට අනිවාර්යයෙන්ම ලබා දිය යුතු වේ. ඔවුන්ට කිසිදු අසාධාරණයක්, අයුක්තියක්, කොන් කිරීමක්, පීඩාවක් නොවීමට වග බලා ගත යුතු වේ. එමෙන්ම ඔවුන්ගේ සෑම සාධාරණ අයිතිවාසිකමක් වෙනුවෙන්ම හඬක් නැගීම මුස්ලිම් නොවන ජනතාවගේ ද වගකීම විය යුතු වේ.

මුස්ලිම් ජනතාවගේ අයිතිවාසිකම් උල්ලංඝනය කරන්නා අනෙක් ජන කොටස් වල අයිතිවාසිකම් ද උල්ලංඝනය කරයි. මුස්ලිම් ජනතාවට ගරු නොකරන්නා, අනෙක් ජන කොටස් වලට ද ගරු නොකරයි. මුස්ලිම් ජනතාවට පීඩා කරන්නා, හිංසා කරන්නා, අනෙක් ජන කොටස් වලට ද පීඩා කරයි. හිංසා කරයි.

මුස්ලිම් ජනතාවගේ අයිතිවාසිකම් වෙනුවෙන් සැබවින්ම පෙනී සිටින්නා අනෙක් ජනකොටස් වෙනුවෙන් ද සැබෑ ලෙසම පෙනී සිටියි. මුස්ලිම් ජනතාවට සැබැවින්ම ගරු කරන්නා අනෙක් ජන කොටස් වලට ද සැබැවින්ම ගරු කරයි. මුස්ලිම් ජනතාවට සැබවින්ම ආදරය කරන්නා සහ සේවය කරන්නා අනෙක් ජන කොටස් වලට ද සැබවින්ම ආදරය කරයි, සේවය කරයි.

සමස්ත මානව සංහතියම එකම පවුලකි. එම පවුලේ එක සාමාජිකයකුට කරන පීඩාව සමස්ත මානව පවුලටම කරන පීඩාවකි. එම පවුලේ එක සාමාජිකයකුව රැක බලා ගැනීම, සමස්තමානව පවුලම රැක බලා ගැනීමකි.

මැද පෙරදිග රටවලට සේවය කිරීම සඳහා යන ලාංකිකයන්ට මුහුණ පෑමට සිදුවන තාඩන පීඩන, හිංසාකාරී අත්දැකීම්, අයුක්තීන් සහ අසාධාරණයන් ද තරයේ හෙළා දැකිය යුතු වේ. එහිදී බොහෝ ලාංකිකයන්ට තමන්ගේ ජීවිත අහිමි වුණු අවස්ථාවන් ද එමට ඇත. මැද පෙරදිග මුස්ලිම් රටවල සිදුවන මෙම මානව විරෝධී කටයුතු සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ වාසය කරන මුස්ලිම් ජනතාව පවා හඬක් නැගිය යුතු වේ.

මුස්ලිම් නොවන පුද්ගලයන්ගේ ද අයිතීන් වෙනුවෙන් පෙනී සිටින මුස්ලිම්වරයා සැබෑ මුස්ලිම්වරයෙකි. බෞද්ධ නොවන පුද්ගලයන්ගේ ද අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටින බෞද්ධයා සැබෑ බෞද්ධයෙකි. හින්දු නොවන ජන කොටස් වෙනුවෙන් ද පෙනී සිටින හින්දු බැතිමතා සැබෑ හින්දුවරයෙකි. කිතුනු නොවන ජන කණ්ඩායම් වලට ද ආශිර්වාදයක් වන කිතුනුවා සැබෑ කිතුනුවෙකි.

තමා අයිති දහමේ ගුණාත්මකභාවය තීරණය වන්නේ තමා අනෙකුත් ජන කොටස් වලට ආශිර්වාදයක්, ආලෝකයක්, ආදර්ශයක් වන ප්‍රමාණයටය. සැබෑ කිතුනුවෙක් සැබෑ හින්දු බැතිමතෙක්, සැබෑ බෞද්ධයෙක්, සැබෑ මුස්ලිම්වරයෙක් අන්‍යයන්ට ද ආදරය කරන ප්‍රමාණයට, සේවය කරන ප්‍රමාණයට ද ඔහු හෝ ඇය තමා අයිති දහමට ගෞරවය ළඟා කර දෙයි. තමා අයිති දහම ලෝකය පුරා බබළවයි. අනෙකුත් පුද්ගලයන් තුළ තමා අයිති දහම පිළිබඳව පැහැදීමක් ඇති කරවයි.

මූලධර්මවාදියා තමා අයිති දහම විනාශ කරන්නෙකි. ඉස්ලාම් දහමට වර්තමානයේ ඇති ප්‍රබලතම තර්ජනය නම් බටහිර රටවල් හෝ ඇමරිකා එක්සත් ජනපදය හෝ ක්‍රිස්තියානි දහම හෝ නොව, ඉස්ලාම් මූලධර්ම වාදයයි. ඉස්ලාමීය මූලධර්මවාදීන් විසින් ඉස්ලාම් දහම විනාශ කර දමමින් සිටියි. ඉස්ලාම් දහම ලෝකය ඉදිරියේ පිළිකුලට ලක් කරමින් සිටියි. ඉස්ලාම් දහම අගෞරවයට ලක් කරමින් සිටින්නේ වෙන කිසිම බලවේගයක් නොව ඉස්ලාමීය මූලධර්මවාදීන් විසින් ය.

මෙම කාරණය සම්බන්ධයෙන් සමස්ත මුස්ලිම් ලෝකයම අවදි විය යුතු කාලය පැමිණ ඇත. නිද්‍රාශීලිත්වය ස්වයං විනාශයේ දොරටුවයි.

☛ ලබන සතියට

✍ **මහාචාර්ය ඇන්ටන් මීමන**

විශේෂාංග

# දරුවන් සුරකින සමාජයක්



සමාජ සංවර්ධනයෙ හොඳම දර්ශකය ළමා යහපැවැත්මයි. යම් රටක ළමුන්ගෙ යහ පැවැත්ම පිළිබඳ අහිතකර තත්ත්වයක් පවතීද, එම රට සැළකිය යුත්තෙ ඌන සංවර්ධිත රටක් ලෙසින. ළමා යහපැවැත්ම තහවුරු වීමට නම්. ඒ සඳහා වූ අභිලාශයන් සාර්ථකව සාක්ෂාත් කරගත යුතුය.

දැනට පිළිගෙන ඇති ළමා යහපැවැත්මෙ අභිලාෂයන් කෙරෙහි අවධානය යොමුකරන විට, එම අභිලාශයන් මෙසේ පෙළගැස්විය හැක.

- නිරෝගි සුවය අත්විඳින දරුවන්
- දිවි පැවැත්ම සඳහා දැන උගත් දරුවන්
- දේව ආදරය අත්විඳිමින්, ආදරය, සෙනෙහස අත්විඳින දරුවන්
- හොඳින් රැකබලාගනු ලබන දරුවන්

මෙම අභිලාශයන් මුදුන්පත්කර ගැනීමේ වගකීම පැවරී ඇත්තෙ වැඩිහිටි සමාජයටය. මේ සඳහා අදාල සමාජීය, ආර්ථික, ආගමික සහ දේශපාලනික ව්‍යුහයන් නිර්මාණය කරමින්. එම ව්‍යුහයන් කාර්යක්ෂමව සහ සඵලමත්ව කාර්ය සාධානයෙ යෙදවීම අප මත පැවරෙන සමාජ වගකීමකි. දරුවන්ගෙ පැත්තෙන් ඔවුනට හිමිවිය යුතු අයිතිවාසිකමකි. කෙසේ වුවද අද අපේ දරුවන් බොහොදුරට අනාරක්ෂිත තත්ත්වයකට පත්වෙමින් සිටින බව නිතර, නිතර අසන්නට ලැබෙන, දැනගන්නට ලැබෙන පුවත්වලින් පැහැදිලිය. මේ සඳහා විමසිල්ලක යෙදීම අපේ වගකීමකි, යුතුකමකි. ගොඩනැගෙමින් පවතින මේ අනාරක්ෂිත බව, සමස්ත සමාජයේම පැවැත්මට තර්ජනයකි. ආගමික සහ සිවිල් සමාජය හෘද සාක්ෂි ගත අවබෝධයකින් ක්‍රියා කළ යුතු කාලය එළඹ ඇත.

## අනාරක්ෂිත තත්ත්වය

ළමා අනාරක්ෂිත තත්ත්වය පිළිබඳ කරන ලද අධ්‍යයනයකදී එම තත්ත්වය වර්ග දහතුනකට (13) වර්ග කර ගෙන ඇත. එමෙන්ම එම අනාරක්ෂිත තත්ත්වයන් තුළ උල්ලංඝනය වන ළමා හිමිකම්ද හඳුනාගෙන ඇත. දැනට වඩාත්ම අනාරක්ෂිත බවෙන් පෙළෙන දරුවන් අපේ රට තුළ මෙලෙස හඳුනාගෙන ඇත.

- දිළිඳු බව නිසා අනාරක්ෂිත වන දරුවන්
- මව්පියන්ගෙ රැකවරණය හීන දරුවන්
- ගෘහස්ත ප්‍රචණ්ඩත්වයට ගොදුරුවන දරුවන් (අපයෝජනය, සූරාකෑම)
- දැඩි අවදානම් සහිත හුරුපුරුදු වලට ඇබ්බැහිවීමට ඉඩ ඇති දරුවන්.
- ආබාධිත තත්ත්වයෙන් පෙළෙන දරුවන්.
- රෝගාබාධ වලින් පෙළෙන දරුවන්.

මේ සෑම තත්ත්වයකදීම සිදුවනුයේ ළමා හිමිකම් උල්ලංඝනය කිරීමකි. මෙලෙස ළමුන් අනාරක්ෂිත කරන එයට ඉඩදෙන වැඩිහිටි සමාජයට ළමුන් වෙනුවෙන් ‘වසරකට වරක් ළමා දිනයක්’ පැවැත්වීමට ඇති අයිතිය කුමක්ද? මෙම අනාරක්ෂිත තත්ත්වයට හේතු කාරක වන සමාජ, දේශපාලන හේතුන් විග්‍රහකිරීමෙන්, දරුවන් සුරක්ෂිත කරන සමාජයක් ගොඩනැගීමට ඉවහල්වන සුදුසු ප්‍රතිචාරයන්, මැදිහත්වීම් නිර්මානය කරමින්. ක්‍රියාත්මක කළ හැකිවනු ඇත.

## පවුල් පරිසරය

ළමා මිතුරු පවුල් පරිසරයක් බොහොදුරට පවුල තුළ නැතිවනුයේ පවුලක් ලෙස ඒකාග්‍රව සිතා පවුලේ පූර්ණ සංවර්ධන දැක්මක් ගොඩනැගීමට නොහැකිවී තිබීමය. මෙයට මූලික හේතුව වනුයේ ‘පවුල් ජීවිතය’ පිළිබඳ නිවැරැදි අධ්‍යාපනයක් නොලබා විවාහ ජීවිතයට ඇතුළුවීමය. පවුල තුළ දරුවා අත්විඳිය යුතු ළමා කාලය ඔහුගෙන්, ඇයගෙන් පැහැර ගනුයේ පැහැදිළි දැක්මක්, අරමුණක් නැතිව අම්මා සහ තාත්තා එක වහලක් යට වෙන වෙනම අරමුණු ඇතිව ජීවත්වීමය. පවුලක හර පද්ධතිය පදනම් වනුයේ එම පවුලෙ ආධ්‍යාත්මික ප්‍රතිපදාව අනුවය. අද බොහො පවුල්වල ආධ්‍යාත්මික ප්‍රතිපදාවන් සෝදාපාළුවට යමින් පවති.

මේ සෝදාපාළුව අන්කිසිවක් නොව සාමුහිකත්වය පළවා හරිමින් පුද්ගලත්වය මතුකරන සමාජ - ආර්ථික ප්‍රවාහයයි. මේ ප්‍රවාහයෙ ප්‍රභවය වෙළෙඳපොළ ආර්ථිකයයි. එදා ජීවිතයෙ නිවැරැදි පැවත්මට යා යුතු දිසාවෙ මග පෙන්වූයේ ධර්මය මත පදනම් වූ ආගමයි. අද ආගමික ආයතන පවා වෙළෙඳපොළ ග්‍රහණයට හසුවෙමින් පවතින බව නොරහසකි. ‘වෙළෙඳපොල’ අදහන ජනතාවකට යා යුතු නිවැරදි දිසාව පෙන්වීමට ආගමික සංස්ථාවනට නොහැකි වනුයේ එම සංස්ථාවල පැවැතිය යුතු ආධ්‍යාත්මික ප්‍රතිපදාවන් ඒවායෙ පැවැත්මෙන් සාක්ෂි දැරීමට අපොහොසත්වීම නිසාය.

## සමාජ පරිසරය

පූජනීයවූ ලිංගිකත්වය, දරුවන්ගෙ අහිංසකත්වය, අධිකරණයේ ස්වාධීනත්වය, දේශපාලනයෙ ගෞරවනීයත්වය, අධ්‍යාපනයෙ නිවහල්බව යන සියල්ල අද කණපිට පෙරළෙමින් පවති. ලිංගිකත්වය වෙන්දේසියෙ දමන දරුවන්ගෙ අහිසංකත්වය අපයෝජනය කරන, අධිකරණය දේශපාලනීය කරන අධ්‍යාපනය වෙළෙඳ භාණ්ඩයක්වීම යන මේ සියලුම අයහපත් දූෂිත තත්ත්වයන් පවතින සමාජයක දරුවන් අනාරක්ෂිත වීම පුදුමයක් නොවේ. මේ තත්ත්වය පිටුදකිමින් ළමුන්ට සුරක්ෂිත සමාජයක් ගොඩනැගීමේ අභියෝගයට අද අපි මුහුණ දී සිටිමු.

## වෙනස

ඉහත කී සමාජ ව්‍යසනය පිළිබඳ විග්‍රහයක යෙදෙන නීතිඥ බැසිල් ප්‍රනාන්දුගෙ විග්‍රහය මෙහිදී අපට උපකාරි විය හැක. කෙනෙකුට තමන් පිළිබඳව මෙන්ම සමාජයකට එම සමාජය පිළිබඳව ඇතිවන අවබෝධයේදී තමන්ට යම් අඩුපාඩු ඇතැයි හඳුනා ගැනීම පටන් ගත්විට එම අවබෝධය යටපත් කොට වෙනත් මවා පෑමක් කිරිම යනු කුහකත්වයයි. ඇත්ත එළිදරව් කිරීමට වඩා බොරු ප්‍රතිරූපයක් මවා ගැනීම තමන් යොමුවී සිටින තරගයකදී වැඩි ප්‍රතිලාභ ගත හැකි උපක්‍රම යැයි ඇතිවන අවබෝධය තුළින් බොහොවිට බොරු නිර්මාණය වීම සිදුවේ. කෙටි කාලීනව මෙවැනි ප්‍රතිලාභ ලබාගත හැකි වුවත්, මෙවැනි මවාපෑම් තුළ පුද්ගලයා පිළිබඳ මෙන්ම සමාජයක් සම්බන්ධවද අතිවිශාල වූ විනාශකාරී තත්ත්වයක් ඇතිවීම වැළැක්විය නොහැක..... සමාජ ව්‍යසනයකින් එළියට ඒමට විසඳුමක් නොපෙනෙන තරමට යම් මවා පෑමක් කරගැනීම තුළින් එවැනි ව්‍යසනයක් ඇත්තටම නැතැයි කියා තමාගෙ හිත හදා ගැනීමටද වෙනත් අයගේ මතයන් ඒ ආකාරයටම හැඩ ගැස්වීමටද නෛසර්ගික නැඹුරුවීමක් සිදුවේ.” හුදකලා මැදිහත්වීම් තුළින් ළමුන්ගෙ අනාරක්ෂිත තත්ත්වය පිටුදැකිය නොහැක. සමාජ ව්‍යසනයක ගොදුරු බවට පත්වන දරුවන් ආරක්ෂාකර ගැනීමට මුළු මහත් සමාජයම දරුවන්ට සුරක්ෂිත විය යුතුය.

අපේ මේ රටට සෑදී ඇති රෝගය පරිමාව තේරුම් නොගැනීම, ඊට විසඳුම් සෙවීමට පවතින මහත්ම බාධකය බව නීතිඥ බැසිල් ප්‍රනාන්දුගෙ වැටහීමයි. මේ රෝගි සමාජය සුවපත් කිරීමට අපි මවාපෑම්වලින් තොරව සත්‍යයට සාක්ෂිදරමු. සත්‍යය ජීවත්කරවමු. වෙස් මුහුණු ගලවා සැබෑව දක්වමු. දරුවන්ට සුරක්ෂිත සමාජයක් ගොඩනගමු.

**වි. ලෙ. පීරිස්**

# ගිනි අව්වේ ලේ බොන කතරේ උමතු වවුලන් වනසමු






ශිෂ්ට මනුෂ්‍යත්වයට නිගාදෙමින් අතීතයේ තිරිසන් ගති ඇත්තවුනට මිනිස්කම හා දහම කියා දුන් ලොව ශ්‍රේෂ්ඨ ආගම් හි ආගම් කතුවරු පැතුරූ දහමකට අභියෝග කරමින් - එම ලබ්ධිකයනට භීතිය පමණක් නොව පීඩාකාරිව මරණය ලඟා කරදෙමින්, ලෝ වැසි ජනතාවට අභියෝගයක් වෙමින් මැදපෙර දිගින් - ව්‍යාප්ත වී යන - දැඩි ඉස්ලාමීය මතධාරි දෙපා මුරුගයන්ගේ අභියෝගය අරාබිකරයට හෝ ඕස්ට්‍රේලියාවට පමණක් සීමාවූවක් නොව සමස්ත ලෝ වාසි කිතුනු ජනතාවටත් තර්ජනයක් ලෙසින් අපද භාරගත යුතුව ඇත.

හව්හරණක් නැතිව - අනාථයන් ලෙසින් යුරෝපා රටවලට මෙන්ම එවැනි රටවලට පෙරදිගින් සංක්‍රමණය වී කිතු ඉගැන්වීමේ හරයක් වූ ප්‍රජාතන්ත්‍ර නීතිය අනුව රැකවරණ ලබා එම දේශවල සම්පත් ප්‍රයෝජනයට ගනිමින් දැන උගත් කම් ශිල්ප ඥානය පමණක් නොව ධනයද රැස්කරගත් මෙම මුසල්සානුවෝ ඔවුන්ගේ දරු මුණු මුණුබුරන්ව ඉහත කී තිරිසන් ව්‍යාපාරයේ උන්නතිය උදෙසා යළි මැද පෙරදිගට එවීම තුළින්ම ‘කන්නට දුන් අත සපා කන’ ‘පරහට දයාව නොහඳුනන’ උමතු උන්මාදයක්ම ජානගතවී ඇති මෙම වර්ගයාගේ තත්ත්වය තේරුම් ගත හැකිය. තමනට සෙවන දුන් දේශවලින්ම පැමිණ මහජන සේවය වෙනුවෙන් කැපවූ ජනමාධ්‍යකරුවන් සහන සේවකයන් තිරිසන් අයුරින් මරා දැමීම ම එයට හොඳම සාක්ෂියකි.

ඔවුන් මරා දමන්නේ ක්‍රිස්තියානින්ම පමණක් නොවේ. තමන්ගේ මතය නොඉවසන අන් මුස්ලිම් නිකායවල අයවද මරාදමති. දේපොල කොල්ල කති. ක්‍රිස්තියානි ජනයාට මුස්ලිම් ආගම වැළඳගන්නට පැය දොලහක් හෝ විසිහතරක් දෙති. අනතුරුව එසේ නොමැති අය වධදී මරා දමති.

අපිද කිතුනුවන් වෙමු. අපද මෙම දේශයේ මහ ජාතියේම කොටසක් වූ මුත් ආගමික වශයෙන් සුළුතරයක්මය. එසේම මුසල්මානුවෝද මෙම දේශයේ සුළුතරයක් නිසා අපට ‘ISIS’ තර්ජනයක් නැතැයි සිතා අපි නිහඬව් සිටිමු. යම් හෙයකින් අප දිවයිනේද බහුතරය මුස්ලිම් වූවානම් ‘ISIS’ ම අවැසි නැත. අසල්වැසි පාකිස්ථානයේ කිතුනුවන් අත්විඳින දුක අපටත් විඳින්නට සිදුවනු ඇත.

එවන් තත්ත්වයක් තුළ මා අත්දකින්නේ නම් ලංකාවේ මුසල්මානුවා අහිංසක සාධාරණ කියා නම් නොවේ. බහුතරයක් නොවූ ඔවුනට හිස ඔසවන්නට බැරිවීම පමණකි. ‘ජිහාඩ්’ නම් ආගමීක ව්‍යාපාරයක් ‘ISIS’ හා බැඳී ඇතැයි කියනු ලැබේ.

එවැනි ‘ජිහාඩ්’ පාක්ෂිකයන් ලංකාවේත්! ලංකාවේ නැතැයි කියන්නට කාටවත් හැකියාවක් නැත. LTTE යුධ සමයේ එම ව්‍යාපාරයක් නැගෙනහිර ප්‍රදේශවල සංවිධානය වී සිටියේ යයිද අසා ඇත.

එවන් පසුබිමේ මිහිමත කිතුනුකම වෙනුවෙන් දිවි පුදන පීඩා විඳින කෙලෙසෙන කිතුනු ජනතාව වෙනුවෙන් අප අපේ හඬ යුද්ධයෙන් බැරිසඳ ‘ක්‍රියාවෙන්’ එළිදැක්විය යුතුය. ‘ඇසට ඇසක්ය’ රීතිය අවලංගු යයි කියා අසාධාරණයන්හිදී නිහඬ වීමද කිතුනු ඉගැන්වීමක් නොවේ. වෙනත් දේශවල මුස්ලිම් ප්‍රශ්නවලදී පවා සුළුතරයයැයි නොසිතා අප රටේ මුස්ලිම්වරු දේශපාලන බේදයෙන් තොරව එක්වෙති හඬ නගති, පෙලපාලියති, තැන තැන ගිනිගොඩවල් ගසති.

කිතුනු වූ අපි අපේ රටේ කිතුනු ප්‍රශ්නයකදී පවා එසේ ඒකරාශි නොවෙති. දේශපාලකයෝ නම් පළාතේ නොයති. ඒ ආගමට වඩා කිතුනු දේශපාලකයාට ඡන්දයත් පක්ෂයත් වැදගත් නිසාවන්නට ඇත. තත්ත්වය එසේනම් හිට්ලර්ගේ භීෂණයේදී ජුදා ජාතිකයන් නොවූ නිසා නොසලකා හැරි කොමියුනිස්ට් කාරයාටත් ක්‍රිස්තියානි කාරයාටත් වූදේම අපටත් සිදුවන දිනයක් එන බව අපද සිතේ තබාගත යුතුය.

**යූ. ඩී. ප්‍රැන්සිස් ඇන්ටනි**

දැල්වෙන පහන්

# අපේ යුගයේ සැබෑ ක්‍රිස්තු වරයෙක් දිවියෙන් සමුගනි



පමුණුගම ඇලෙන් එගොඩ බැතිමත් ආනපති කිතුනු පවුලක් වූ ලියෝ ජයමාන්න හා ජොස්ලින් ජයමාන්න දම්පතින්ට දාව 1944 මාර්තු මස 6 වන දින මෙලොව එළිය දුටු දොන් ජෝන් ක්‍රිස්ටෝපර් ගාමිණී ජයමාන්න මහතාට එක් වැඩිමහල් සහෝදරියක් ද වූයේය. කොළඹ කොටහේන ශාන්ත බෙනඩික් විද්‍යාලයේ දීප්තිමත් ශිෂ්‍යයකු ලෙස ඔහු අධ්‍යාපනය හැදෑරීය. 1969 දී පමුණුගම ඇලෙන්එගොඩ තවත් බැතිමත් කිතුනු පවුලක දියණියක වූ ගම මැදලියනගේ මාරි අයිලින් ශිරානි පෙරේරා මෙනවිය හා යුග දිවියට පිවිසියේය.

පුද්ගලික අංශයේ ශ්‍රී ලංකාවේ සුප්‍රසිද්ධ උසස් ආයතන කීපයක විධායක නිලතල දැරූ ගාමිණී මහතා සිය මැණියන්ගේ නැතිබැරි ජනතාවට සංවේදීව ඔවුන්ට සේවය කිරිම සඳහා පොදුජනතාව අතරට පැමිණි වින්සන්ද පෝල් දයාවේ සේවාව හරහා එහි නිලතල දරමින් ග්‍රාමීය පීඩිත ජනතාවට කළ අමිල සේවාව අනුගමනය කිරීමට සිය සිත ගත කැප කළේය.

1985 වසරේ පමුණුගම ප්‍රදේශයට හා අවට ප්‍රදේශවල නැතිබැරි අයට සේවය කිරිම සඳහා ඇති හැකි අය එක්කළ ජාත්‍යන්තර රොටරි සමාජය ගෙන ඒමට පුරෝගාමියා වු එතුමා පමුණුගම රොටරි සමාජයේ ආරම්භක සභාපති වරයාද වූයේය. පමුණුගම දෙව්මැඳුර ආසන්නයේ පිහිටි එතුමා සතු ඉඩමක්ද රොටරි සමාජයේ මූලස්ථානය ගොඩනැගීමට එතුමා පරිත්‍යාග කළේය. ප්‍රදේශයේ නැති බැරි අයට විවිධ ව්‍යාපෘති යටතේ විවිධ ආධාර උපකාර කිරීමට රොටරි සමාජ සමග එතුමා ද ඒකාබද්ධ වූයේය. උසස් අධ්‍යාපනය ලබන දරු දැරියන්ට පරිගණක තාක්ෂණය හා විවිධ විෂයන් නොමිලේ හැදෑරීමට හා ඔවුන්ට රැකියා අවස්ථා ලබාදීමටද රොටරි සමාජය හරහා එතුමාද පුරෝගාමි වූයේය.

දෙව්මැඳුර, ගරු පියවරු සහා ප්‍රධානින් සමග සමීප සබඳතාවයන් පවත්වමින් අවශ්‍ය විවිධ ප්‍රතිපාදන නිර්නාමිකව ලබාදීමට එතුමා නිතරම සූදානම්ව සිටියේය. වසර ගණනාවක සිට පමුණුගම මීසමේ පාලක පියවරුන්ට නොයෙක් අවස්ථාවල ආර්ථික උදව් උපකාරද ලබාදීමට නොමසුරුව පුරෝගාමීවු එතුමා ශ්‍රීලේ සමාගමේ ප්‍රබල පුරෝගාමියකු ලෙස ශ්‍රීලේ බැතිය පමුණුගම ගොඩනගා අඛණ්ඩව පවත්වා ගෙන යාමට හැම අයුරින්ම සිය පරිත්‍යාගයන් මුදා හැරීයේය.

පමුණුගම පමණක් නොව ලක්දිව නොයෙක් පළාත් වල කිතුනු දෙව්මැඳුරු වලට පූජක උතුමන්ලාට හා පැවිදි සොයුරියන්ට විවිධ අංශවලින් ආධාර උපකාර කළ එතුමා මාර්තු 15 මඩු මැණියන්ගේ පමුණුගම මංගල්‍ය හා සම්බන්ධව නොයෙක් ආකාරයේ ආධාර උපකාර කරමින් සිය දයා සේවාව දියත් කළේය. මඩු දේවස්ථානයේ නොයෙක් අංශයන් සඳහාද නිර්නාමිකව මහා පරිමානයේ ආධාර උපකාරද කළේය. ඊට සමීපතම සාධකය වූයේ මඩු මාතා දෙව්මැඳුර පාලක ගරු එමලියානුස් පිල්ලේ පියතුමා එතුමාගේ අභාවය දැනගත් විගසම එම රාත්‍රියේම මඩු දෙව්මැඳුරේ සිට ගාමිණී මහතාගේ නිවසට පැමින කඳුළු සලා පැය ගණනක් එතුමාගේ නිවසේ රැඳී සිටිමින් එතුමාට දැක්වු අවසන් ගෞරව උපහාරයය.

ප්‍රදේශයේ සියලු සමාජ සුබ සාධන සංවිධාන, පුන්‍ය ආයතන, මරණාධාර සමිති, ක්‍රීඩා සමිති, කලා සංවිධාන හා ඕනෑම සංවිධානයකට නොමසුරුව මහා පරිමානයෙන් ආධාර උපකාර කළ එතුමා ප්‍රදේශයේ නැතිබැරි පවුල් වලට හා නැතිබැරි අයට සිය ධන පරිත්‍යාගයන් මුදාහල අවස්ථා එමටය. සිය නිවසට පැමිණෙන නැතිබැරි සැමට ඇඟට දැනෙන උපකාරයක් කිරිම එතුමාගේ සතුට විය. සිය නිවසට පැමිණෙන වත්තේ මහා ගේට්ටුව නිතරම විවෘතව තබා ඇති එතුමා දුප්පත් පොහොසත් පංති කුළ භේදයෙන් තොරව ඕනෑම තැනකදී සාමාන්‍ය ජනතාව සිනා මුහුණින් පිළිගෙන සුව දුක් විමසීමට එතුමා නිතර ප්‍රිය වූයේය.

දෙව්මව් කෙරෙහි අපරිමිත භක්තියක් දැක්වු එතුමා ලෝකයේ විවිධ රටවල දෙව්මව් සිද්ධස්ථානවලට ගොස් රැගෙන එන ශුද්ධ වු පූජා භාණ්ඩ බැතිමතුන්ට බෙදා දෙමින් තෘප්තියක් ලැබුවේය. නිතරම විනෝදකාමි ලෙස සිය හිතවතුන් සමග සතුටු සම්චියේ යෙදීම ද එතුමා ප්‍රිය කළේය. සිය ධනය රැස්කර වස්තුවට ආදරය නොකළ එතුමා සිය සම්පත් බෙදාදෙමින් වස්තුවට වඩා දෙවිඳුන්ට ආදරය කළේය. එතුමාගේ නිවසට ඇතුළුවන වත්තේ කොටසක දර්ශණීය ආවරණයක් සහිත මණ්ඩපයක් ඉදිකර එතුමා බොස්නියාවේ මැජගෝරි ග්‍රාමයේ දෙව්මව් නිතර දර්ශනය වන ස්ථානය කරාගොස් එහි දර්ශණීය වූ මැජගෝරි දෙව්මව් රුවේ ප්‍රතිමාවක් එම රටෙන් රැගෙන විත් එම ස්ථානයේ තැන්පත් කර බැතිමතුනගේ ගෞරව ප්‍රණාමයට පූජා කළේය.

ධනයට බලයට නොව දෙවිඳුන්ට සේවය කළ ගාමිණී ජයමාන්න නම් පොදු ජනතාවට දහමට සංවේදිවු මහා ප්‍රේමයේ දානපතියාට, පමුණුගම කිතුනු පුරයේ දිදුලන පහන් තරුවක් වූ යුග පුරුෂයාණන්ට දේව රාජ්‍යයේ සදාතන උරුමය හිමිවේවා.

**ජෝ. සංගපාලආරච්චි**
**පමුණුගම**

# බුහුමන් ලැබූ ක්‍රිස්තු ශ්‍රාවක යුවල



තම ළමාවියේ සිට කතෝලික ආගමට නැඹුරු වී කුඩා කල සිටම දෙවිඳුන් තමන්ට දුන් තලෙන්තු වගකීම් අකුරට ඉෂ්ට කරන මෙම කිතුනුවා අද අපේ කථා නායකයා වෙයි. ඔහු නමින් සියල්ලන් දන්නා වින්ටන් ගුණසේකරය. මුලින්ම පියතුමාගේ පූජා සහයකයකු ලෙසින්ද, තරුණ සමිතියද නියෝජනය කරමින් එවකට මරිය හමුදාවේ තරුණ භට ප්‍රසිඩියම පටන් ගන්නා ලදි. මරිය හමුදාවේ අධ්‍යක්ෂ ගරු ස්ටැන්ලි ලාවුස් පියතුමාගේ උපදෙස් මත කොළඹ කොච්චිකඩේ විකෝෂ්ප දේව මාතාවන්ගේ දේවස්ථානයේ ශ්‍රී ලංකාවේ මරිය හමුදාවක් නොමැති මිසමක මරිය භටයන් එක් කළ යුතුයි" යන ඔහුගේ සිතේ හැඟීමක් ඇතිවිය.

පලමුවෙනි ප්‍රසීඩියම භටයන් 18 දෙනෙකුගෙන් පටන් ගෙන එය සාමාජිකයන් 70 ක් දක්වා ව්‍යාප්ත කර, එහි පළමුවන සංවත්සරය උත්සවාකාරයෙන් පැවැත්විණි. කොළඹ ඇක්වයිනස් උසස් අධ්‍යාපන ආයතනයේ උප අධිපති ගරු දර්ශන ජයවර්ධන පියතුමාගේ ප්‍රධානත්වයෙන් ද අගරදගුරු පදවි අනුශාසක ගරු ආනන්ද පුල්ලේ පියතුමාගේ ප්‍රධානත්වයෙන් ද යුතුව සත්ප්‍රසාද වන්දනාව අඳුරෙන් ආලෝකයට සර්වරාත්‍රික මහා පූජාවක්ද, එදින පවත්වන ලදි.

මරිය හමුදාවේ වසර 3 කට වඩා දීර්ඝ කාලයක් ගරු සභාපති. ප්‍රධාන සංවිධායක. ගරු ලේකම් සහ භාණ්ඩාගාරික වශයෙන්ද තනතුරු හොබවන ලදී. එවකට ගරු භාණ්ඩාගාරික ග්‍රෙගරි ජයන්ත පියතුමාගේ උපදෙස් පරිදි පළමුවරට මරිය හමුදා භට පෙරහරක් ඉතාමත් අර්ථවත්ව උත්සවාකාරයෙන් පවත්වන ලදි.

ප්‍රතිමා දර්ශනය ශුද්ධෝත්තම පිය ප්‍රකාශයට පත් කරන ලද දිනදි මත්තුමගල ශ්‍රී හෘදයේ දෙව් මැඳුරේ සියලුම මරිය හමුදාවන් එක් කොට ගරු පියතුමන්ලාගේ ප්‍රධානත්වයෙන් මහා සර්ව රාත්‍රි මෙහෙයන්ද පැවැත් විනි. මෙතුමා විසින් කතෝලික සංඝයට කරන ලද සේවා අගය කොට කොළඹ කොච්චිකඩේ සාන්ත අන්තෝනි මුනිඳුන්ගේ දෙව්මැඳුරේ සාන්ත අන්තෝනි සහෝදර සමිතියෙන් එම සමිතියට වසර 25 ක් කරන ලද සේවය සඳහා උපහාර සම්මානයක්ද පිරිනමන ලදි. එම සමිතියේ උප සභාපති, ගරු ලේකම් සහ සැම උසස් නිලයක්ම දරණ ලදි.

1977 පෙබරවාරි මස මැද පෙරදිග රැකියාවක් සඳහා ගිය වින්ටන් එහි සිටි කිතුනු ජනතාව කැප වීමකින් එක්රැස්කොට ඩුබායිහිද. ශ්‍රී ලාංකික කතෝලිකයන් සමග පළමු වරට සිංහල දිව්‍ය පූජාවක් සංවිධානය කරන ලදි. තවද මැද පෙරදිගදි 1994 සිට 2004 දක්වා සුවිශේෂවූ සේවාවන් රැසක් ඉටුකරන ලදි. තවද 1996 දි අතිඋතුම් වියානි ප්‍රනාන්දු රදගුරු හිමි අතින් දිව්‍ය පූජාවක් සංවිධානය කරන ලදි.

1997 ඩුබාහි ජබෙල් අලි කර්මාන්ත ශාලාවට ගොස් එම ආයතනය නිරීක්ෂණය කොට එහි සිටි ශ්‍රී ලාංකික සේවකයන්ගේ ප්‍රශ්න විසදා සුවදුක් විමසා ඔවුන්ට අවශ්‍ය ප්‍රතිකාර කොට බෙහෙත් හේත් පවා දෙන ලදි. 1998 දී පළමුවරට නත්තල් උත්සවයක් සංවිධානය කොට එහි සිටි ලමුන්ට තෑගි බෙදා දීමක් සංවිධානය කරන ලදි. එහි සිටි කතෝලිකයන් සමග එකතු වී ඇගලුම් කන්ටේනරයක් ශ්‍රී ලංකාවට අපනයනය කරන ලදි. ඩුබාහිදි ශාන්ත මරියා දේවස්ථානයේදී ලේ දන්දීමේ ව්‍යාපාරයක්ද එම දේවස්ථානයේදී පවත්වන ලදි. මෙම දේවස්ථානයේද පළමුවරට ගිහි පැවිදි නායකයන් තෝරා ගැනීම හා ලේ දන්දීමේ ව්‍යාපාරයක් පවත්වන ලදි. මෙම සියලුම කර්තව්‍යයන් කිරීම සඳහා සහය දුන් ගරු ඇන්ඩෘ පියතුමා, ගරු රයන් පියතුමා, ගරු ඇලෝසියස් පියතුමා සහ ගරු සිප්‍රයන් යන පියතුමන් කෘතවේදීව සිහිපත් කරයි.

වින්ටන් ගුණසේකරට සිය ආදරබර බිරිඳ හමුවූයේද තම තරුණ වයසේදි ඇය තම මීසමේ සංඝයන් සමග දේව මෙහෙයන් සංවිධානය කටයුතු සහ තරුණියන් වෙනුවෙන් එක් එක් වැඩමුළුවල සංවිධාන කටයුතු කරන ලද මොහොතකදිය. තම බිරිඳ සමග වසර 50 ක යුග දිවියට ශක්තිය සැමවිටම පිරිනැමුවේ දෙවිමහොත්තමයන් බව ඔහු සැම විටම පවසයි. සියබිරිඳ වන ඇන්ස්ටාද මට්ටක්කුලියේ එවකට සමිති සමාගම් කිහිපයකම නිලතල දැරූ අතර මට්ටක්කුලිය ශාන්ත මරියා දේවස්ථානයේ දැනටත් ශ්‍රී හෘද සමිතියේ ක්‍රියාකාරි සාමාජිකාවකි. දැනට වින්ටන් ගුණසේකර මහතා දේව සේවයට කැපවෙමින් කොටහේන ශාන්ත ලුසියා ආසන දෙව් මැඳුරේ සන්ක්‍රිස්තියන් වශයෙන් සේවය කරයි.

පසුගියදා මට්ටක්කුලියේ ශාන්ත මරියා දේවස්ථානයේ සිය දරු දැරියන්, මුණුබුරන් ඇතුලු බෑණාවරු සහ මිණිබිරියන් නෑදෑ හිත මිත්‍රාදින් සමග ඉතාමත්ම ගාම්භිරව අධ්‍යාත්මික වශයෙන් වසර 50 ක විවාහ සංවත්සර තුති පිදීමේ දිව්‍ය යාගය පවත්වන ලද්දේ විශ්‍රාමික අතිඋතුම් දේව ධර්මාචාර්ය ඔස්වල්ඩ් ගෝමිස් හිමිපාණන්ය. ගරු පියවරුන්, ගරු සහෝදර වරුන් සහ ගරු පැවිදි සොහොයුරියන් සහ කතෝලික බැතිමතුන් විශාල සංඛ්‍යාවක් මෙම තුති පිදීමේ දේව මෙහෙයට සහභාගි වූහ.

**මෝදර රනිල් රාජපක්ෂ**

# සමිඳු මෙහෙවර ඉටුකළ ඇය සුරලොව දිනුවාය

දියලගොඩ මීසමේ ඥානාර්ථ ප්‍රදීපය' පුවත් පත් නියෝජිතවරිය ලෙස වසර ගණනාවක් සිය දායකත්වය දෙමින් කටයුතු කළ එස්. ආනා ප්‍රනාන්දු මහත්මිය, වසර 87 ක් ආයු වළඳා පසුගියදා සගසුව දිනුවාය. දරුවන් 6 දෙනෙකුගේ ආදර්ශමත් මවක් වන එතුමිය, මුණුබුරු මිණිබිරියන් පමණක් නොව, මී මුණුබුරන්ගේද ආදරය දැක බලා ගැනීමේ වාසනාව ලැබුවාය.

දියලගොඩ හා මග්ගොන එකම මීසමක් ලෙස පැවති අවධියේ, 'ඥානාර්ථ ප්‍රදීප' පුවත් පත බෙදා හැරීමේ කාර්යයෙහි නියුතුවූ මග්ගොන මරිය හමුදාවේ ප්‍රබල සාමාජික වූ ෆොන්සේකා මහතාගේ අභාවයෙන් පසු 1985 වසරේ සිට ප්‍රදීප පුවත් පත බෙදා හැරීමේ සේවාව, දියලගොඩ ශ්‍රී හෘද සමිතිය විසින් බාරගන්නා ලද අතර, සියලුම වගකීම් දරමින් එම සේවාව ඉටුකරනු ලැබුවේ ආනා ප්‍රනාන්දු මහත්මියගේ මූලිකත්වයෙනි.


එදා සිට වසර ගණනාවක් දියලගොඩ මීසමේ ප්‍රදීප පුවත් පත අලෙවි කිරීමට මහත් උනන්දුවක්, උද්යෝගයක්, දැක්වු එතුමිය, ගතින් දුබල වුවද, සිතේ ශක්තියෙන් තම සේවය අකුරටම ඉටුකරමින් මාසයෙන් මාසය එහි අලෙවිය වැඩිකර ගන්නට සමත් වූවාය. පසුගිය වසරේ හදිසියේ අසනීපවු ඇය, එම කාර්යයභාරය සමිතියේ වෙනත් සාමාජිකාවකට පැවරුවාය. කළුතර දිසාවේ පැරණිතම දිව්‍ය හෘද සමිතිය වශයෙන් සැළකෙන දියලගොඩ සමිතිය, වසර 147 ක යටගියාවක් පෙන්නුම් කරයි. එම සමිතියේ වසර ගණනාවක් සභාපති ධූරය දැරූ එතුමිය, එම කාල පරිච්ඡේදය තුළදී සමිතියේ දියුණුව වෙනුවෙන් පරිත්‍යාගිශීලිව ඉටුකළ මෙහෙවර අමතක කළ නොහැක.

දියලගොඩ ශ්‍රී හෘද සමිතියේ වසර 57 සේවාවකට හිමිකම් කියන ආනා මහත්මිය, එහි සාමාජික සාමාජිකාවන්ට ආදරණීය මවක් ලෙස ගුරු හරුකම් දෙමින් සමිතියේ උන්නතිය වෙනුවෙන් කැපවු අයුරු සිය ක්‍රියාවෙන් පෙන්නුම් කළාය.

සැම වසරකම නොවැම්බර් මාසයේ මළවුන් වෙනුවෙන් කරනු ලබන පරිත්‍යාගය, තම සමිතියේ සාමාජිකාවන් සමග එකතුවී ළමා නිවාසයකට හෝ වැඩිහිටි නිවාසයකට ලබාදීමේ ක්‍රියාවලිය ඇයගේ එක් සංකල්පයකි. ඒ සඳහා යොදා ගත් දිනයක එම අනාථ නිවාසයේ දරුවන් සමග හෝ වැඩිහිටියන් සමග දවසේ වරුවක පමණ කාලයක් ප්‍රීතියෙන්, විනෝදයෙන් ගත කිරීම පලදායි ක්‍රියාවක් විය. ඒ සඳහා අවශ්‍යවු මුදල් සපයා ගන්නේ ප්‍රදීප පත්‍ර විකිණීමෙන් ලැබෙන කොමිස් මුදලිනි. සෑම වසරකම චතාරික සමයේ වන්දනා ස්ථානයකට සියලු සාමාජිකාවන් සමග යෑමටද එතුමිය අමතක නොකළාය.

පසන් ගායනා කිරීමට මහත් දක්ෂතාවයක් ඇති එතුමිය, චතාරික සමයේදී අසල්වැසි සොහොයුරියන් සමග ඉතා මිහිරි ලෙස පසන් ගායනා කළ අයුරු අපට මතකය. තමන් අසනීපයෙන් පසු වූවත් රෝගියකු වෙනුවෙන් යැදුමකට, ශුද්ධ වූ පැයකට, සහභාගිවීමට ඇය තුළ තිබුනේ දයාබර හැඟීමකි, ආශාවකි. සෑම විටම ඇයගේ නෙත් සිත් යොමුවී තිබුනේ යාච්ඤාවටත් තමන් බැඳී සිටින දිව්‍ය හෘද සමිතියටත්ය. එපමණක් නොව තම අවසන් හුස්ම පොද හෙළුවේද, දිව්‍ය හෘද මංගල්‍ය යෙදී තිබුණ දිනයේ වීම දේව ආදරයේ මහිමය පිළිබිඹු කරන්නකි.

එතුමියගේ අවසාන කටයුතු විශාල ජනකායක් මැද ද දියලගොඩ සාන්ත සෙබස්තියන් මුනිඳුන්ගේ දෙව්මැඳුරට අයත් සුසාන භූමියේදී සිදුවිය.



එතුමියගේ ආත්මයට නිත්‍ය සැතපීම ලැබේවා'යි පතමු

**ඩී. ඇන්සලම් ප්‍රනාන්දු**

## පවුල තේමාකොට ගත් .. 1 පිටුවෙන්

මේ 191 දෙනා අතර අප්‍රිකාවෙන් 42, ඇමරිකාවෙන් 38, ආසියාවෙන් 29, යුරෝපයෙන් 78 හා ඕෂනියාවෙන් හා දකුණු පැසිෆික් කලාපයෙන් 4 වෙති. මින් 61 දෙනෙකු ලතින් කාදිනල් හිමිපාණන් වන අතර එක් නමක් පෙරදිග සභා කාදිනල් හිමි නමකි. පෙරදිග සභා පේත්‍රියාක් තුමන් 7, අගරදගුරු හිමිපාණන් 67, රදගුරු හිමිපාණන් 47, එක් සහයක රදගුරු නමක් හා පියතුමන් සත් නමක් වෙති.

මේ අතර සංසද කාර්ය මණ්ඩලය සඳහා 16 ක් පත්කළ විශේෂඥයන්, විවාහක යුවළක් ද සමඟ නිරීක්ෂකයන් 38 හා විවාහක යුවළ 12 ක් ද වෙති. මේ අතර පිළිගත් කිතුනු සභා වලින් නියෝජිතයන් 28 දෙනෙකු මෙවර රදගුරු සංසද රැස්වීමට සහභාගි කරවීමට එවා ඇත.

## ජාතික දෙව්සත්හලේ.. 1 පිටුවෙන්

ලබන ඔක්තෝබර් 19 වැනිදා ජාතික දෙව්සත්හල් දෙව්මැඳුරේදී ගාල්ල රදගුරු අති උතුම් රේමන් වික්‍රමසිංහ හිමිපාණන් අතින් සහෝදරතුමන් 38 නමක් තේවාචාර්යවරය ලබනු ඇත. මේ අතර නව අධ්‍යයන වර්ෂය සඳහා නව පදවි සහෝදර තුමන් 48 නමක් ද, පැවිදි නිකායික සහෝදරතුමන් 28 නමක් ද ජාතික දෙව්සත්හලට එක් වෙති.

මේ අතර ජාතික දෙව්සත්හලේ දියමන්ති ජයන්ති වසර ආරම්භ වන්නේ සිසුන් 271 දෙනකු සමඟිනි. ඉන් පදවි සහෝදරතුමන් 174 ක් ද, නිකායික සහෝදරතුමන් 97 දෙනෙක් ද සිටිති. මින් සිසුන් 137 දෙනකු දේව ධර්ම පීඨයේ ද සිසුන් 134 දෙනකු දර්ශනවාදය පීඨයේ ද ඉගෙනුම ලබන අතර මෙරට රදගුරු වසම් 12 හා පැවිදි නිකායන් 14 ක් නියෝජනය කරන්නට ජාතික දෙව්සත්හල සමත්ව සිටී.

## ආගමික නිදහස.. 1 පිටුවෙන්

ඉන්පසුව බැතිමතුන්ගෙන් ප්‍රතිමාව පැහැරගෙන ගොස් ඇත. මින් අනතුරුවයි බැතිමතුන් මහ පාරේ වාඩි වී යාච්ඤා කිරීමට පටන් ගන්නේ, නැවත ප්‍රතිමාව ලබා දෙන ලෙස ආයාචනා කරමින්. මෙම විරෝධතාවයට මුස්ලිම් මෙන්ම බෞද්ධ ජනතාවගේ ද සහයෝගය ලැබිණ.

කටුකුරුන්ද සා. පිලිප්නේරි දේවස්ථානයට යන පාර නම් කර ඇත්තේ සා. පිලිප්නේරි මාවත නමිනි. එ නිසාද මෙම පිලිප්නේරි මාවතට ඇතුළුවන පිවිසුම ළඟ ප්‍රතිමාව තැන්පත් කිරීමේ කිසිදු වරදක් මධ්‍යස්ථ ජනතාවට නොපෙනේ. තවද මෙම මාවත දේවස්ථානයෙහි නම වේ. එතකුදු නොවේ කළුතර මහ නගර සභාව ද මෙම ප්‍රතිමාව ස්ථාපනය කිරීම අනුමත කර තිබේ.

හන්දියක් හන්දියක් ගානේ බුදු පිළිම ස්ථාපනය කරන මෙම යුගයේ කතෝලිකයන්ට තමන්ගේ දේවස්ථානයට යන පිවිසුම ළඟ, පිලිප්නේරි මුනිඳුන්ගේ ප්‍රතිමාව තැබීමට අවසර නැත්තේ ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් ආගමික නිදහස සම්බන්ධ වගන්ති උල්ලංඝනය කිරීමෙන් බවද සුපැහැදිලිය. මෙය විශ්ව මානව අයිතිවාසිකම් ප්‍රකාශනයේ අංක 2,18 දරණ වගන්ති වලට ද ඉඳුරාම පටහැනිය.

උතුරේ යුද්ධයෙන් පසු කාලයේ බුද්ධ ප්‍රතිමා ස්ථාපනය කිරීම සම්බන්ධව එම පළාතේ ද්‍රවිඩ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු මේ නොබෝදා කළ ප්‍රකාශය මගේ සිහියට නැගේ. ඔහු කියා තිබුණේ "බොහෝ බුදු පිළිම සහ බෞද්ධ පන්සල් 10 ක් 15 ක් පමණ 2009 යුද්ධය අවසන් කිරීමෙන් පසුව උතුරේ ගොඩ නගා ඇත. මෙකී බොහෝ බුදු පිළිම ස්ථාපනය කර ඇත්තේ එක්කෝ බෞද්ධයන් සුළු පිරිසක් නැතහොත් කිසිම බෞද්ධයකු වාසය නොකරන ප්‍රදේශ වලය. මෙම පන්සල් ගොඩ නගා ඇත්තේ ද හින්දු කෝවිල් සහ ක්‍රිස්තියානි දේවස්ථානවලට යාබදවය."

## පහ වසර .. 1 පිටුවෙන්

මෙවර ශිෂ්‍යත්ව විභාගයෙන් ලකුණු 195 ක් ලබා ගත් ඇය විභාග දෙපාර්තමේන්තුවෙහි ප්‍රතිඵල ලේඛනයට අනුව සමස්ත ලංකාවේම 5 වන ස්ථානය ද ගම්පහ දිස්ත්‍රික්කයේ 3 වන ස්ථානය ද හිමිකර ගත්තාය.

ගම්පහ සිරිකුරුස විදුහලේ ඉතිහාසයෙහි විශිෂ්ටතම ශිෂ්‍යත්ව විභාග ප්‍රතිඵලය මෙය වන අතර කතෝලික පාසල් අතර මෑත ඉතිහාසයෙහි විශිෂ්ටතම ප්‍රතිඵලය ද එය වේ. විදුහල්පතිනි ගරු දීපානි පෙරේරා පැවිදි සොයුරිය විසින් විදුහලේ දී ඇයව ඉතා හරසරින් පිළිගත්තාය.

බොල්ලත මීසමෙහි කතෝලික වෛද්‍ය දෙමාපියන් වන චමින්ද මෙන්දිස් සහ නිලූපා අයන්ති යුවළගේ දියණිය වන ඇය බොල්ලත සිරිහද දහම් පාසලෙහි ඉගෙනුම ලබන්නීය.

# ගරු රෝයි ක්ලැරන්ස් නායගම් පියතුමන්ට හද බැඳි භක්ති ප්‍රණාමය!

**ප්‍රංශ පුරවරයට ස්ථිර ශ්‍රී ලාංකික පියතුමකු ලබා ගැනීමට පෙර කලදී වෙහෙස මහන්සි වූ පියතුමන්ලා සමඟින් සම්බන්ධ වී අවසන් අදියරය අවසන් කළ ඔබවහන්සේ අද අපට ගරු නිමන්ත පීරිස් පියතුමන්ව ප්‍රංශයේ ශ්‍රී ලාංකික කතෝලික උපාධ්‍ය පියතුමා වශයෙන් භාර දී අපගෙන් වෙන්වී ශ්‍රී ලංකාවේ දේව සේවය සඳහා පිටත් වුවත් ඔබවහන්සේ අපට අමතක නොවන මතක සටහන් තබා යන්නේ අපගේ හදවත් හඬවමිනි.**



නිරතුරුවම දේව මෙහෙයන් අවස්ථා තුළදී යම් අඩුපාඩුවක් වරදක් වූවානම් සමාව අයදින ඔබතුමන් සමාව අයදීම, සමාව දීම ජීවිතය තුළින් අපට පෙන්වා දුන්, අප ජීවිත තුළට සත්‍යයේ අත්දැකීම් දුන් කෙනෙක් බව පවසන්නේ භක්තියකිනි.

ඔබතුමා අපගෙන් සමුගන්නා දිනයේ අප සොහොයුරන් දොළොස් දෙනෙක් තෝරාගෙන කළ පාද දෝවනය තුළින් අප සැමගෙන් කළ සමාව අයදීම ප්‍රංශයේ ශ්‍රී ලාංකික කතෝලික ජනතාවගේ හදවත් හැඬ වූ බව පවසාලිය යුතුමයි.

තවද අපගෙන් වෙන්වන දිනයේදී උපහාර කිරීමද අවශ්‍ය නැති බව පැවසූ ඔබතුමා අපට පැවසුවේ "ක්‍රිස්තුන් වහන්සේ වෙනුවෙන් කළ සේවයට බාහිර උපහාර අනවශ්‍ය බවයි." එසේම ඔබතුමා පැවසූ ඉතාම වැදගත්ම කරුණ නම් ඔබ සමඟ වැඩ කළ අපගේ සේවයත් ජේසුස් වහන්සේ අගය කර උන්වහන්සේ අපටද උපහාර දක්වන බවයි.

ආදර පියතුමෙනි, වසර දෙකක් ඔබ අප සමඟ ප්‍රංශයේ ශ්‍රී ලාංකික ජනතාව සමඟ ජීවත් වී හැම සේවා දායකත්වයක් තුළදීම ආරම්භයේ පටන් අවසානය දක්වා අප සමඟ එකට වැඩ කරමින්, දුකේදී අප සනසමින්, සතුටේදී සිනාසෙමින් අප සැම සමිඳු ආදරයෙන් පිරුණ සංඝයක් කරා ගෙන යන්නට ඔබතුමන් දැරූ ප්‍රයත්නයන්ගේ සාර්ථකත්වය අත් දැකපු අපට, ජීවමාන දෙවියන් වහන්සේගේ සත්‍යතාවයේ ගොඩනැඟීමක් තුළින් පිරුණ සංඝයේ සැමදෙන ගේ හද බැඳී භක්ති ප්‍රණාමය ගරු රෝයි ක්ලැරන්ස් නායගම් පියතුමනි මෙලෙසින් ඔබට පුද කරමි.

"මා බලවත් කරනා සමිඳාණන් තුළ සියල්ල කළ හැකි වේ" ඔබ තුමා නිතරම අප සමඟින් ගැයූ ඉහත ගීතිකා පදයෙන් අපි මෙම වදන් අවසන් කරන්නෙමු.

**(ප්‍රංශයේ ශාන්ති සෝවිස් සහ ප්‍රසාදිනි සෝවිස්)**

## අගරදගුරු පදවි දහම් පාසල් වසර අවසාන පරීක්ෂණය

අගරදගුරු පදවි ධර්මෝපදේශ අපෝස්තලික සේවාව මෙහෙය වන දහම් පාසල් වර්ෂ අවසාන පරීක්ෂණය 2014 නොවැම්බර් මස 01 සෙනසුරාදා පෙ.ව. 8.30 සිට දහම් පාසල් මධ්‍යස්ථානවලදී පැවැත්වේ.

මෙවර 8,9,10,11 ශ්‍රේණි සඳහා අති උතුම් තෝමස් කාදිනල් කුරේ හිමිපාණන්ගේ ජීවිත තොරතුරු ආශ්‍රයෙන් අනිවාර්ය ප්‍රශ්නයක් අන්තර්ගත වේ. අනෙකුත් ශ්‍රේණිවල සිසුන්ද මේ සම්බන්ධයෙන් දැනුවත්ව සිටීම අවශ්‍ය බැව් අගරදගුරු පදවි ධර්මෝපදේශ අධ්‍යක්ෂ ගරු දිනේෂ් ප්‍රියශාන්ත ප්‍රනාන්දු පියතුමා දන්වා සිටී.

## කතෝලික සාහිත උලෙළ ඔක්. 19 දා

ජාතික කතෝලික ලේඛක හවුලේ වාර්ෂික කතෝලික සාහිත්‍ය උලෙළ ඔක්තෝබර් 19 ඉරිදා ප.ව. 2.30 ට අගරදගුරු පදවි සහයක රදගුරු අති උතුම් මැක්ස්වල් සිල්වා හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් පිටකොටුව මල්වත්ත පාරේ හයවන පාවුළු මධ්‍යස්ථානයේ දෙවන මහලේදී පැවැත්වේ.

මෙදින තේමා දෙසුම ධර්මසිරි බණ්ඩාරනායක මහතා පවත්වන අතර කිවිසුරු, ලිවිසුරු, කලාසුරු ඇතුලු සම්මාන පිදීම ද සිදුවේ. මෙදින පෙ.ව. 10.00 ට ජාතික කතෝලික ලේඛක හවුලේ විශේෂ රැස්වීම ද පැවැත්වේ. **(ජෝශප් ජයසිරි ප්‍රනාන්දු)**

## සෙනෙහෙබර කැදැල්ලකට ගැයෙන ගී

රද්දොලුගම මීසම් සේවක ගරු දෙව්ශාන් අසංක ප්‍රනාන්දු පියතුමාගේ මෙහෙයවීමෙන් රද්දොලුගම "තරුණ කැල" 4 වන වරටද ඉදිරිපත් කරන "සෙනෙහෙබර කැදැල්ලකට ගැයෙන ගී" ප්‍රසංගය මේ මස 12 ඉරිදා (අද) රාත්‍රි 7.00 සිට කැපුන්ගොඩ (පමුණුගම) සාන්ත අන්තෝනි දෙව්මැඳුරු බිමේදී පැවැත්වේ.

පවුල් ජීවිතය ගැන විමසා බැලෙන "සෙනෙහෙබර කැදැල්ලකට ගැයෙන ගී" ප්‍රසංගයේ කථනය ප්‍රවීන දේශක මහින්ද නාමල් මහතාගෙනි. කැපුන්ගොඩ මීසම් සේවක ගරු ක්ලෝඩ් මාටිනස් වනසිංහ පියතුමා ගී ප්‍රසංගය සංවිධානය කරයි. හෝරා 3 කට ආසන්නව දිවෙන මෙම ප්‍රසංගයට සවන් යොමන්නට ප්‍රදේශවාසිනට ද ඇරයුම් කෙරේ. **(රන්ජිත් ලොකුපෝතාගම)**

## කොළඹ 13 සා. බෙනදික්ත විදුහලේ 2015 - 6 වන ශ්‍රේණිය සඳහා අයදුම්පත් නිකුත් කිරීම

2015 - 6 ශ්‍රේණිය සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේ අයදුම්පත් නිකුත් කිරීම ඔක්තෝබර් මස 13 සහ 14 දෙදින ප.ව. 1.30 සිට ප.ව. 3.00 දක්වා විද්‍යාලයීය කාර්යාලයේ දී සිදුකෙරේ.

අයදුම්පත් ලබා ගැනීමේදී පහත සඳහන් ලියවිලි ඉදිරිපත් කළ යුතු බව කරුණාවෙන් සලකන්න.

- ★ පවුල් පොත
- ★ දරුවාගේ උප්පැන්න සහතිකයේ මුල් පිටපත
- ★ දරුවාගේ ක්‍රිස්තියානි සහතිකයේ මුල් පිටපත

**(ගරු අධ්‍යක්ෂ සහෝදරතුමා)**

# ගෘහ නිර්මාණ ශිල්පීනට සහ කලා ශිල්පීනට ආරාධනා!

**සුදුතුම් පිය ලංකා සම්ප්‍රාප්තිය මුල් කරගෙන කොළඹ අගරදගුරු පදවිය සියලුම කතෝලික ගෘහ නිර්මාණ ශිල්පීන් ද චිත්‍ර කලා, මූර්ති, කැටයම් හා සියළුම මාධ්‍යයන්ගෙන් සුරුවම් නිර්මාණය කරන ශිල්පීන් ඇතුළු පරිගණක චිත්‍ර ශිල්පීන් ද පිළිබඳ තොරතුරු ලේඛන ගත කරනු ඇත.**

එසේ ලියාපදිංචි වන ශිල්පීන්ට සුදුතුම් පිය ලංකා ගමන අළලා කෙරෙන කලා කටයුතුවලට දායක වීමට ඉඩ ප්‍රස්ථා ලැබෙන අතර ඉදිරියේදී අගරදගුරු පදවි එඬේරාණන් වන අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ මඟපෙන්වීම යටතේ ක්‍රියාත්මක වීමට නියමිත, දෙව්මැඳුරු, බිතු සිතුවම්, මූර්ති හා මොසැයික් වැනි නිර්මාණ වලින් සරසමින් දෙව් දහම උගැන්වීමේ වැඩ පිළිවෙලට සහභාගි වීමට අවකාශ සැකසෙනු ඇත.

කතෝලික ගෘහ නිර්මාණ ශිල්පීන් සඳහා ද අනිකුත් කලා ශිල්පීන් සඳහා ද අගරදගුරු පදවියේ කලා සංසදයන් බිහි කිරීමට නියමිත වන අතර ඔවුන් සඳහා විශේෂ පාඨමාලා ද පැවැත්වෙනු ඇත.

මේ අරබයා මූලාරම්භක රැස්වීම කාදිනල් හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන මොහොතට සියළුම ලියාපදිංචි ශිල්පීනට ආරාධනා කැරෙනු ඇත.

ඔබගේ සියලු විස්තර ද, ඔබ කළ කලා නිර්මාණ ලැයිස්තුව ද එයට අදාළ කලා කෘතීන් හි ඡායාරූප ද සමඟ 2014 ඔක්තෝබර් 25 දින හෝ ඊට පෙර ඔබගේ අයදුම්පත ලියාපදිංචි තැපෑලෙන් පහත ලිපිනයට යොමු කරන්න. මින් පෙර ලියාපදිංචි වූ ශිල්පීන්ගේ තොරතුරු අප සමඟ ලේඛනගතව ඇත.

ගරු ප්‍රියන්ත සිල්වා පියතුමා, ක්‍රිස්තියානි කලාව හා ගෘහ නිර්මාණය පිළිබඳ අගරදගුරු පදවි උපදේශක, නො. 990, ඇක්වයිනස් විශ්ව විද්‍යාල ආයතනය, කොළඹ 08. වැඩි විස්තර සඳහා - සුලලිත 0773187827 / 0714917971

### සුදුතුම් පිය ලංකා ගමන සහ භාග්‍යවන්ත ජුසේවාස් පියතුමන් ශුද්ධවරයට එසැවීම පිළිබඳ

## දීප ව්‍යාප්ත කෙටි වාර්තාමය චිත්‍රපට තරගය

සුදුතුම් පිය ලංකා ගමන හා භාග්‍යවන්ත ජුසේවාස් පියතුමන් ශුද්ධවරයට එසැවීම වෙනුවෙන් "ප්‍රේමයේ පවතින්න" තේමාව පාදක කර ගනිමින් දීප ව්‍යාප්ත කෙටි වාර්තාමය චිත්‍රපට තරගයක් සිග්නිස් ශ්‍රී ලංකා ආයතනය මඟින් පැවැත්වේ.

ශ්‍රව්‍යදෘෂ්‍ය මාධ්‍යයෙන් විනාඩි 3 ක ධාවන කාලයකට යටත්ව ඩී. වී. ඩී. තැටි මඟින් ඔබගේ නිර්මාණ ඉදිරිපත් කළ යුතුය. ඒ සඳහා අයදුම්පත් 2014 ඔක්තෝබර් 30 දිනට පෙර පහත ලිපිනයට තැපැල් මඟින් යොමු කිරීම හෝ පැමිණ බාර දිය හැකිය.

**තරග කොන්දේසි :-**

- ★ එක් අයෙකුට ඉදිරිපත් කළ හැක්කේ එක් නිර්මාණයකි.
- ★ සිංහල, දෙමළ, ඉංග්‍රීසි මාධ්‍යයෙන් නිර්මාණ ඉදිරිපත් කළ හැකිය.
- ★ නිර්මාණයේ අයිතිය, ශ්‍රී ලංකා කතෝලික සභාව සතුවේ.

මෙලෙස යොමු කෙරෙන නිර්මාණ විශේෂිත විද්වත් මණ්ඩලයක් මඟින් ඇගැයීමට ලක්කර ප්‍රථම, දෙවන හා තෙවන ස්ථාන සඳහා පිළිවෙලින් රු. 100,000/-, රු. 50,000 /-, රු. 25,000 ක් පිරිනැමෙන අතර කුසලතා නිර්මාණ 5 ක් සඳහා රු. 5000 /- බැගින් මුදල් ත්‍යාග පිරිනැමේ. ඊට අමතරව තෝරාගත් නිර්මාණ 7 ක් සඳහා සහතික පත් පිරිනැමේ.

ජයග්‍රාහී නිර්මාණ රූපවාහිනී නාලිකා ඔස්සේ විකාශය කැරෙන අතර මේ නිමිත්තෙන් පැවැත්වෙන කෙටි චිත්‍රපට උලෙළේ දී එම නිර්මාණ ප්‍රදර්ශනය කැරේ.

**ලිපිනය :-** **සුදුතුම් පිය ලංකා ගමන මාධ්‍ය කාර්යංශය 45, කිංසි පාර, කොළඹ 08.**

ඊමේල් :- lankacathcom@gmail.com
වෙබ් අඩවිය :- www.popefrancissrilanka.com

# "උඳුවප් මිහිර"ට නිර්මාණ එවන්න

**කළුතර, කලමුල්ල ග්‍රාමයෙන් 1976 වසරේ ගරු අර්නස්ට් පෝරුතොට පියතුමාගේ අනුශාසකත්වය යටතේ මැක්සිමස් රෝයි පෙරේරා හා ශිරාන් මෛත්‍රි සංස්කරණය කරන ලද "උඳුවප් මිහිර" නත්තල් වාර්ෂිකය 38 වන වරට ද නිකුත් කිරීමට කටයුතු යොදා ඇත. ඒ සඳහා ඔබ එවනු ලබන නිර්මාණ 2014 ඔක්. 30 දාට ප්‍රථම එවන ලෙස ආරාධනා කර සිටී.**

කිසිම ඇගයීමකට ලක් නොවූ ලේඛක ලේඛිකාවන්ට ප්‍රමුඛත්වය දෙන ප්‍රතිභා ප්‍රණාම උළෙල සමග "උඳුවප් මිහිර" සඟරාව එළිදැක්වීමත් සමඟ, මෙවර ද දුප්පත් ගම්මානයක දූ දරු වැඩිහිටියන්ට පොත් පත්, ඇඳුම් පැළඳුම් හා වියළි ආහාර ලබාදීමේ වැඩසටහන ද ඇතුළත් ය.

මෙම කාර්යයන් සඳහා දායක වීමට කැමැති අය වෙතොත් දන්වා විස්තර ලබා ගන්නා ලෙස ඉල්ලා සිටින අතර ඔබගේ ලිපි පහත ලිපිනයට ලියා එවන්න. සංස්කාරක, "උඳුවප් මිහිර", 32 බී, රණසිංහ පළමු පටුමග, ජා - ඇල. දුරකථන අංක 0718 274665, 011 2234779 **(රොෂාන් මුහන්දිරම්)**

## "පියුම" 60 වෙනි නත්තල් වාර්ෂිකය

**සමිඳුන් තුළ සැතපුනු එම්. ඇන්ටනි ප්‍රදිනන්දිස් මහත්මාණන් විසින් කුඩා පයාගල ග්‍රාමයෙන් කළඑළි දැක් වූ "පියුම" ඉපැරණි නත්තල් වාර්ෂිකය මෙවරත් මුද්‍රණය කොට නොමිලේ බෙදා හැරීමට විධි විධාන යෙදේ.**

ඒ සඳහා නත්තල සම්බන්ධ ලිපි, කෙටි කතා, කවි, භාර ගන්නා අතර ඔබගේ නිර්මාණ ඔක්තෝබර් 31 දිනට පෙර ඔබගේ නම, ලිපිනය සහ දුරකථන අංකය පැහැදිලිව සඳහන් කර,

සුනිල් පෝල්, සම සංස්කාරක, සා. මරියා පල්ලිය අසළ, කුඩා පයාගල, පයාගල ලිපිනයට අප වෙත යොමු කරන ලෙස ප්‍රවීන හා ආධුනික ලේඛක ලේඛිකාවන්ගෙන් ඉල්ලා සිටිමු.

**ප්‍රදීපය දැන්වීම් එවීම සඳහා පමණක්**
**pradeepayaadds@yahoo.com භාවිත කරන්න.**



# ප්‍රදීපය

## මංගල යෝජනා

### මනාලියෝ

අගනුවර, රෝ.ක., විදේශ උපාධිධාරී, ජාත්‍යන්තර ආයතනයක සේවයේ නියුතු, ප්‍රසන්න, චාම්, අවු. 31, උස 5' 2", දෙවැනි දියණිය ආගමට ලැදි, උගත්, යහපත් පුතකු සඳහා රජයේ විශ්‍රාමික දෙමවිපියන් ආරාධනා. දු.අ. 011-2231995. සවස 6.00 පසු **e-mail: jaydesilva33@yahoo.com** අංක N3712, කතෝලික මුද්‍රණාලය බාරේ, කොළඹ 08.

## මංගල යෝජනාත් වෙබ් අඩවියේ...

**"ඥානාර්ථ ප්‍රදීපය" හා "Messenger" පුවත්පත් වල පළවන මංගල යෝජනා ඔබගේ කැමැත්ත පරිදි www.colombocatholicpress.com වෙබ් අඩවියේ ද පල කළ හැකිය.**

**වැඩි විස්තර සඳහා දැන්වීම් අංශය විමසන්න.**

## ඔබගේ දුවට හෝ පුතාට සුදුසු

## කතෝලික සහකරුවකු හෝ සහකාරියක සඳහා

**මංගල යෝජනා දැන්වීමක් පළ කර ගැනීමට අවශ්‍ය නම් පහත උපදෙස් පිළිපදින්න.**

**ඔබගේ පුතුගේ හෝ දියණියගේ විස්තර මුද්‍රිත අකුරින් හෝ පැහැදිලි අත් අකුරින් ලියා හැකි ඉක්මනින් අප වෙත යොමු කරන්න.**

- ♥ මංගල යෝජනා දැන්වීම් සඳහා පළමු වචන 15 ට රු. 500/-ක මුදලක් වන අතර ඉන් පසුව වැඩිවන වචනයකට රු. 8.00 ක මුදලක් එකතු වේ.
- ♥ තැපැල් මගින් මංගල යෝජනා දැන්වීම එවන්නේ නම් දැන්වීම සමග ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක් එවන්න.
- ♥ ඔබගේ දුරකථන අංකය පළකළ යුතු නම් ඒ සඳහා කැමැත්ත ප්‍රකාශ කර අත්සන් කරන්න.
- ♥ දැන්වීම ෆැක්ස් මගින් අප වෙත එවන්නේ නම් දැන්වීම සඳහා වැය වන මුදල මරදාන **HNB** ශාඛාවේ ගිණුම් අංක 108010005037 ට ඔබගේ මුදල් බැර කරන්න. ඉන්පසු මුදල් බැර පත හා දැන්වීම අප ආයතනයට ෆැක්ස් කරන්න.
- ♥ දැන්වීම ෆැක්ස් කළ පසු එය අප ආයතනයට ලැබී ඇත්දැයි පරීක්ෂා කර දැන ගන්න.
- ♥ මංගල යෝජනා සඳහා පිළිතුරු එවීමේදී මංගල යෝජනා අංකය පැහැදිලිව සඳහන් කර කුඩා කවරයක (3 1/2' 6") එවන්න.

**ගරු අධ්‍යක්ෂ පියතුමා,**
**කොළඹ කතෝලික මුද්‍රණාලය, අංක 2,**
**ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08.**
**දු.ක. 2695984 / 2678106 / 011-4899611 ෆැක්ස් : 2692586**